# වාර්ෂික වාර්තාව 2016

# කා.සං.ම.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

# අපගේ දැක්ම

*"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලු ම කර්මාන්ත සංවර්ධනය කිරීම"*

# අපගේ මෙහෙවර

*"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලු ම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම*
*සහ*
*සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය*
*ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම"*

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ  අධ්‍යක්ෂ මණ්ඩලය

## 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

| | | |
|---|---|---|
| මහින්ද ජිනසේන මහතා | - | සභාපති |
| ටී.ඩී.එස්.පී. පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| දර්ශන් විජේසිරිවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (භාණ්ඩාගාර නියෝජිත) |
| කලීල් රහුමතුල්ලා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| මාලිකා සමරවීර මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| නිෂාධ ගමගේ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ෂමීන් පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| රෝයි ජයසිංහ මහතා | - | මණ්ඩලයේ නිරීක්ෂක |

## 2016 මැයි 10 වැනි දින සිට

| | | |
|---|---|---|
| බී.ඩබ්.පී. මෙන්ඩිස් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

# සභාපතිතුමාගේ පණිවුඩය



ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා මාගේ පණිවුඩය ලබා දීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

දශක හතරකට අධික කාලයක් පුරා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන සහාය සපයා දී ඇත. ව්‍යවසායකත්ව සංවර්ධනය, හැකියා සංවර්ධනය, තාක්ෂණය වැඩිදියුණු කිරීම ද ඇතුළුව තාක්ෂණික දැනුම සපයාදීම, අලෙවිකරණ සහාය, සහ අබලි ද්‍රව්‍ය සපයා දීම ආදිය කාර්මික සංවර්ධන මණ්ඩලය සිය සේවා සපයා දී ඇති ප්‍රධාන ක්ෂේත්‍ර අතර වේ. අපි අද මෙරට ආර්ථිකයෙහි පරිවර්තන අවධියකට පැමිණ සිටින්නෙමු. රජය රට සංවර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

2016 වර්ෂයේ දී කාර්මික සංවර්ධන මණ්ඩලය කාර්මික ජනපද නවීකරණය කිරීම, රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ "ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන " යටතේ ගම්මාන සංවර්ධනය කිරීම ආදිය ඇතුළත් විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් රට පුරා ක්‍රියාත්මක කරමින් ජාතික ප්‍රමුඛතාවයන්ට අනුව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළේය. මෙම වැඩසටහන් වල එකම අරමුණ මෙරට පවතින සාම්ප්‍රදායික ගම්මාන නගා සිටුවීම වේ. පාවහන් ක්ෂේත්‍රයේ නිෂ්පාදකයින්ට ප්‍රතිලාභ අත්කර දීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී පාවහන් සහ සම් භාණ්ඩ වෙළෙඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදී. එයට අමතරව, කාර්මික සංවර්ධන මණ්ඩලය නෙදර්ලන්ත විශේෂඥයකු වන තොම් රිවන් මහතාගේ සහභාගිත්වයෙන් කිරි නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඉතා සාර්ථක වැඩමුළුවක් ද පවත්වන ලදී.

එමෙන්ම මෙම වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය එම මණ්ඩල පරිශ්‍රයේදී රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානයක් ද (CERA) ස්ථාපිත කරන ලද බව මම ඉමහත් සතුටින් සඳහන් කරමි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා රොබෝ තාක්ෂණය හඳුන්වාදීම මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණ වේ. 2019 වර්ෂයේ මුල් භාගයේදී මෙම මධ්‍යස්ථානය විවෘත කිරීම සඳහා මේ වන විට කටයුතු සූදානම් කෙරෙමින් පවතී.

2016 වර්ෂයේ දී කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කළ ඉතා ඵලදායක වූ වැඩසටහන් පිළිබඳව ද ඇතුළුව සාර්ථක සංවර්ධන ක්‍රියාමාර්ග කිහිපයක් පිළිබඳ වැදගත් තොරතුරු මෙම වාර්තාවෙහි අන්තර්ගත කර ඇත.

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද මෙම ප්‍රධාන වැඩසටහන් සම්පාදනය කිරීම සඳහා ලබා දෙන ලද සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාද් බදියුදීන් මහතාට සහ රාජ්‍ය අමාත්‍ය ගරු චම්පික ප්‍රේමදාස මහතාටත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මාගේ ස්තුතිය පුද කරමි.

එමෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, අංශ ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් විසින් ලබා දෙන ලද සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

**මහින්ද ජිනසේන**
**සභාපති**

# අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවුඩය



2016 වර්ෂය අමාත්‍යාංශ සහ ජාතික මට්ටමේ සංවර්ධන ක්‍රියාමාර්ග සමග සමගාමී වූ විශේෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති ගණනාවක් සඳහා වන සැලසුම් වලින් සමන්විත වර්ෂයක් විය. වාර්ෂික මූල්‍ය වාර්තාව සඳහා වැදගත් අදහස් කිහිපයක් එක් කරමින් මණ්ඩලයේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම අවස්ථාව ලැබීම පිළිබඳ මම ඉතාමත් සතුටු වන අතර, ඉදිරි වර්ෂයේදී වඩාත් සාර්ථක වූ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමට එය නිසැකව ම උපකාරී වනු ඇතැයි මම විශ්වාස කරමි.

2016 වර්ෂය ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් මාලාවක් සමග ආරම්භ විය. කාර්මික සංවර්ධන මණ්ඩලය සෑම දිස්ත්‍රික්කයක් තුළ ම පිහිටි දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් මණ්ඩලයේ අදාළ සියලුම අංශවල දායකත්වය ඇතිව විශේෂ සේවා පැකේජයක් පිරිනමමින් එම කර්මාන්ත ලියාපදිංචි කර ගන්නා ලදී. එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රාදේශීය මට්ටමේ කර්මාන්තකරුවන්ට වඩා උසස් සේවාවක් සැපයීම පිණිස දිස්ත්‍රික් මට්ටමේ මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ අතර, ඒ යටතේ දිස්ත්‍රික්ක තුනක දිස්ත්‍රික් කාර්යාලවල තත්ත්වය ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද විශේෂය ඇගයීමක් ලැබීමට තරම් ඉහළ මට්ටමකට වැඩි දියුණු කරන ලදී.

සලකා බලනු ලබන වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය කාර්මික ජනපදවල යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් විශාල වශයෙන් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. එම කාල පරිච්ඡේදය තුළදී අමාත්‍යාංශ අරමුදල් වැය කරමින් අභ්‍යන්තර මාර්ග, බෝක්කු, මායිම් තාප්ප සහ අනෙකුත් ගොඩනැගිලි පහසුකම් විශාල වශයෙන් වැඩි දියුණු කරන ලදී. ඒ අනුව කාර්මික ජනපදවල යටිතල පහසුකම් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි නගා සිටුවමින් ගෝලීය තරගකාරීත්වයට මුහුණ දීම සඳහා කාර්මික ජනපද තුළ පිහිටුවා ඇති කර්මාන්තවලට තිබෙන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී.

තවද, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය අන්තර්ජාතික සම්පත් දායකයින්ගේ ද දායකත්වය සහිත වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, තාක්ෂණය ලබාදීමේ දීර්ඝ කාලීන සහතික පත්‍ර පාඨමාලා හඳුන්වා දෙමින් එම අංශය විසින් පිරිනමනු ලබන සේවා පැකේජ තව දුරටත් පුළුල් කර ඇත. මෙය කර්මාන්තකරුවන්ට අදාළ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පරිපූර්ණ දැනුවත් භාවයක් සපයා දෙනවා පමණක් නොව, ඔවුන්ගේ ක්‍රියාවලීන් තුළ ඇති ගැටළු හඳුනා ගනිමින් ඔවුන්ට ගැළපෙන විසඳුම් සපයා ගැනීමට ද උපකාරී වේ.

රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය නවීන යන්ත්‍රයක් භාවිතා කරමින් එම ක්ෂේත්‍රය සඳහා රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් ක්‍රියාවලිය හරහා රබර් නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වා දීමට පියවර ගෙන ඇත. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නිෂ්පාදන පරීක්ෂා කිරීමේ පහසුකම් සහ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සකස් කළ ස්වභාවික සහ කෘත්‍රිම රබර් මිශ්‍රණ සැකසීමේ පහසුකම් සපයා දෙමින් එම අංශයට අඛණ්ඩ සහයෝගය ලබා දීමට අමතරව ඉහළ මට්ටමේ මිනුම් නිරවද්‍යතාවයක් සහිතව නිෂ්පාදන ගුණාත්මක භාවයට අදාළ තරගකාරී නිෂ්පාදන ක්‍රම අනුගත කර ගැනීම සඳහා දේශීය කර්මාන්තකරුවන්ට මෙය උපකාරී වනු ඇත

කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට සහ එහි කාර්ය මණ්ඩලයට අවශ්‍ය මගපෙන්වීම, දිරිගැන්වීම සහ සහයෝගය ලබා දීම වෙනුවෙන් ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයටත් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. එමෙන්ම කාර්ය මණ්ඩලයේ ඉමහත් සහයෝගය ඇතිව උපායමාර්ගික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් කාර්මික සංවර්ධන මණ්ඩලයට අත්කර ගැනීමට හැකි වූ ඉහළ මට්ටමේ සාර්ථකත්වය උදෙසා මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ද, කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය ද  දැක්වූ කැපවීම සහ සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරමි.

**පී.එල්.යූ. රත්නමලල**
**අධ්‍යක්ෂ ජෙනරාල්**

# පටුන


**1.0 ආයතනය** 01-04

1.1 පසුබිම
1.2 මණ්ඩලයේ අරමුණු
1.3 මණ්ඩලයේ අංශ සහ සපයා දෙනු ලබන සේවා
1.4 ප්‍රධාන සේවා සහ පහසුකම්
1.5 ආයතනික ව්‍යුහය

**2.0 කාර්යසාධන සමාලෝචනය** 05-11

2.1 මණ්ඩලයේ විවිධ අංශ විසින් සපයා දෙන ලද සේවාවන්
2.2 තාක්ෂණය ලබා දීම, නිෂ්පාදන සංවර්ධනය සහ තාක්ෂණ නිරූපණ වැඩසටහන්
2.3 එක් එක් අංශය විසින් 2016 ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

**3.0 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විශේෂ ක්‍රියාකාරකම්** 12-15

3.1 ආහාර සැකසුම් කර්මාන්ත සංවර්ධනය - බස්නාහිර පළාත
3.2 කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව
3.3 තාක්ෂණය ලබා දීමේ වැඩමුළු
3.4 ප්‍රදර්ශණ
- පාවහන් සහ සම් භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය - 2016

3.5 අපනයන ප්‍රවර්ධන සමුළුව
3.6 වෙළඳ පොළ ජය ගැනීම සඳහා ඉදිරි මග - සු.ම.ක. සඳහා අලෙවිකරණ වැඩසටහන්

**4.0 කාර්යසාධන ජයග්‍රහණ** 16

- පාලන අංශය (AD) 17-18
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) 19-22
- සැලසුම් අංශය (PD) 23-24
- අලෙවි අංශය (MD) 25-26
- කාර්මික ජනපද අංශය (IED) 27-31
- රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD&SC) 32-34
- ඉංජිනේරු අංශය (ED) 35-36
- ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) 37-38
- තාක්ෂණ සේවා අංශය (TSD) 39-41
- සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF) 42-44

**5.0 මූල්‍ය ප්‍රකාශන** 45

- විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 46
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 47
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 48
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 49
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු 50-70

**6.0 මණ්ඩලයෙහි පැහැදිලි කිරීම් සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව** 71-83

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
# 2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

**ආයතනය**

## 1.1 පසුබිම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින් ම 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1966 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

## 1.2 මණ්ඩලයේ අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනතෙහි නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම, සහ උත්පාදන වන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන සහ ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනකට හෝ ඒවාට අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

### 1.3 මණ්ඩලයේ අංශ සහ සේවා

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට සේවා පැකේජ සපයා දීම සඳහා මෙම මණ්ඩලය පහත සඳහන් ප්‍රධාන අංශ සහ ආයතන 10 න් සමන්විත වේ:

1. පාලන අංශය (AD)
2. ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
3. ඉංජිනේරු අංශය (ED)
4. කාර්මික ජනපද අංශය (IED)
5. අලෙවි අංශය (MD)
6. සැලසුම් අංශය (PD)
7. ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
8. තාක්ෂණ සේවා අංශය (TSD)
9. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)
10. රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD&SC)

කාර්යාල 25කින් සමන්විත දිස්ත්‍රික් කාර්යාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන අතර කාර්මික ජනපද 19 කාර්මික ජනපද අංශය යටතේ ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක වන සේවා මධ්‍යස්ථාන දෙකක් තිබේ. තාක්ෂණ සේවා අංශය, ඉංජිනේරු අංශය, සම් භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානය සහ රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය දේශීය කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය තාක්ෂණය සහ අදාළ අනෙකුත් සේවා සපයා දීම සිදු කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 700 ක් වන අතර එය කාර්ය මණ්ඩල මට්ටම් එකොළහක යටතේ කාණ්ඩ කර ඇත.

## 1.4 ප්‍රධාන සේවා සහ පහසුකම්



## 1.5 ආයතනික ව්‍යුහය



# 2.0 කාර්ය සාධන සමාලෝචනය

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිමත් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය පුළුල් පරාසයක සේවා සහ ක්‍රියාකාරකම් රාශියක් ඉටු කර ඇත. එමෙන් ම ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම, නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම, බස්නාහිර පළාතේ ආහාර ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සහ දැව ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් වලට සමගාමීව අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ආංශික සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ සේවාවන් ද සපයා දී ඇත.

## 2.1 මණ්ඩලයෙහි විවිධ අංශ විසින් සපයා දෙන ලද සේවාවන්

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි එක් එක් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වලට අමතරව අමුද්‍රව්‍ය සපයා දීම, කර්මාන්ත ආශ්‍රිත තොරතුරු සපයා දීම, රබර් මිශ්‍රණ සැකසීමේ පහසුකම් සපයා දීම සහ ඒවාට අදාළ අනෙකුත් වැඩසටහන් ද ඇතුළුව මෙම කාල පරිච්ඡේදය තුළදී එම අංශ විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් සේවාවන් පහත සඳහන් පරිදි වේ:




මෙම වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් අතර කළමනාකරණ පුහුණු වැඩසටහන් 38 ක් ද, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 18 ක් ද වූ අතර එමගින් අනාගත ව්‍යවසායකයින් 900 ක් දෙනා ප්‍රතිලාභ ලැබූහ. එමෙන්ම ව්‍යවසායකයින්ගේ ඉල්ලීම පරිදි ව්‍යාපෘති ශක්‍යතා වාර්තා 64 ක් ද, යන්ත්‍ර සූත්‍ර තක්සේරු වාර්තා 83 ක් ද සකසා දී ඇත. තවද, කර්මාන්ත ආරම්භ කිරීමට සිටින ව්‍යවසායකයින්ගේ ඉල්ලීම් පරිදි සේවා සපයාදීම් 272 ක් ද, අවශ්‍ය වැඩ ඇණවුම් 117 ක් ද සම්පූර්ණ කර ඇත. ඇත එයට අමතරව, කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවය පරිදි යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ 264 ක් නිෂ්පාදනය කර අලෙවි කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අලෙවි මධ්‍යස්ථාන හරහා නව කර්මාන්තකරුවන් 40 දෙනකු අලෙවිකරණ සහාය ලබාගෙන ඇති අතර, කර්මාන්තකරුවන් 34 දෙනෙකු ණය පහසුකම් සඳහා සහාය ලබා ගත්හ.

## 2.2 තාක්ෂණය ලබා දීම, නිෂ්පාදන සංවර්ධනය සහ තාක්ෂණ නිරූපණ වැඩසටහන්

මෙම වර්ෂය තුළ දී තාක්ෂණය ලබාදීම්, නිෂ්පාදන සංවර්ධන සහ නිරූපණ වැඩසටහන් 146 ක් පවත්වා ඇති අතර එමගින් කර්මාන්තකරුවන් 2,310 ප්‍රතිලාභ ලැබූහ. විදේශීය තාක්ෂණයන් දෙකක් ලබා ගෙන ඒවා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 8 දෙනකු වෙත ලබා දී ඇත.

**2.3 එක් එක් අංශය විසින් 2016 ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | සාධනය |
| ප්‍රාදේශීය සංවර්ධන අංශය | | | | |
| 1 | විදේශීය ගැනුම්කරුවන්/ ආනයනකරුවන්/ සැපයුම්කරුවන් හඳුනාගැනීම | විදේශීය ගැනුම්කරුවන්/ ආනයනකරුවන්/ සැපයුම්කරුවන් සංඛ්‍යාව | 20 | 3 |
| 2 | ශ්‍රී ලංකාවේ අනාගත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නිෂ්පාදන අපනයනකරුවන් සහ ඔවුන්ගේ නිෂ්පාදන හඳුනා ගැනීම | අනාගත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නිෂ්පාදන අපනයනකරුවන් සංඛ්‍යාව | 50 | 72 |
| 3 | අනාගත අපනයනකරුවන් සඳහා පළාත් ජාතික මට්ටමේ සංසද පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම | සංසද සංඛ්‍යාව | 4 | 2 |
| 4 | වෙළෙඳ ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන හරහා අන්තර්ජාතික වෙළඳ පොළට සහභාගී වීම සඳහා සහාය ලබා දීම | සහභාගී වූ සු.ම.ක. කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 35 | 9 |
| 5 | ප්‍රාදේශීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නව තාක්ෂණයන් ලබා දීම | නව තාක්ෂණයන් සංඛ්‍යාව | 25 | 24 |
| 6 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා සුදුසු ණය සහ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම | සු.ම.ක. සංඛ්‍යාව | 30 | 8 |
| 7 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | |
| | 2.1.4.1 තාක්ෂණ | | 50 | 41 |
| | 2.1.4.2 කළමණාකරණ | | 25 | 16 |
| | 2.1.4.4 වෙනත් | | 10 | 18 |
| 8 | තක්සේරු වාර්තා සකස් කිරීම | තක්සේරු වාර්තා සංඛ්‍යාව | 20 | 3 |
| 9 | ව්‍යාපෘති ශක්‍යතා වාර්තා | සු.ම.ක. සංඛ්‍යාව | 125 | 19 |
| 10 | සම්පත් කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය වීම (ඵලදායිතා ක්‍රමවේද/මෙවලම් සහ හරිත තාක්ෂණය ක්‍රියාත්මක කිරීම) | සු.ම.ක. සංඛ්‍යාව | 75 | 19 |
| 11 | පද්ධති සහතිකකරණ සහ නිෂ්පාදන ප්‍රමිතීන් ලබා ගැනීම සඳහා සහාය වීම | | | - |
| | GMP | සු.ම.ක. සංඛ්‍යාව | 25 | 7 |
| 12 | BHC (ව්‍යාපාර සෞඛ්‍ය සහතිකය) | සහතිකකරණ සංඛ්‍යාව | 25 | 1 |
| 13 | සු.ම.ක. නිෂ්පාදන සහ සේවාවල සන්නාම වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම (ලේබල් කිරීම, ඇසුරුම් කිරීම, බුද්ධිමය දේපළ ආදිය) | සු.ම.ක. සංඛ්‍යාව | 150 | 23 |

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | සාධනය |
| 14 | අබලි ද්‍රව්‍ය සපයා දීම (ඇලුමිනියම්, තඹ, පිත්තල) | ප්‍රමාණය මෙ.ටො. වලින් | 600 | 393 |
| 15 | කැස්පර් සපයා දීම | බෝතල් සංඛ්‍යාව | 4,000 | 2,884 |
| 16 | අනාගත ව්‍යවසායකයින් හඳුනා ගැනීම | අනාගත ව්‍යවසායකයින් සංඛ්‍යාව | 125 | 92 |
| 17 | මූල්‍ය සහාය ලබාගැනීම සඳහා සහාය වීම | සහාය සපයාදීම් සංඛ්‍යාව | 125 | 13 |
| ඉංජිනේරු අංශය | | | | |
| 18 | පිරියත සහ යන්ත්‍ර සූත්‍ර තක්සේරු වාර්තා සපයා දීම | වාර්තා සංඛ්‍යාව | 60 | 80 |
| 19 | කම්මල් සේවා, යන්ත්‍ර මගින් සකස් කිරීම්, පිරිසැකසුම්, රත් පිරියම් සේවා සපයා දීම | වැඩ සංඛ්‍යාව | 60 | 117 |
| 20 | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම/විකිණීම | යන්ත්‍ර සංඛ්‍යාව | 40 | 242 |
| 21 | වාත්තු සේවා සපයා දීම (ලෝහ සහ ලෝහමය නොවන) | සු.ම.ක. සංඛ්‍යාව | 60 | 68 |
| 22 | තඹ, නිකල්, ක්‍රෝමියම් සහ දෘඩ ක්‍රෝමියම් විද්‍යුත් ලෝහාලේපන සේවා සපයා දීම | සු.ම.ක. සංඛ්‍යාව | 40 | 204 |
| 23 | කර්මාන්ත සඳහා සුදුසු අමුද්‍රව්‍ය සපයා දීම | සේවා සංඛ්‍යාව | 6 | 100 |
| 24 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය සහ වෙනත් පහසුකම් සපයා දීම | සු.ම.ක. සංඛ්‍යාව | 80 | 305 |
| 25 | උපදේශන/ උපදේශක සේවා සපයා දීම | සේවා සංඛ්‍යාව | 40 | 6 |
| 26 | යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් නිෂ්පාදන සැලසුම් කිරීම සහ වැඩි දියුණු කිරීම | අලුතින් / නැවත සාදා සකස් කරන ලද නිෂ්පාදන සංඛ්‍යාව | 6 | 2 |
| 27 | රසායනාගාර පරීක්ෂණ වාර්තා සපයා දීම | සපයා දෙන ලද පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව | 12 | 7 |
| 28 | කර්මාන්තකරුවන් සහ වෘත්තිකයින් සඳහා පුහුණුව සපයා දීම | පුද්ගල | 30 | 15 |
| 28 | තාක්ෂණය ලබා දීම (වැඩමුළු සහ පුහුණු වැඩසටහන්) | වැඩසටහන් සංඛ්‍යාව | 3 | 4 |
| 29 | උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (යන්ත්‍රෝපකරණ පුහුණුව) | පුහුණුලාභීන් සංඛ්‍යාව | 20 | 5 |

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ලක්කය | සාධනය |
| තාක්ෂණ සේවා අංශය | | | | |
| 30 | ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සඳහා සහයෝගය ලබාදීම | වැඩි දියුණු කරන ලද ක්‍රියාවලි සඳහා ප්‍රවේශ වූ සු.ම.ක. සංඛ්‍යාව | 5 | 5 |
| 31 | ව්‍යවසායකයින්/ කර්මාන්තකරුවන්/ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සංවිධාන සහ ප්‍රාදේශීය මට්ටමේ පුද්ගලයින් සඳහා අවශ්‍යතාවය අනුව සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 4 | 4 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | - | - |
| 32 | කාර්මික සහතික පත්‍ර පාඨමාලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 2 | 4 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | - | 46 |
| 33 | සුදුසු විදේශීය සහ දේශීය තාක්ෂණය සපයාදීම | සු.ම.ක. සංඛ්‍යාව | 2 | 8 |
| 34 | තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම | වැඩමුළු සංඛ්‍යාව | 72 | 49 |
| 35 | නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම | සංවර්ධනය කරන ලද නව නිෂ්පාදන සංඛ්‍යාව | 4 | 3 |
| 36 | යෝග්‍ය විදේශීය සහ දේශීය තාක්ෂණය ලබා ගැනීම | ලබා ගන්නා ලද විදේශීය/දේශීය තාක්ෂණයන් සංඛ්‍යාව | 3 | 2 |
| ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය | | | | |
| 37 | GMP, ISO, BHC (ව්‍යාපාර සෞඛ්‍ය සහතිකය) ජාතික ඵලදායිතා තිළිණ ආදී ක්‍රමවේද සහතිකකරණ ලබාගැනීම සඳහා සහාය වීම | සු.ම.ක. සංඛ්‍යාව | 5 | 3 |
| 38 | ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 3 | 4 |
| 39 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය කරන නිපුණතා හඳුනා ගැනීම | අංශ/විෂයයන්/ක්ෂේත්‍ර සංඛ්‍යාව | 10 | 4 |
| 40 | විෂයමාලාව සංවර්ධනය කිරීම සහ සකස් කර නිම කිරීම | විෂයමාලා සංඛ්‍යාව | 10 | 7 |
| 41 | අනාගත ව්‍යවසායකයින් හඳුනා ගැනීම | අනාගත ව්‍යවසායකයින් සංඛ්‍යාව | 180 | 440 |
| 42 | නව ව්‍යපෘති යෝජනා සකස් කිරිම | ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 1 | 1 |
| 43 | තොරතුරු ප්‍රචාරණය කිරීම | ලිපිලේඛන සංඛ්‍යාව | 600 | 302 |
| 44 | පුවත් සඟරා පළ කිරීම | ප්‍රවෘත්ති සඟරා සංඛ්‍යාව | 4 | 4 |
| 45 | ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවිකරණ සහ මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 9 | 18 |

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | සාධනය |
| 46 | ඵලදායිතා කාර්ය සංග්‍රහ, මාර්ගෝපදේශ, අත්පොත් සහ ක්‍රියාවලි අත්පොත් ආදිය සකස් කිරීම | අත්පොත් / වාර්තා සංඛ්‍යාව | 9 | 12 |
| 47 | පුස්තකාල සම්පත් ක්‍රියාවලි ගත කිරීම | වර්ගීකරණය කිරීම සහ නාමාවලිය සඳහා ප්‍රකාශන සංඛ්‍යාව | 600 | 847 |
| | | සම්පාදනය කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව (කාර්මික සංවර්ධන මණ්ඩල අත් පත්‍රිකා, පත්‍රිකා, අත්පොත් ආදිය) | 24 | 252 |
| 48 | සේවාලාභීන්ගෙන් ලැබුණු විමසුම්වලට අදාළ කරුණු ඉටු කර දීම | විමසුම් සංඛ්‍යාව | 600 | 1322 |
| **කාර්මික ජනපද අංශය** | | | | |
| 49 | පවතින කාර්මික ජනපද නවීකරණය කිරීම සහ නගා සිටුවීම | කාර්මික ජනපද සංඛ්‍යාව | 4 | 4 |
| 50 | පවතින කාර්මික ජනපද නගා සිටුවීම පිණිස ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | යෝජනා සංඛ්‍යාව | 1 | 1 |
| 51 | කාර්මික ජනපද සඳහා කර්මාන්තකරුවන් තෝරාගැනීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 30 | 29 |
| 52 | තෝරාගත් කර්මාන්තකරුවන් සඳහා සංවර්ධනය කරන ලද ඉඩම් කට්ටි ගොඩනැගිලි වෙන්කර දීම | ඉඩම් කට්ටි සංඛ්‍යාව | 20 | 24 |
| 53 | නව කර්මාන්ත නිර්මාණය කිරීම සඳහා සහාය ලබා දීම | කර්මාන්ත සංඛ්‍යාව | 19 | 15 |
| | | රැකියා සංඛ්‍යාව | 200 | 344 |
| 54 | කල්බදු ගිවිසුම් අත්සන් කිරීම | ගිවිසුම් සංඛ්‍යාව | 20 | 19 |
| 55 | නව මිනින්දෝරු සැලසුම් සකස් කිරීම | සැලසුම් සංඛ්‍යාව | 1 | 1 |
| 56 | එක් එක් කාර්මික ජනපදය සඳහා නාමාවලියක් (කර්මාන්ත පැතිකඩක්) බැගින් සකස් කර එය කාර්මික සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියෙහි පළකිරීම | පැතිකඩ සංඛ්‍යාව | 1 | 1 |
| 57 | වසා දමා ඇති කර්මාන්තශාලා ගොඩනැගිලි කාර්මික සංවර්ධන මණ්ඩලයට අත්පත් කරගැනීම | ගොඩනැගිලි සංඛ්‍යාව | 8 | 5 |
| 58 | එසේ අත්පත් කරගත් කර්මාන්ත ශාලා නව කර්මාන්ත කරුවන් වෙත පවරා දීම | අත්පත් කරගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව | 8 | 2 |
| **රබර් සංවර්ධන අංශය** | | | | |
| 59 | උප කොන්ත්‍රාත් අවස්ථා ලබාදීම සඳහා පහසුකම් සැලසීම | වැඩ ඇණවුම් සංඛ්‍යාව | 8 | 12 |
| 60 | රබර් නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා සහාය වීම | වැඩ සංඛ්‍යාව | 23 | 15 |
| | | කර්මාන්ත සංඛ්‍යාව | 11 | 5 |
| 61 | නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ සහ සහතිකකරණ සපයාදීම | නිකුත් කරන ලද සහතිකකරණ සංඛ්‍යාව | 69 | 104 |
| | | නිෂ්පාදන සාම්පල සංඛ්‍යාව | 2,459 | 1,053 |

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ලක්කය | සාධනය |
| 62 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා රබර් නිෂ්පාදන සංවර්ධනය කිරීම | කර්මාන්ත සංඛ්‍යාව | 20 | 12 |
| 63 | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 27 | 23 |
| 64 | තාක්ෂණ උපදේශන සේවා ලබාදීම සඳහා පහසුකම් සැලසීම | කර්මාන්ත සංඛ්‍යාව | 82 | 46 |
| 65 | කේන්ද්‍රාපසාරී රබර් කිරි සපයාදීම | ප්‍රමාණය ලීටර් වලින් | 12,330 | 10,938 |
| | | කර්මාන්ත සංඛ්‍යාව | 694 | 531 |
| 66 | රබර් සංයෝග සහ අනෙකුත් රසායනික ද්‍රව්‍ය සපයා දීම | ප්‍රමාණය කි.ග්‍රෑ. වලින් | 54,791 | 29,486 |
| | | කර්මාන්ත සංඛ්‍යාව | 1,232 | 230 |
| 67 | අඹරන ලද රබර් මිශ්‍රණ සපයා දීම | ප්‍රමාණය කි.ග්‍රෑ. වලින් | 32,958 | 15,535 |
| | | කර්මාන්ත සංඛ්‍යාව | 55 | 31 |
| 68 | රබර් නිෂ්පාදන අභ්‍යන්තර ලෙස නිෂ්පාදනය කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 3 | 8 |
| **සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථාන** | | | | |
| 69 | ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 3 | 5 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45 | 62 |
| 70 | විතාරන්දෙණිය, ඉමියන්ගොඩ සහ ප්‍රධාන කාර්යාලයෙහි නිෂ්පාදනය කරනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන සඳහා පිරිසැකසුම් පහසුකම් සපයා දීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 180 | 153 |
| 71 | ජීවනෝපාය තිරසර කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | 3 | 3 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 60 | 60 |
| 72 | වාර්ෂික පාවහන් සහ සම්භාණ්ඩ වෙළෙඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ පැවැත්වීම | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | 1 | 1 |
| 73 | සේවාලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සංවිධානය කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 3 | 2 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45 | 32 |
| 74 | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම (පාවහන් / සම්භාණ්ඩ) කටුබැද්ද | වැඩසටහන් සංඛ්‍යාව | 9 | 10 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 90 | 85 |
| 75 | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම (පාවහන් /සම්භාණ්ඩ) ප්‍රාදේශීය | වැඩසටහන් සංඛ්‍යාව | 6 | 15 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 90 | 311 |

| අනු අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | සාධනය |
| 76 | පාවහන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 2 | 4 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 20 | 27 |
| **77** | නව සහ දැනට සිටින කර්මාන්තකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 8 | 7 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 100 | 72 |
| **අලෙවි අංශය** | | | | |
| 78 | ගැනුම්කරු විකුණුම්කරු හමුවීම් (අපනයන සංසද) පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම | හමුවීම් සංඛ්‍යාව | 3 | 2 |
| | | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 150 | 35 |
| 79 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හඳුනා ගෙන කර්මාන්තකරුවන්ට එම පහසුකම් සපයා දීම | නව කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 50 | 21 |
| | | විකුණුම්වල වටිනාකම (රු.මි.) | 11 | 10.70 |
| 80 | කර්මාන්තකරුවන්ට අවශ්‍ය උපකොන්ත්‍රාත් පහසුකම් හඳුනා ගෙන එම පහසුකම් සපයා දීම | ඇණවුම් වල වටිනාකම (රු.මි.) | 15 | 7.86 |
| | | ඇණවුම් සංඛ්‍යාව | 30 | 30 |
| 81 | අබලි ද්‍රව්‍ය බෙදා හැරීම | ප්‍රමාණය (මෙ.ටො.) | 900 | 758 |
| | | ප්‍රමාණය (මෙ.ටො.) | 900 | 706 |
| | | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 250 | 723 |
| | | ලෝහ අබලි විකිණීම (රු.මි.) | 100 | 43.16 |

# 3.0 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විශේෂ ක්‍රියාකාරකම්

## 3.1 ආහාර සැකසුම් කර්මාන්ත සංවර්ධනය - බස්නාහිර පළාත

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි තාක්ෂණ සේවා අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමග එක්ව නියමු ව්‍යාපෘතියක් ලෙස ආහාර සැකසුම් කර්මාන්ත සංවර්ධන වැඩසටහන බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කරන ලදී. දේශීය ආහාර කර්මාන්තවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ විය. තෝරා ගත් කර්මාන්තකරුවන්ට රු. 500,000 ක උපරිමයකට යටත්ව අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය සංවර්ධන පිරිවැයෙන් 50% ක දායකත්වයක් සපයා දෙන ලදී.

මේ සඳහා තෝරාගත් සමාගම් සහ කාර්මික සංවර්ධන මණ්ඩලය අතර ගිවිසුම් අත්සන් කිරීමේ විශේෂ උත්සවයක් 2016 ජුනි 26 වැනි දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙහිදී පවත්වන ලදී. නියමිත කාල රාමුව තුළ දී ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වූ තෝරාගත් කර්මාන්ත පහක් සඳහා රුපියල් මිලියන 2.4 ක් වටිනා මූල්‍ය පැකේජයක් සපයා දෙන ලදී.





පිංතූරය 3.1.1 කර්මාන්තකරුවන් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

යන්ත්‍ර සූත්‍ර සවිකරන ලද පහත සඳහන් සමාගම් වාණිජ නිෂ්පාදන ආරම්භ කරන ලදී:

| අංකය | සමාගම | නිෂ්පාදනය | යන්ත්‍ර | ප්‍රතිලාභය |
|---|---|---|---|---|
| 1 | ග්‍රීන් වේ ඒසියා පුද්. සමාගම | කජු නිෂ්පාදන | කජු ලෙලි ඉවත් කිරීමේ යන්ත්‍ර | නිෂ්පාදනය වැඩිකර අපනයන වෙළෙඳ පොළ සඳහා යැවීම |
| 2 | හැදිගල්ල ටී ෆැක්ටරි පුද්. සමාගම | තේ | රෝද හතරක් සහිත, ඉහළින් භාණ්ඩ එහා මෙහා ගෙන යන යන්ත්‍රය (මොනොරේල්) | අතින් ක්‍රියා කරවීමේදී අවශ්‍ය ශ්‍රමය සහ එහි දී සිදුවන හානිය අඩු කර අවසන් නිෂ්පාදිතයෙහි ගුණාත්මක භාවය සහ ආහාර සුරක්ෂිත භාවය වැඩි දියුණු කිරීම |
| 3 | ෆෝකොන්ස් කැනරීස්, බේරුවල | මාළු/මස් ආශ්‍රිත නිෂ්පාදන | ගැඹුරු තෙල්වල ආහාර බදින යන්ත්‍ර දෙකක්, මස් කැබලි කපන යන්ත්‍ර දෙකක්, සහ එළවළු කපන යන්ත්‍රයක් | නිෂ්පාදනය සහ අපනයන වෙළෙඳ පොළ කොටස වැඩි කිරීම, නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම (උදා: කපන ලද ලූනු කැබලි එක සමාන වීම), ශ්‍රම කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, කර්මාන්ත ශාලාවෙහි සෞඛ්‍යාරක්ෂිත තත්වයන් වැඩි දියුණු කිරීම. |
| 4 | කැලණි වැලි කැනරීස්, හංවැල්ල | පළතුරු ආශ්‍රිත නිෂ්පාදන | ස්වයංක්‍රීය ජෑම් කෝප්ප පිරවීමේ/මුද්‍රා තැබීමේ යන්ත්‍රය | නිෂ්පාදන ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම (ධාරිතාවය පැයට කෝප්ප 1000), සෞඛ්‍යාරක්ෂිත බව වැඩි දියුණු කිරීම, නිෂ්පාදනයෙහි ආරක්ෂාකාරී බව වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදිතයේ බාහිර පෙනුම වැඩි දියුණු කිරීම. |

## 3.2 කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව

චීස් නිෂ්පාදනය පිළිබඳ විශේෂ වැඩමුළුවක් 2016.02.29 වැනි දින කොළඹ කිංස්බරි හෝටලයේ දී පවත්වන ලද අතර එම වැඩසටහන සඳහා සම්පත් දායකයෙකු ලෙස නෙදර්ලන්ත විශේෂඥ තොම් රිජෙන් මහතාගේ සහාය ලැබුණි.





**පිංතූරය 3.2.1 - "චීස් නිෂ්පාදනය" කිරීමේ තාක්ෂණය ලබා දීමේ වැඩ වැඩමුළුව**

## 3.3 තාක්ෂණය ලබා දීමේ වැඩමුළු

කාර්මික සංවර්ධන මණ්ඩලය නෙදර්ලන්තයේ PUM සමාගම සමග සහයෝගීත්වයෙන් යුතුව ආහාරයට ගත හැකි තෙල් කර්මාන්ත පිළිබඳ තාක්ෂණය ලබාදීමේ එක් දින වැඩමුළුවක් 2016 මාර්තු 09 වැනි දින කොළඹ කිංස්බරි හෝටලයේදී පවත්වන ලදී.

ආහාරයට ගන්නා තෙල් ආශ්‍රිත දේශීය කර්මාන්ත අංශයෙහි මූල්‍ය සහ තාක්ෂණික විශ්ලේෂණය පිළිබඳ අවධානය යොමු කරමින් ආහාරයට ගන්නා තෙල් කර්මාන්තයෙහි නියැළී සිටින තෝරාගත් කර්මාන්තකරුවන් 51 දෙනෙකු සඳහා නෙදර්ලන්ත විශේෂඥයකු වන ජැන් රිට්සෙමා මහතා විසින් මෙම වැඩමුළුව පවත්වන ලදී.

## 3.4 ප්‍රදර්ශන

**පාවහන් සහ සම් භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය - 2016**

- සම සංවිධායකයෙකු වශයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සම් භාණ්ඩ අංශය 2016 පෙබරවාරි 5 වැනි දින සිට 7 වැනි දින දක්වා කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී අට වැනි පාවහන් සහ සම්භාණ්ඩ වෙළෙඳ ප්‍රදර්ශනය පවත්වන ලද අතර කාර්මික සංවර්ධන මණ්ඩලය එම වැඩසටහනෙහි සම සංවිධායකයෙකු විය. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වූයේ මෙම කර්මාන්ත අංශයෙහි ප්‍රතිරූපය ගොඩ නැගීමයි.
- වෙළඳ කුටි 225 කින් සමන්විත වූ මෙම වෙළෙඳ ප්‍රදර්ශනයෙහිදී පාවහන් ආශ්‍රිත නිෂ්පාදන, ගමන් භාණ්ඩ, අමු ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ අනිකුත් උපාංග ප්‍රදර්ශනය කරන ලදී. එමෙන්ම, ආසියානු කලාපය නියෝජනය කරමින් ආසියානු කලාපයෙහි සිටින අමුද්‍රව්‍ය, අනිකුත් උපාංග සහ උපකරණ සැපයුම්කරුවන් ද මෙම ප්‍රදර්ශනයට සහභාගී වූහ.
- මෙම ප්‍රදර්ශනයෙහි විශේෂ අවස්ථා ලෙස මෝස්තර දැක්මක්, නිර්මාණ තරගයක් සහ හොඳම වෙළෙඳ කුටිය තේරීමේ තරගය ද පැවැත්වුණි.






**පින්තූරය 3.4.1 - පාවහන් සහ සම්භාණ්ඩ වෙළෙඳ ප්‍රදර්ශනය 2016**

### 3.5 අපනයන ප්‍රවර්ධන සමුළුව

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සහයෝගය ඇතිව කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රාදේශීය සංවර්ධන අංශය දේශීය කර්මාන්තකරුවන් සඳහා ගෝලීය වෙළෙඳ පොළ විභවතාවයන් හඳුන්වා දීමේ අරමුණෙන් 2016 නොවැම්බර් මස 24 වැනි දින කොළඹ 01 හි පිහිටි මිලෝදා මූල්‍ය අධ්‍යයන විද්‍යාපීඨයෙහිදී අපනයන නිෂ්පාදන සමුළුව පවත්වන ලදී. ප්‍රාදේශීය මට්ටමේ අපනයනය සඳහා සැකසූ භාණ්ඩ නිෂ්පාදකයින් 34 දෙනෙකු මෙම වැඩසටහනට සහභාගී වූහ. අපනයන සංවර්ධන මණ්ඩලය මෙම වැඩසටහන පැවැත්වීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන ලද අතර ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය, ලංකා බැංකුව සහ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ අපනයන සමාගම් කිහිපයක් ද මෙම වැඩසටහනට සහභාගී වූහ.




## 3.6 වෙළඳ පොළ ජය ගැනීම සඳහා ඉදිරි මග - සු.ම.ක. සඳහා අලෙවිකරණ වැඩසටහන්

අලෙවිකරණය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව වවුනියාව, කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්ක හැර ඉතිරි දිස්ත්‍රික්ක 22 හි දී "වෙළෙඳ පොළ ජය ගැනීම සඳහා ඉදිරි මග" නමින් අලෙවිකරණ වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. අනාගත ව්‍යවසායකයින් 750 දෙනෙකු මෙම වැඩසටහන්වලට සහභාගී වූහ.

මෙම වැඩසටහන්වලට සහභාගීවූවන්ට පහත සඳහන් කරුණු පිළිබඳ දැනුවත්භාවය ලබාදීම මෙම වැඩසටහන් වල අරමුණ විය.

- "වෙළඳ නාමකරණයෙහි" සහ "පාරිභෝගික තෘප්තියෙහි" ඇති වැදගත්කම;
- සමාන නිෂ්පාදන සමග තරග කිරීම සඳහා නිෂ්පාදන සංවර්ධනය කිරීමෙහි ඇති වැදගත්කම;
- පිරිවැය අඩු කිරීම සඳහා තාක්ෂණික ක්‍රම යොදා ගන්නේ කෙසේද; සහ
- මූල්‍ය ගැටලු විසඳීමේ ක්‍රමය.

**ලංකා බැංකුව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

අපනයන, ආනයන ආදේශක, දේශීය අගය එකතු කිරීම සහ රැකියා උත්පාදනය සඳහා ඇති විභවයන් වැඩි දියුණු කරමින් කාර්මික අංශයෙහි ඉහළ වර්ධන වේගයක් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රයත්නයන් ඒකාබද්ධ කිරීමේ අරමුණ ඇතිව කාර්මික සංවර්ධන මණ්ඩලය 2016.12.01 දින ලංකා බැංකුව සමග අවබෝධතා ගිවිසුමකට එළැඹුණි. මෙම අවබෝධතා ගිවිසුම මගින් සාර්ථක ව්‍යාපාරයන්හි ආයෝජන සිදු කර, පවතින කර්මාන්ත සංවර්ධනය කර පුළුල් කිරීම සඳහා අනාගත ව්‍යවසායකයින් ශක්තිමත් කර ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙනු ඇත.

# 4.0 කාර්යසාධන ජයග්‍රහණ

**4.1 පාලන අංශය (AD)**

**4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)**

**4.3 සැලසුම් අංශය (PD)**

**4.4 අලෙවි අංශය (MD)**

**4.5 කාර්මික ජනපද අංශය (IED)**

**4.6 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD&SC)**

**4.7 ඉංජිනේරු අංශය (ED)**

**4.8 ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය (CEDACS)**

**4.9 තාක්ෂණ සේවා අංශය (TSD)**

**4.10 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)**

## 4.1 පාලන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, සහ ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයෙහි පාලන අංශයෙහි වගකීම වේ.

**මෙම අංශයට පැවරී ඇති කාර්යයන්:**

- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව ආයතනික සහ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වැටුප් විෂමතා ඉවත් කිරීම
- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පිරිස් බලය ශක්තිමත් කිරීම පිණිස කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ උසස් කිරීම් ක්‍රමවේදය සකස් කිරීම.
- සාමාන්‍ය බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්ය සාධන ඇගයීම්, මාරු කිරීම් සහ විශ්‍රාම ගැනීම් ආදියට අදාළ කටයුතු ඉටු කිරීම.
- විනය පරීක්ෂණ පැවැත්වීම
- අපේක්ෂිත මට්ටමට ගැළපෙන පරිදි කාර්මික සංවර්ධන මණ්ඩල කාර්ය මණ්ඩලයෙහි දැනුම වැඩි දියුණු කිරීම සඳහා විදේශීය ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ සපයා දීම
- සේවක සුභසාධනය සහ සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම
- දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- අභ්‍යන්තර ආරක්ෂක සේවා සහ ආරක්ෂක කටයුතු කළමනාකරණය කිරීම
- මණ්ඩලයෙහි ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම
- මණ්ඩලයෙහි ප්‍රවාහන සේවා කළමනාකරණය කිරීම
- නීති කටයුතු සහ ගැටළු සම්බන්ධයෙන් මැදිහත් වීම

| කාණ්ඩය | කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | | එකතුව සහ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| | පිරිමි | කාන්තා | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | 05 | 01 | 6 (1.29%) |
| **තෘතියික මට්ටම** | 108 | 43 | 151 (31.52%) |
| **ද්විතියික මට්ටම** | 60 | 77 | 137 (28.60%) |
| **ප්‍රාථමික මට්ටම** | 179 | 6 | 185 (38.62%) |
| එකතුව | **352** (73.48%) | **127**(26.52%) | **479** (100%) |

වගුව **4.1.1 – 2016** දෙසැම්බර් **31** දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්ය මණ්ඩල සංඛ්‍යාව




වගුව 4.1.2 – **2016** මූල්‍ය වර්ෂය තුළ පාලන අංශයෙහි කාර්ය සාධන ජයග්‍රහණ

| අරමුණ | ක්‍රියාකාරකම | | සංඛ්‍යාව | රු. |
|---|---|---|---|---|
| කා.සං.ම. පිරිස් බලය ශක්තිමත් කිරීම | **1.** | **පහත සඳහන් සාමාන්‍ය මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් ඉටු කිරීම** | | |
| | (i) | බඳවා ගැනීම් (කාර්ය මණ්ඩල) | 23 | |
| | (ii) | ඉල්ලා අස්වීම් | 06 | |
| | (iii) | විශ්‍රාම ගැනීම් | 17 | |
| | (iv) | සේවය අතහැර යාම් | - | |
| නීතිමය ගැටළු අවම කිරීම | **2** | **විනය කළමනාකරණය** | | |
| | (i) | විනය පරීක්ෂණ පැවැත්වීම | 03 | |
| | (ii) | කම්කරු කොමසාරිස් මගින් කටයුතු කළ කම්කරු නඩු | 12 | |
| ඵලදායීතාවය වැඩි දියුණු කිරීම | **3** | **මානව සම්පත් සංවර්ධනය - පුහුණු** | | |
| | (i) | දේශීය පුහුණු | 395 | |
| | (ii) | විදේශීය පුහුණු | 01 | |
| | **4** | **මානව සම්පත් කළමනාකරණය - වන්දි** | | |
| | (i) | 2016 වර්ෂයේදී පුද්ගලයින් 22 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් | | 10,692,520.50 |
| | **5** | **මානව සම්පත් කළමනාකරණය - සේවක සුභසාධන** | | |
| | (i) | බයිසිකල් ණය | 15 | |
| | (ii) | ආපදා ණය | 110 | |
| | (iii) | වෛද්‍ය | 637 | |
| ආරක්ෂක ක්‍රමවේද ස්ථාපිත කිරීම | **6** | **ආරක්ෂක කළමනාකරණය** | | |
| | (i) | ආරක්ෂක පිරිවැය | | 13,333,584.65 |
| | **7** | **බැහැර කිරීම්** | | |
| | (i) | පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල | 01 | |
| | **8** | **සාමාන්‍ය උත්සව** | | |
| | (i) | උත්සව සංඛ්‍යාව | 04 | |
| | **9** | **තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු** | | |
| | (i) | තැපැල් ගාස්තු | | 491,878.00 |
| | (ii) | විදුලි සංදේශ ගාස්තු | | 1,543,680.92 |
| | **10** | **ප්‍රවාහන කළමනාකරණය** | | |
| | (i) | ඉන්ධන වියදම | | 5,482,440.80 |
| | (ii) | වාහන නඩත්තු වියදම | | 3,734,465.31 |
| ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම | **11** | **ප්‍රසම්පාදන කළමනාකරණය** | | |
| | (i) | ඉදිරිපත් කරන ලද ඇණවුම් සංඛ්‍යාව | 555 | |
| | (ii) | ප්‍රාග්ධන මිලදී ගැනීම් | | 36,623,697.73 |
| | (iii) | පුනරාවර්තන මිලදී ගැනීම් | | 77,413,601.38 |

## 4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය

**සාමාන්‍ය**

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රාදේශීය සංවර්ධන අංශය දිවයිනෙහි සමස්ත දිස්ත්‍රික්ක 25 ම ආවරණය කරමින් එහි ප්‍රාදේශීය ජාලය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් විසි පස් දෙනෙකු සහ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 62 දෙනෙකු ප්‍රාදේශීය කාර්යාලවල රාජකාරි සඳහා යොදවා ඇත.

ප්‍රධාන අරමුණු හතරක් පදනම් කරගෙන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම පිණිස ප්‍රාදේශීය සංවර්ධන අංශය සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

ඉලක්ක කර ඇති ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි වේ:

1. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගෝලීය වෙළෙඳ පොළ සඳහා වැඩි දියුණු කිරීම
2. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ආදායම වැඩි දියුණු කිරීම
3. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා කර්මාන්ත ඉලක්ක කර ගත් හැකියා සංවර්ධනය වැඩි දියුණු කිරීම
4. ප්‍රාදේශීය වශයෙන් පවතින ආර්ථික අසමානතා විසඳා ගැනීම සඳහා උපකාරී වීම

ව්‍යවසායකත්ව සංවර්ධනය, කුසලතා සංවර්ධනය, උපදේශක සේවා, අලුතින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහාය සපයා දීම, ශක්‍යතා අධ්‍යයන සහ කර්මාන්ත සම්බන්ධ තොරතුරු සපයා දීම ප්‍රාදේශීය සංවර්ධන අංශයට සහ දිස්ත්‍රික් කාර්යාල වලට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.

**වර්ෂය තුළදී සිදු කරන ලද විශේෂ වැඩසටහන්**

දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයින් සඳහා වන විශේෂ වැඩසටහන

දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයින් සඳහා පහත සඳහන් අරමුණු යටතේ 2016.07.21 වැනි දින ලක්කම් ශ්‍රවණාගාරයේදී විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- ගෘහ භාණ්ඩ අංශයෙහි පවතින ගැටලු හඳුනා ගැනීම;
- පිරිවැය අඩු කිරීමේ ක්‍රම හඳුන්වා දීම;
- වැඩි දියුණු කරන ලද යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ මෙවලම් හඳුන්වා දීම;
- නිෂ්පාදන සංවර්ධන උපාය මාර්ග හඳුන්වා දීම; සහ
- ලංකා බැංකුව හරහා මූල්‍ය සහාය සපයා දීම.

ප්‍රධාන පෙළේ දැව ආශ්‍රිත කර්මාන්තකරුවන් විසි පස් දෙනෙකු මෙම වැඩසටහනට සහභාගී වූහ. ලංකා බැංකුවේ නිලධාරීන් සහ ලීමා ක්‍රියේෂන්ස් පුද්ගලික සමාගමේ නිලධාරීන් සම්පත් පුද්ගලයින් ලෙස මෙම වැඩසටහනට සහභාගී වූහ.

ප්‍රාදේශීය සංවර්ධන අංශය සඳහා නව ජාලගත අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.

එක් එක් නිලධාරියාගේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා සහ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ මට්ටම මැන බැලීම සඳහා ජාලගත නව පසුවිපරම් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

**ප්‍රාදේශීය සංවර්ධන අංශයෙහි අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමවේදය**




**අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරෙයි දී පවත්වන ලද විශේෂ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන සහ ප්‍රවර්ධන වැඩසටහන**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දායකත්වය ඇතිව අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරෙයි, අම්පාර, අක්කරෙයිපත්තු, සෙයින්දමරුදු සහ දෙහිඅත්තකණ්ඩිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලදී 2010 අගෝස්තු මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ විශේෂ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන වැඩසටහනක් සංවිධානය කර පවත්වන ලදී.

කර්මාන්තකරුවන් 600 ට වැඩි පිරිසකට පාවහන් නිෂ්පාදනය, වඩු කර්මාන්තය, නිවාස වයරින් කිරීම, පෙදරේරු කර්මාන්තය, ව්‍යාපාර නිර්මාණය කිරීම, ඇඳුම් මැසීම, සහ අතින් සාදන ආරක්ෂිත අත්වැසුම් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබා දීමේ පුහුණු වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන් සහ කළමනාකරණ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර එම වැඩසටහන් වලට සමගාමීව හාල් මෝල් හිමියන් විසින් මුහුණ දෙනු ලබන කර්මාන්ත ගැටලු සහ අභියෝග හඳුනා ගැනීම සඳහා වැඩසටහනක් ද පවත්වන ලදී.





**පිංතූරය 4.2.1 - සම් වලින් සකස් කරන ආරක්ෂිත අත්වැසුම් නිෂ්පාදනය**

**කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන**

කම්මල් වැඩ, කොහු ආශ්‍රිත නිෂ්පාදන සහ මැටි භාණ්ඩ නිෂ්පාදන ආදී සාම්ප්‍රදායික කර්මාන්ත නගා සිටුවීමේ අරමුණ ඇතිව 2005 වර්ෂයේ දී "කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" යන නමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. එයින් පසුව අතින් සාදන කඩදාසි, කජු සහ කරවල වැනි සාම්ප්‍රදායික නොවන කර්මාන්ත ද මෙම වැඩසටහනට හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන ක්‍රියාවලි හඳුන්වා දීම, නවීන ශිල්පීය ක්‍රම සමගින් ප්‍රතිලාභීන්ගේ හැකියා වැඩි දියුණු කිරීම සහ අලෙවිකරණ පහසුකම් සපයා දීම ආදිය සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. 2016 වර්ෂය තුළදී ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් මෙම වැඩසටහන පහත සඳහන් පරිදි වෙන වෙනම ව්‍යාපෘති දෙකක් වශයෙන් ක්‍රියාත්මක කරන ලදී:

1. කාර්මික නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම; සහ
2. ව්‍යවසාය ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන ගම්මාන.

ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ වෙන් කරන ලද රුපියල් මිලියන 3.02 ක අරමුදල් යොදා ගනිමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මැණික්කඩවර කජු පිරිසැකසුම් ගම්මානයෙහි කාන්තාවන් විසි දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම සහ උපකරණ කට්ටල 40 ක් සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීම, කජු ආශ්‍රිත කර්මාන්ත කරුවන් 50 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම සහ කජු ලෙලි ගැසීමේ යන්ත්‍ර සහ කජු වර්ග කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීම, සහ මන්නාරම තරපුරම් කජු පිරිසැකසුම් ගම්මානයේ ව්‍යවසායකයින් 104 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම සහ උපකරණ කට්ටල සපයා දීම සිදු කරන ලදී.

ව්‍යාපාර ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් යටතේ රන්කරුවන් 56 දෙනෙකු සඳහා රන් ආභරණ කර්මාන්තයේ උසස් තාක්ෂණ පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර, මඩකලපුව දිස්ත්‍රික්කයේ ආභරණ ගම්මාන 5 ක් සඳහා (පොරතිව්පත්තු, මුණතිව්, කල්ලාර්, ඔන්ඩච්චිමඩම්, පත්තපුරම්, ඔන්ඩච්චි) පෙන්ඩන්ට් මෝටර් 200 ක් ලබා දෙන ලදී. මහනුවර දිස්ත්‍රික්කයේ පිටවෙල මැටි කර්මාන්ත ගම්මානය සඳහා මැටි ඇනීමේ යන්ත්‍රයක්, විදුලි සකපෝරු 25 ක් සහ සෙවිලි තහඩු 170 ක් සපයා දෙන ලදී. කර්මාන්ත කරුවන් 10 දෙනෙකු සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහනක් සහ කළමනාකරණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහළගම මැටි කර්මාන්ත ගම්මානයේ කර්මාන්තකරුවන් සඳහා විදුලි සකපෝරු 10 ක් සපයා දෙන ලදී. මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්ලයාවලෙයි කජු සැකසුම් ගම්මානය සඳහා කජු ලෙලි ගැසීමේ යන්ත්‍රයක්, කජු වර්ග කිරීමේ යන්ත්‍රයක් සහ උපකරණ කට්ටල 64 ක් සපයා දෙන ලදී. තවද, කළුතර දිස්ත්‍රික්කයේ ඉලිඹ කොහු ගම්මානය සඳහා ලණු ඇඹරීමේ යන්ත්‍ර කට්ටලයක් ද සපයා දී ඇත. ඉහත සඳහන් කරන ලද වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුළු මුදල රුපියල් මිලියන 8.7 ක් විය.

**විශේෂ ජයග්‍රහණ**

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද ජාතික ඵලදායිතා තිළිණ 2016 වැඩසටහනෙහිදී කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ගම්පහ, කෑගල්ල සහ කොළඹ දිස්ත්‍රික් කාර්යාල වලට නිෂ්පාදන සහ සේවා අංශ සඳහා වන විශේෂ තිළිණ ප්‍රදානය කරන ලදී.







**කාර්ය මණ්ඩල පුහුණු**

ප්‍රාදේශීය නිලධාරීන් සඳහා අදාළ ක්ෂේත්‍රවල දැනුම වැඩිදියුණු කිරීම පිණිස ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් සහ ඵලදායිතාවයෙහි මූලික මෙවලම් සහ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කර පවත්වන ලදී.

## 4.3 සැලසුම් අංශය

**සාමාන්‍ය**

ගෝලීය වෙළඳපොළෙහි සිදු වෙමින් පවතින සීඝ්‍ර පරිවර්තනය හේතුවෙන් ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි ඇතිවී තිබෙන තරගකාරීත්වය නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසයාකයින්ට වඩාත් අර්ථාන්විත ලෙස සේවා සපයා දීමට හැකි වන පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා ක්‍රමෝපායයන් නැවත සකස් කිරීමේ සහ නැවත නිර්වචනය කිරීමේ වගකීම සැලසුම් අංශයට පැවරී තිබේ.

**සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයන්**

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි එක් එක් අංශයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් උපායමාර්ගික ලෙස සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සැලසුම් අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම , සෑම වර්ෂයක ම ආරම්භයේදී නියම කර ගනු ලබන භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අදාළව කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සංයුක්ත ක්‍රමෝපායික සැලැස්ම සකස් කිරීම මෙන්ම එක් එක් අංශවල වාර්ෂික ක්‍රමෝපායික ක්‍රියාත්මක සැලසුම් අනුව ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම ද සැලසුම් අංශයෙහි වගකීම වේ. තවද, මෙම අංශය විසින් රේඛීය අමාත්‍යාංශයට අවශ්‍ය කළමනාකරණ තොරතුරු සපයා දීම මෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අදාළ අනෙකුත් අංශවලට අවශ්‍ය කරන කාර්ය සාධන ඇගයුම්කරණ සපයා දීම ද සිදු කරනු ලබයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අනෙකුත් අංශවල කාර්යයන්ට පහසුකම් සැලසීම පිණිස පහත සඳහන් උප ක්‍රියාකාරකම් ද මෙම අංශයට පවරා තිබේ:

- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහ 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනතෙහි අනිවාර්ය අරමුණුවලට අනුකූලව ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.
- ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත / ආර්ථිකය ආශ්‍රිත සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ අදාළ ආංශික සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහාය වීම.
- විදේශ අරමුදල් සැපයීම් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- දැනට පවතින, කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටුවලට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහභාගීත්වය ලබා දීම සහතික කිරීම සහ අවශ්‍ය විට ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව මාසික, කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම.

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරීන්ගේ සහාය ඇතිව දිවයින පුරා පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳව තොරතුරු එක් රැස් කරන ලදී.

**2016.12.31** දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | සලකා බලන ලද සු.ම.ක. සංඛ්‍යාව | ප්‍රතිචාර දක්වන ලද මුළු සු.ම.ක. සංඛ්‍යාව | දත්ත සංචිතයට ඇතුල් කරන ලද සු.ම.ක. සංඛ්‍යාව | දත්ත සංචිතයට ඇතුල් කිරීමට තිබෙන සු.ම.ක. සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කුරුණෑගල | 850 | 492 | 204 | 288 |
| මහනුවර | 800 | 230 | 202 | 28 |
| කළුතර | 1,000 | 344 | 194 | 150 |
| මාතලේ | 500 | 167 | 155 | 12 |
| ගාල්ල | 690 | 209 | 139 | 70 |
| රත්නපුර | 500 | 133 | 116 | 17 |
| කෑගල්ල | 600 | 134 | 104 | 30 |
| ගම්පහ | 1,250 | 250 | 99 | 151 |
| යාපනය | 400 | 285 | 99 | 186 |
| කොළඹ | 1,030 | 205 | 95 | 110 |
| අනුරාධපුරය | 300 | 96 | 94 | 2 |
| පොළොන්නරුව | 200 | 126 | 76 | 50 |
| ත්‍රිකුණාමලය | 300 | 99 | 74 | 25 |
| බදුල්ල | 600 | 88 | 62 | 26 |
| මාතර | 600 | 89 | 59 | 30 |
| මොණරාගල | 600 | 80 | 55 | 25 |
| අම්පාර | 350 | 52 | 52 | |
| මුලතිවු | 200 | 100 | 48 | 52 |
| මඩකලපුව | 200 | 55 | 45 | 10 |
| පුත්තලම | 400 | 200 | 45 | 155 |
| නුවර එළිය | 450 | 75 | 41 | 34 |
| මන්නාරම | 150 | 33 | 33 | 0 |
| වවුනියාව | 248 | 66 | 33 | 33 |
| කිලිනොච්චිය | 150 | 66 | 31 | 35 |
| හම්බන්තොට | 500 | 51 | 18 | 33 |
| **එකතුව** | **12,868** | **3,725** | **2,173** | **1,552** |

## 4.4 අලෙවි අංශය

දිවයින පුරා සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන් මෙන්ම ස්වයං රැකියාවල නිරතවී සිටින පුද්ගලයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවි කිරීමට අදාළ ක්‍රියාකාරකම් ආවරණය කරන අලෙවි අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ඉතා වැදගත් සේවා අංශ වලින් එකක් වේ. මෙම අංශය දීර්ඝ කාලීන සම්බන්ධතා හරහා අදාළ නිෂ්පාදනවල වෙළඳ ප්‍රතිරූපය ගොඩනංවමින් දේශීය කර්මාන්තකරුවන්ට අනාගත වෙළඳපොළ සමග සබඳතා ගොඩනගා ගැනීමට උපකාර කරයි. එයට අමතරව, අලෙවි අංශය දේශීය කර්මාන්තකරුවන්ට කර්මාන්ත ඉලක්ක කර ගත් සේවා සපයා දීම ප්‍රවර්ධනය කිරීම සඳහා අනෙකුත් අංශවලටත්, සමස්තයක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයටත් සහාය සපයා දෙයි.
කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ මුද්‍රණ සහ ප්‍රකාශන ඒකකය ද අලෙවි අංශය සමග ඒකාබද්ධ කර තිබේ.

**අලෙවි අංශයට පැවරී ඇති කාර්යයන්**

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම.

- දිවයින පුරා සිටින, තෝරාගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් සඳහා මෙන්ම ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින් සඳහා ද ජාතික ශිල්ප ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම
- ‘ලක්කම්’ සහ ‘ලක්නිපැයුම්’ අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම
- උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම
- වාත්තු වැඩ, ලුහු ඉංජිනේරු, කම්මල් වැඩ සහ අනෙකුත් ලෝහ වාත්තු සහ ශිල්පීය කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය සපයා දීම
- කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශක සේවා සැපයීම

**මෙම අංශය විසින් සපයනු ලබන අනෙකුත් සේවාවන් සහ සේවා ඒකක**

**ලක්කම් අලෙවි මධ්‍යස්ථාන -** දිවයින පුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සහ ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ නිෂ්පාදනවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම අලෙවි මධ්‍යස්ථාන මගින් එම නිෂ්පාදන සඳහා ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙනු ලබයි. සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් විසින් නිපදවනු ලබන ඉල්ලුමක් සහිත භාණ්ඩ හඳුනා ගෙන ඒවා ප්‍රවර්ධනය කිරීම සහ තරගකාරී මිල ගණන් යටතේ ඒවා එකම ස්ථානයකදී අලෙවි කිරීම සඳහා අවස්ථාව සපයා දීම “ලක්කම්” අලෙවි මධ්‍යස්ථානයෙහි අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නිෂ්පාදන අංශයෙහි ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව “ලක්කම්” ලාංඡනය යටතේ අලෙවි කෙරෙන සාම්ප්‍රදායික නිෂ්පාදන වලට දේශීය සහ අන්තර්ජාතික වෙළෙඳ පොළ සඳහා ප්‍රවේශය සපයා දීම පිණිස එම නිෂ්පාදන සඳහා ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙනු ලැබේ. පසුගිය දශක තුනක කාලය තුළදී දිවයින පුරා සිටින සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට වෙළඳ පොළ වෙත ප්‍රවේශ වීම පිණිස සහ වෙළෙඳ පොළ තුළ ඔවුන්ගේ පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලක්කම් අලෙවි මධ්‍යස්ථාන විසින් මණ්ඩලයෙහි සේවා සපයා දී ඇත. එම නිෂ්පාදන පහත සඳහන් කාණ්ඩ යටතේ වර්ග කරනු ලැබේ.

– සාම්ප්‍රදායික වට්ටෝරු අනුව සැකසුම් කරන ලද ආහාර නිෂ්පාදන
– සාම්ප්‍රදායික ඖෂධීය නිෂ්පාදන
– සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත යන්ත්‍ර සූත්‍ර
– අත් යන්ත්‍ර රෙදිපිළි සහ සම්ප්‍රදායික ඇඟළුම්
– අත්කම් භාණ්ඩ සහ විසිතුරු භාණ්ඩ

- **උපකොන්ත්‍රාත් හුවමාරුව** - ලෝක බැංකු අරමුදල් යටතේ පිහිටුවන ලද, අලෙවි අංශය යටතේ ඇති උපකොන්ත්‍රාත් හුවමාරුව 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. එය කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සැපයීමෙහි නිරතවී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය සිදු කරන අතර, පහත සඳහන් භාණ්ඩ සඳහා රාජ්‍ය ආයතනවලින් ඇණවුම් ලබා ගැනීම පිණිස කර්මාන්තකරුවන් / සේවා සපයන්නන් වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරයි.

දැව/MDE/වානේ කාර්යාල පුටු සහ සෝෆා, සම් වලින් සාදන ලද සපත්තු, සෙරෙප්පු සහ බෑග්, රබර් ආශ්‍රිත අමතර කොටස්, ටී-ෂර්ට්, තොප්පි, පාසල් බෑග්, ලිපි ද්‍රව්‍ය, ඇලුමිනියම් දොර, නාම පුවරු සහ බෙදා වෙන් කිරීම් (පාටිෂන්), මැග් බෝඩ්, වයිට් බෝඩ්, කොසු, ඉදල් සහ බුරුසු, පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ කුඩ, තිර රෙදි, විශේෂ අංශ සඳහා ස්ථාපිත කිරීමට නියමිත දත්ත සංචිතය, දැව, ඇඟළුම්, ආහාර, ආයුර්වේද නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර, සම් භාණ්ඩ, පිත්තල භාණ්ඩ, ෆයිබර්, පිඟන් මැටි, සහ උණ දැවයෙන්, පොල්කටු වලින් සහ සිප්පි කටු වලින් සෑදූ විසිතුරු භාණ්ඩ ආදිය.

- **ලෝහ අබලි ව්‍යාපෘතිය -** කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අලෙවි අංශය මගින් යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍ර නොවන ආදී ලෝහ අබලි සහ වෙනත් අදාළ ද්‍රව්‍ය රාජ්‍ය ආයතන වෙතින් මිලදී ගෙන එම ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලියාපදිංචි වී ඇති ලුහු ඉංජිනේරු අංශයෙහි කර්මාන්තකරුවන්ට නිලධාරී මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය ලෙස බෙදා දෙනු ලබයි.

- **ප්‍රදර්ශන -** කාර්මික සංවර්ධන මණ්ඩලය ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් ප්‍රදර්ශන සංවිධානය කරයි. දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීමෙන් අනතුරුව, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ යන අංශ වලින් මුළු දිවයිනෙහි ම විශිෂ්ඨ ව්‍යවසායකයින් තෝරා ගැනීම සඳහා ජාතික මට්ටමේ වාර්ෂික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබේ. මෙම ප්‍රදර්ශන මගින් රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ සුළු කර්මාන්ත ආරම්භ කිරීමට පහසුකම් සලසා දෙනු ලැබේ.

  එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලය බාහිර පාර්ශවයන් විසින් සංවිධානය කරනු ලබන කාර්මික ප්‍රදර්ශනවලට සහභාගීවී එම ප්‍රදර්ශනවලට සහභාගී වන කර්මාන්තකරුවන් සමග සම්බන්ධතාවයන් ගොඩනගා ගනියි.

**වගුව 4.4.1 - අලෙවි අංශයෙහි කාර්යසාධනය – 2015**

| කාර්ය සාධනය | ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | උපකොන්ත්‍රාත් ලබා දීම | අබලි ලෝහ ව්‍යාපෘතිය | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|
| අලෙවි වටිනාකම (රු. මි.) | 10.70 | 7.86 | 43.16 | 61.72 |
| ආදායම (රු. මි.) | 2.09 | 0.472 | 20.55 | 23.11 |
| ඇණවුම් බෙදාහැරීම | | 33 | | |
| මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.) | | | 758 | |
| බෙදා හරින ලද ප්‍රමාණය (මෙ.ටො.) | | | 706 | |
| පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 40 | 19 | 723 | |




## 4.5 කාර්මික ජනපද අංශය

කාර්මික ජනපද යනු කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද අංශය විසින් දේශීය කර්මාන්තකරුවන්ට කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරන සාදා නිම කරන ලද ගොඩනැගිලි / ඉඩම් කට්ටි ආදී කර්මාන්ත පහසුකම් දීර්ඝ කාලීන බදු පදනමින් සපයා දී ඇති ස්ථාන වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන කාර්මික ජනපද දේශීය සුළු පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා සහ වැඩි දියුණු කිරීම සඳහා වන ඵලදායි මෙවලමක් ලෙස යොදා ගෙන ඇති අතර, එම කර්මාන්තකරුවන්ට තම ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා සහ පුළුල් කිරීම සඳහා ඉතා වටිනා පහසුකමක් වී ඇත. එමෙන්ම මෙම කාර්මික ජනපද කර්මාන්ත ප්‍රවර්ධනය කර දුර බැහැර ප්‍රදේශවල සිටින කර්මාන්තකරුවන් දිරි ගැන්වීම පිණිස කාර්මික ක්‍රියාකාරකම් විමධ්‍යගත කිරීමේ ඉතා ඵලදායි මෙවලමක් බවට පත්වී ඇත.

කාර්මික ජනපද සංකල්පය 1960 දශකයේ දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද අතර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ජාතික කර්මාන්ත අවශ්‍යතා සමග සමගාමී කිරීම එහි ප්‍රධාන අරමුණ විය. කාර්මික සංවර්ධන මණ්ඩලය විශේෂයෙන් මනා කර්මාන්ත පරිසරයන් තුළ පිහිටා ඇති ප්‍රදේශවල පිහිටි, ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත ඉඩම් සහ සාදා නිම කළ ගොඩනැගිලි කර්මාන්ත කරුවන්ට සපයා දී ඇත. එම නිසා, කාර්මික යටිතල පහසුකම් සපයා දීමේදී කොළඹ හා ඒ අවට ප්‍රදේශ සහ දුර බැහැර දිස්ත්‍රික්ක අතර විශාල අසමානතාවයක් තිබෙන බැවින්, ප්‍රාදේශීය මට්ටමෙන් කාර්මීකරණය තව දුරටත් ප්‍රවර්ධනය කර කර්මාන්ත සංවර්ධන ක්‍රියාකාරකම් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය අපේක්ෂා කරයි.

ඉහළ ආර්ථික විභවතාවයක් සහිත ප්‍රදේශවල පිහිටුවා ඇති මෙම සියලුම කාර්මික ජනපද කර්මාන්ත ශාලා සමූහයකින් සමන්විත වන අතර, වර්තමානයේ ඒකල, පල්ලෙකැලේ, හොරණ, පන්නල, පානලුව ආදී ප්‍රදේශයන්හි යෝග්‍ය ස්ථානවල කාර්මික ජනපද පිහිටුවා එම ජනපදවලට අභ්‍යන්තර මාර්ග, විදුලි සංදේශ පහසුකම්, ජල සැපයුම, වැසි ජලය බැස යන කාණු පද්ධති, තෙකලා විදුලිය, වීදි ආලෝකකරණය, ආරක්ෂාව සහ තැපැල් කාර්යාල වැනි යටිතල පහසුකම් සපයා දී ඇත.

දැනට තිබෙන කාර්මික ජනපද වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට සහ අලුතින් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කර ආකර්ෂණය කර ගැනීමටත්, තම ව්‍යාපාර පුළුල් කර ගැනීම සඳහා පවතින කර්මාන්තවලට පහසුකම් සැලසීමටත් 2015/2016 කාලය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය තව දුරටත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

# කාර්මික ජනපද ව්‍යාප්තිය



**කාර්මික ජනපද අංශයට පැවරී තිබෙන කාර්යයන්**

- කාර්මික ජනපද ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා වන මූලික සමීක්ෂණ සිදු කිරීම.
- අදාළ ආයතනවලින් අවශ්‍ය අරමුදල් සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- යෝජිත හෝ පවතින කාර්මික ජනපදවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- පුරප්පාඩුවී පවතින ඉඩම් සහ ගොඩනැගිලි සඳහා නව කර්මාන්තකරුවන් තෝරා ගැනීම.
- පවතින කාර්මික ජනපද නඩත්තු කිරීම.
- ඉඩම් වෙන්කර දීමේ ලිපි නිකුත් කිරීම සහ බදුකරුවන් සමග කල්බදු ගිවිසුම් අත්සන් කිරීම.
- කුලී අය කර ගැනීම සහ දෛනික නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම.
- එකඟ වී ඇති ගිවිසුම් කොන්දේසි කඩකරන කර්මාන්තකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අනෙකුත් අංශ සහ අනෙකුත් ආයතන සමග එක්ව කර්මාන්තකරුවන් සඳහා සහාය සැපයීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අනෙකුත් අංශ විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ප්‍රදර්ශන, තරඟ සහ වැඩමුළු සඳහා දායක වීම.

2016 වර්ෂය තුළදී කාර්මික ජනපද අංශය කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික ජනපද 18 අතරින් පල්ලෙකැලේ, පානළුව, ගලිගමුව සහ පුස්සැල්ල යන කාර්මික ජනපදවල අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම, ආරක්ෂක වැට ඉදි කිරීම සහ වැසි ජලය බැස යන කාණු පද්ධති ඉදි කිරීම වැනි පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් රුපියල් මිලියන 60 ට අධික මුදලක් වියදම් කර ඇත.

එයට අමතරව, 'කඩිනම් සංවර්ධන වැඩසටහන - 2016' යටතේ කාර්මික ජනපද වල යටිතල පහසුකම් නවීකරණය කිරීම, නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම පිණිස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද අංශයට රුපියල් මිලියන 250 ක මුදලක් ප්‍රදානය කරන ලදී. ඉදිකිරීම් කටයුතු සඳහා බොහෝ විට රාජ්‍ය ඉදිකිරීම් ආයතනවල සහාය ලබා ගන්නා ලද අතර එම ව්‍යාපෘති වලින් බහුතරයක් සාර්ථක ලෙස නිම කර ඇත.

2016 වර්ෂය තුළදී කාර්මික ජනපදවල සිදු කරන ලද සංවර්ධන කටයුතු,

| අනු අංකය | ක්‍රියාකාරකම | කාර්මික ජනපදයේ නම | මුදල (රු.) |
|---|---|---|---|
| 01 | අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදිකිරීම | කළුදෑවල | 39,000,000.00 |
| 02 | • ට්‍රාන්ස්ෆෝමරයක් සවිකිරීම<br>• 2 වැනි අදියරෙහි සංවර්ධන කටයුතු | පන්නල | 2,750,000.00<br>76,670,000.00 |
| 03 | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ මාර්ග ඉදි කිරීම | හොරණ | 11,0,000.00 |
| 04 | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ ආරක්ෂක වැට ඉදිකිරීම | පල්ලෙකැලේ | 35,710,000.00 |
| 05 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම. වැසිකිලි සහ ප්‍රධාන ගේට්ටුව අලුත්වැඩියා කිරීම | කොටගල | 4,000,000.00 |
| 06 | අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදිකිරීම | පුස්සැල්ල | 5,750,000.00 |
| 07 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | පුන්තෝට්ටම් | 12,000,000.00 |
| 08 | • අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම<br>• මල අපවහන පද්ධතියේ ඉතිරි කොටස ඉදිකිරීම | ඒකල | 31,000,000.00<br>4,600,000.00 |
| 09 | • ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම<br>• 2 වැනි අදියරෙහි සංවර්ධන කටයුතු | මිහින්තලේ | 2,760,000.00<br>7,600.000.00 |
| 10 | ඉඩම එළි පෙහෙළි කිරීම සහ ආරක්ෂක වැට ඉදිකිරීම | නැගම්පහ | 5,130,000.00 |
| 11 | අභ්‍යන්තර මාර්ග, කාණු සහ ආරක්ෂක වැට ඉදිකිරීම | බුත්තල | 22,130,000.00 |
| | **එකතුව** | | **249,210,000.00** |

**කර්මාන්ත ඒකක සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම**

අලුතින් කර්මාන්ත ආරම්භ කිරීමට අපේක්ෂා කරන ව්‍යවසායකයින් සහ දැනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද වල කර්මාන්ත පවත්වාගෙන යන, එම කර්මාන්ත තව දුරටත් පුළුල් කිරීමට සැලසුම් කරගෙන සිටින කර්මාන්තකරුවන් කාර්මික ජනපදවල ඉතිරිවී තිබෙන ඉඩම් කට්ටි ලබා ගැනීමට දිරිමත් කරනු ලැබේ. ඒ අනුව ඉඩම් ලබා ගැනීමට ඉල්ලුම් කරන කර්මාන්තකරුවන් නිලධාරි මණ්ඩලයක් විසින් ඇගයීමක් සිදු කර, වර්ෂය තුළ දී එසේ තෝරා ගත් කර්මාන්ත පිළිබඳ විස්තර සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

**වෙන් කර දෙන ලද කර්මාන්ත ඒකක සහ යෝජිත ආයෝජන සහ යෝජිත රැකියා සංඛ්‍යාව - 2016**

| අංකය | කාර්මික ජනපදය | කර්මාන්තයේ නිෂ්පාදන භාණ්ඩ | යෝජිත ආයෝජනය (රු./මි.) | යෝජිත රැකියා සංඛ්‍යාව (සංඛ්‍යාව.) |
|---|---|---|---|---|
| 1 | කළුදැවල | දැව ගෘහ භාණ්ඩ | 10 | 33 |
| 2 | | මැකා පිටි | 12 | 13 |
| 3 | පන්නල | ලුහු ඉංජිනේරු | 2 | 10 |
| 4 | | ගිනිපෙට්ටි | 22.2 | 50 |
| 5 | | ඇසුරුම්කරන ද්‍රව්‍ය | 14 | 10 |
| 6 | | පොල්තෙල් | 8.8 | 21 |
| 7 | | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 15 | 18 |
| 8 | | රේඩියේටර් | 60 | 15 |
| 9 | | වානේ ආශ්‍රිත නිෂ්පාදන | 119 | 16 |
| 10 | ඒකල | රෙදිපිළි | 38 | 25 |
| 11 | පල්ලෙකැලේ | වාහන පිළිබඳ කොටස් එකලස් කිරීම | 90.8 | 28 |
| 12 | | සෙවිලි තහඩු | 34 | 47 |
| 13 | | ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන | 35 | 20 |
| 14 | | ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන | 90.8 | 28 |
| 15 | | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 25 | 25 |
| 16 | | කෘෂිකාර්මික උපකරණ | 7.7 | 20 |
| 17 | වවුනියාව | නැවත පුරවන ලද ටයර් | 3 | 15 |
| 18 | පානළුව | ඇදෙනසුලු පොලිතින් | 4 | 18 |
| 19 | | රබර් ආශ්‍රිත නිෂ්පාදන | 2.9 | 20 |
| 20 | | රබර් ආශ්‍රිත නිෂ්පාදන | 7.3 | 12 |
| 21 | හොරණ | පිරිසිදු කාරක ද්‍රව්‍ය | 4 | 10 |
| 22 | මිහින්තලේ | තිරුවාණ ගල් ආශ්‍රිත නිෂ්පාදන | 14.1 | 20 |
| 23 | පුස්සැල්ල | තේ ඇසුරුම්කරණ කර්මාන්ත | 18 | 10 |
| 24 | ලුණුවිල | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 7 | 10 |
| | **එකතුව** | | **644.6** | **494** |

**2016 වර්ෂය තුළදී කාර්මික ජනපද තුළ ආරම්භ කරන ලද කර්මාන්ත වලින් කළ ආයෝජනය, රැකියා අවස්ථා සංඛ්‍යාව සහ නිෂ්පාදනය**

| අංකය | කාර්මික ජනපදය | සාදනු ලබන නිෂ්පාදනය | රැකියා සංඛ්‍යාව (සංඛ්‍යාව.) | ආයෝජනය (රු./මි.) |
|---|---|---|---|---|
| 1 | කළුඳැවල | දැව ගෘහ භාණ්ඩ | 5 | 4.7 |
| 2 | පන්නල | ලුහු ඉංජිනේරු | 10 | 2 |
| 3 | ඒකල | ඇසුරුම්කරන ද්‍රව්‍ය | 20 | 10.1 |
| 4 | | ඇසුරුම්කරන ද්‍රව්‍ය | 15 | 12 |
| 5 | පල්ලෙකැලේ | දහන ඉන්ධන සඳහා ලී කුඩු ගඩොල් | 29 | 10 |
| 6 | | සෙවලි තහඩු | 10 | 22 |
| 7 | | ප්ලාස්ටික් නිෂ්පාදන | 22 | 3.9 |
| 8 | | ප්ලාස්ටික් නිෂ්පාදන | 12 | 32.2 |
| 9 | | ගිනිපෙට්ටි | 80 | 66.8 |
| 10 | | ආහාර ආශ්‍රිත නිෂ්පාදන | 11 | 2.5 |
| 11 | | ප්ලාස්ටික් නිෂ්පාදන | 24 | 11 |
| 12 | වවුනියාව | නැවත පුරවන ලද ටයර් | 7 | 1.5 |
| 13 | පානළුව | ඇසුරුම්කරණ ද්‍රව්‍ය | 31 | 25 |
| 14 | | ඇදෙනසුලු පොලිතින් | 15 | 4 |
| 15 | හොරණ | ප්ලාස්ටික් සහ රබර් නිෂ්පාදන | 75 | 150 |
| **එකතුව** | | | **366** | **357.7** |

**කල්බදු ගිවිසුම් අත්සන් කිරීම**

කර්මාන්තකරුවන් තෝරා ගැනීමෙන් අනතුරුව එම කර්මාන්ත සඳහා ඉඩම් කට්ටි වෙන්කර දීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් එම කර්මාන්ත වල කාර්ය සාධනය පරීක්ෂා කර බලා ඒ අනුව වසර 30 ක කාලයක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කරනු ලැබේ. එයට අමතරව පවතින කර්මාන්තවල ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක වීම සමාලෝචනය කර තවත් වසර 30 ක කාලයක් සඳහා කල්බදු ගිවිසුම් නැවත අලුත් කරනු ලැබේ. 2016 වර්ෂය තුළදී එලෙස අදාළ කර්මාන්ත කරුවන් සමග කල්බදු ගිවිසුම් 19 ක් අත්සන් කරන ලද අතර ඒ තුළින් රුපියල් මිලියන 0.25 ක මුදලක් උපයාගෙන ඇත.

**කුලී ආදායම් අය කර ගැනීම**

2016 වර්ෂය තුළදී මාසික/වාර්ෂික කුලිය, ජල ගාස්තු, හිඟ මුදල් අය කර ගැනීම සහ බදු දී ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා ආදායම් මාරු කිරීම මගින් අයකර ගන්නා ලද මුදල රුපියල් මිලියන 65.7 ක් වූ අතර එය කුලිකරුවන්ගෙන් ඉන්වොයිස්ගත මුළු ආදායමෙන් 90% ට ආසන්න ප්‍රමාණයක් විය. බදුකරුවන්ගෙන් ආපසු ගෙවනු ලබන වසර තුනක තැන්පතු ආකාරයෙන් අය කර ගන්නා මුදල වෙනුවෙන් චක්‍රීය අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ. 2016 වර්ෂය අවසානය වන විට එම චක්‍රීය අරමුදලෙහි එකතු වී තිබුණු මුදල රුපියල් මිලියන 7.6 ක් වේ.

## 4.6 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත කර්මාන්ත වලට සහාය වීම පිණිස 1980 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය පෑලියගොඩ ස්ථාපිත කරන ලදී. රබර් ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන කර්මාන්තකරුවන් 200 ට ආසන්න පිරිසක් දීර්ඝ කාලයක් පුරා මෙම මධ්‍යස්ථානයෙහි නිත්‍ය සේවාදායකයින් ලෙස සිටින අතර ඔවුන් නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ පහසුකම්, ව්‍යාප්ති සහ උපදේශක සේවා, ගැනුම්කරුගේ ඉල්ලීම අනුව ස්වභාවික සහ කෘතිම රබර් සංයෝග කිරීම සහ රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් සැකසුම්කාරක සිල්ලර වශයෙන් අලෙවි කිරීම වැනි සේවාවන් ලබා ගනිති.

මෙම මධ්‍යස්ථානයෙහි 2016 වර්ෂයේ කාර්ය සාධනය පහත සඳහන් පරිදි වේ.

**මධ්‍යස්ථානය විසින් සපයා දෙන ලද සේවාවන්**

| | සේවාව | මිනුම් දර්ශකය | සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | තාක්ෂණය ලබාදීම | සේවා දායකයින් සංඛ්‍යාව | 23 |
| (ආ) | පරීක්ෂණ පහසුකම් (අපනයන වෙළෙඳපොළ සඳහා රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ට සපයා දුන් පරීක්ෂණ පහසුකම් ද මෙයට ඇතුළත් වේ) | වැඩ සංඛ්‍යාව | 131 |
| (ඇ) | උප කොන්ත්‍රාත් අවස්ථා | වැඩ සංඛ්‍යාව | 12 |
| (ඈ) | නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගීකරණය | වැඩ සංඛ්‍යාව | 26 |
| (ඉ) | තාක්ෂණික උපදේශක සේවා | සංඛ්‍යාව | 46 |

2016 වර්ෂය තුළදී සිදු කරන ලද සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, තත්ත්ව වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම් කටයුතු වල සාරාංශය පහත සඳහන් පරිදි වේ:

**සංවර්ධන ක්‍රියාකාරකම්**

| | | | |
|---|---|---|---|
| **(අ)** | **සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම** | | |
| | **ඉටු කරන ලද විශේෂ නිෂ්පාදන වැඩ** | **ප්‍රමාණය** | **වටිනාකම (රු.)** |
| i | ඩිෆ්‍යුසර් | 2 යි. | |
| ii | වැක්‍යූම් බ්‍රේක් හෝස් දෙමටගොඩ | 200 යි. | |
| iii | බ්‍රේක් සිල්න්ඩර් බූට්ල දෙමටගොඩ | 50 යි. | |
| iv | ඔනන් කමින්ස් ජෙනරේටර් සඳහා මවුන්ටිං ෂූ | 16 යි. | |
| v | ටයර් ට්‍රෙඩ් | කි.ග්‍රෑ. 80 | |
| vi | ප්‍රෙෂර් ස්විච් ඩයෆ්‍රම්, දෙමටගොඩ | 100 යි. | 1,100,000.00 |
| vii | ගියර් බොක්ස් කප්ලිං | 8 යි. | |
| viii | ජලාපවහන නළ සඳහා සීලිං රින්ග්, කඩවත | කි.ග්‍රෑ. 60 | |
| ix | බැවුම් දොර සඳහා රබර් බීඩිං | අඩි 200 | |
| x | ටයර් රොඩ් කෙළවර සඳහා බුෂ් | 200 යි. | |
| **(ආ)** | **ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම්** | | |
| | **විශේෂ නිෂ්පාදන** | **සංඛ්‍යා** | |
| i | ටයර් ට්‍රෙඩ් | 70 | |
| ii | ඝන ටයර් | 05 | |
| iii | රබර් බීඩිං ෆෙන්ඩර් | 03 | |
| iv | තෙල් ප්‍රතිරෝධී ආක්ෂක සපත්තු | 10 | |
| v | එක්සර්සයිසස් රබර් බෑන්ඩ් | 01 | |
| vi | රබර් මවුන්ට් | 07 | |
| vii | ලේටෙක්ස් ග්ලවුස් | 06 | |
| **(ඇ)** | **සු.ම.ක. සඳහා සපයා දුන් ක්‍රියාවලි සංවර්ධනය කිරීම්** | | |
| i | නියෝප්‍රීන් රබර් සීල් | | |
| ii | රබර් “ඕ” රින්ග් | | |
| iii | වැසි මවුන්ට් | | |
| iv | රබර් සකර් | | |
| v | ඊ.පී.ඩී.එම්. සීල් | | |
| vi | රබර් හෝස් | | |
| vii | ගැස්කට් සඳහා රබර් රින්ග් | | |
| viii | තරාදි මවුන්ට් | | |
| ix | එයාර් සීල් නොබ් | | |
| x | වයිබ්‍රේෂන් රබර් ක්ලිප් | | |
| xi | රික්ලේම් රබර් කම්පවුන්ඩ් | | |
| xii | හෙඩ් කැප් සීල් බවුසර් | | |

මෙම මධ්‍යස්ථානය විසින් නව කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කිරීම පිණිස සහ දැනට සිටින කර්මාන්තකරුවන් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නිරූපණ වැඩසටහන් 23 ක් පවත්වා ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනයෙහි සහාය ඇතිව රබර් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් සඳහා රසායනාගාර ප්‍රායෝගික පන්ති පවත්වා ඇත.

මෙම මධ්‍යස්ථානය වර්ෂය සඳහා නියමිත ඉලක්ක සපුරා ගනිමින් මනා ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර මෙම වර්ෂය තුළ දී තාක්ෂණික සහ වාණිජ මෙහෙයුම් වලින් උපයාගත් වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිත ආදායම රුපියල් මිලියන 20.5 ක් විය.

භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීම - 2016

| | ප්‍රමාණය | අලෙවි වටිනාකම (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| රබර් සංයෝග විකිණීම - කි.ග්‍රෑ. | 29,802.46 | 13,931,715.68 | |
| නැවත ඇඹරීම ද ඇතුළුව ඇඹරුම් ගාස්තු - කි.ග්‍රෑ. | 15,789.10 | 304,205.19 | |
| සංයෝග කරන ලද රබර් කිරි (L3) - ගැලුම් | 2,069.07 | 2,492,306.98 | |
| කේන්ද්‍රාපසාරී රබර් කිරි ( C.Latex) - ගැලුම් | 565.00 | 568,896.74 | |
| රසායනික ද්‍රව්‍ය – කි.ග්‍රෑ. | 2,127.19 | 600,630.73 | |
| කෙමිලොක්– ලීටර් | 28.15 | 311,853.85 | |
| පොලිතින් – කි.ග්‍රෑ. | 300.15 | 101,931.30 | |
| විසරණය - කි.ග්‍රෑ. | 596.30 | 256,012.70 | |
| | | | 18,512,039.90 |
| **සේවා** | | | |
| **i.** ව්‍යාප්ති හා උපදේශක සේවා | | 1,104,214.91 | |
| **ii.** තත්ත්ව පාලන සහ රසායනාගාර පරීක්ෂණ | | 808,763.06 | |
| **iii.** නිෂ්පාදන සංවර්ධන | | 90,153.10 | 1,986,585.47 |
| **එකතුව** | | | **20,498,625.37** |
| ජාතිය ගොඩනැගීමේ බදු **2%** | | | 433,871.14 |
| වැට් බදු **15%** | | | 2,286,141.49 |
| බදු සහිත මුළු ආදායම | | | **23,218,638.00** |



## 4.7 ඉංජිනේරු අංශය

ඉංජිනේරු අංශයෙහි විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ.

(අ). කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළ, වාත්තු වැඩපොළ, පරීක්ෂණ රසායනාගාරය, ඉංජිනේරු කාර්යාලය (තාක්ෂණික තොරතුරු සහ උපදේශක සේවා, සහ තක්සේරු වාර්තා ආදිය සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු යන අංශ මෙයට අයත් වේ.

(ආ). විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පෑලියගොඩ

(ඇ). යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - පන්නල

(ඈ). පොදු සේවා මධ්‍යස්ථානය - මාතර

(ඉ). පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව

**මෙම අංශය විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම්**

(අ). දැනට සිටින කර්මාන්තකරුවන්ට සහ නව කර්මාන්තකරුවන්ට / අනාගත කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර තෝරා ගැනීමේදී, සැලසුම් කිරීමේදී / සංවර්ධනය කිරීමේදී සහාය ලබා දීම සහ තාක්ෂණය / ක්‍රියාවලි පිළිබඳ දැනුම ලබා දීම.

(ආ). ඉල්ලීම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු කිරීම්, සහ ලෝහ නිමා කිරීම් සේවා සැපයීම.

(ඇ).මණ්ඩලය වෙත සිවිල් සහ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රවල අභ්‍යන්තර අළුත්වැඩියා, නඩත්තු / ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් සැලසුම්කරණ සහ අධීක්ෂණ සහාය සපයා දීම සහ මණ්ඩලයෙහි වාහන නඩත්තු අවශ්‍යතාවලදී තාක්ෂණික සහ අධීක්ෂණ සහාය ලබා දීම.

(ඈ). කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ප්‍රදර්ශන සහ ව්‍යාපෘති සඳහා සිවිල් සහ විදුලි ඉංජිනේරු උපකාරක සේවා සැපයීම.

(ඉ). ඉල්ලීම මත වාත්තු වැඩ අංශය සඳහා යන්ත්‍රෝපකරණ, තක්සේරු වාර්තා සහ විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම මෙන්ම පිරිසැකසුම් සහ ඉංජිනේරු පට්ටල් සේවා සපයා දීම මෙම අංශය විසින් ඉටුකරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

(ඊ). කර්මාන්ත සඳහා පිරිමැසුම් සහිත සහ යෝග්‍ය යන්ත්‍ර සූත්‍ර මූලාකෘතික සකස් කිරීම.

**2016 වර්ෂයේ කාර්යසාධනය**

**i. ගාස්තු අයකරන සේවා, තක්සේරු, වාත්තු වැඩ / විද්‍යුත් ලෝහාලේපන රසායනාගාර සේවා, උපකරණ සහ විවිධ අයිතම අලෙවි කිරීම මගින් ලැබුණු ආදායම**

විවිධ අංශ සහ මධ්‍යස්ථාන විසින් 2016 වර්ෂය තුළ ඉටු කරන ලද බාහිර සේවා මගින් උපයාගත් ආදායම පහත වගුවේ දක්වා ඇත:

වගුව: 2016 වර්ෂයේදී ඉටුකරන ලද සේවාවන් සඳහා බාහිරින් උපයාගත් ආදායම

| අනු අංකය | අංශය | දළ ආදායම (රු.) (වැට් සහ ජා.ගො.බ. හැර) |
|---|---|---|
| 1 | ඉංජිනේරු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද, යෝ.තා.ප.සං.ම., පො.සේ.ම. සහ පිත්තල භාණ්ඩ මධ්‍යස්ථානය | 1,239,833 |
| 2. | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 6,771,443 |
| 3. | තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය | 2,726,931 |
| 5. | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම / බෙදා හැරීම සහ අලෙවි කිරීම | 15,326,874 |
| 6. | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ | 1,927,791 |
| **7.** | කර්මාන්ත සඳහා සුදුසු අමුද්‍රව්‍ය සපයා දීම | 77,329 |
| 8. | අමුද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය ආදිය සපයා දීම | 409,614 |
| 9 | උපදේශක සේවා සපයාදීම | 32,617 |
| 10 | රසායනාගාර පරීක්ෂණ වාර්තා සපයා දීම | 11,200 |
| 11 | ව්‍යවසායකයින් සහ වෘත්තිකයින් සඳහා පුහුණුව සපයා දීම | 15,900 |
| 12 | තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් පැවැත්වීම | 29,000 |
| | **එකතුව** | **28,568,532** |

**ii. අභ්‍යන්තර සේවා**

විවිධ අංශ මගින් සපයාදෙන ලද අභ්‍යන්තර ඉංජිනේරු සේවා වැඩවල වටිනාකම (සේවා පිරිවැය පදනමින්) පහත සඳහන් පරිදි වේ :

| අනු අංකය | අංශය | සපයා දෙන ලද අභ්‍යන්තර සේවාවල වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | කම්හල - ප්‍රධාන කාර්යාලය | 9481 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 1,093045 |
| 3 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 3049861 |
| 4 | විදුලි ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 216660 |
| | සැපයූ අභ්‍යන්තර සේවාවල මුළු වටිනාකම | **4,369,047** |

**iii. උපදේශක / ව්‍යාප්ති සේවා:**

**උපදේශක සේවා:**

2016 වර්ෂයෙහි කර්මාන්තකරුවන් වෙත නිර්මාණ සහ පිරිසැකසුම් කිරීම පිළිබඳ තාක්ෂණික / ක්‍රියාවලි තොරතුරු සහ උපදෙස් ලබා දෙමින් උපදේශක සේවා 21 ක් සපයා දී ඇත.

## iv. යන්ත්‍ර සූත්‍ර / උපකරණ / ක්‍රියාවලි සංවර්ධනය

2016 වර්ෂයෙහිදී ඒකල පිහිටි යෝග්‍ය තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙහිදී කොම්පෝස්ට් පැලටයිසර් යන්ත්‍රයක් අලුතින් නිර්මාණය කර සකස් කරන ලදී. දිවිනැගුම වැඩසටහන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විදුලි සකපෝරු 264 ට වැඩි සංඛ්‍යාවක් නිෂ්පාදනය කරන ලදී.



**කොම්පෝස්ට් පැලටයිසර් යන්ත්‍රය**

## 4.8 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය

පේෂකර්ම සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 1989 දෙසැම්බර් 15 වැනි දින විශේෂ පුහුණු අංශයක් ලෙස ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය පුහුණු අංශය, පුස්තකාලය සහ තොරතුරු අංශය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ මුද්‍රණ අංශය යන අංශ හතරෙන් සමන්විත වේ.
කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව රට පුරා සිටින ව්‍යවසායකයින්ට විවිධ පුහුණු සපයා දීම පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි දියුණු කර, ඒවා ප්‍රවර්ධනය කර සංවර්ධනය කිරීම පිණිස පුස්තකාල සහ තොරතුරු ඒකකය මගින් පුස්තකාල පහසුකම් සහ කාර්මික තොරතුරු සපයා දෙනු ලැබේ. මෙම අංශය යටතේ ඇති තොරතුරු තාක්ෂණ ඒකකය මණ්ඩලය ඇතුළත ජාලගත සහ තොරතුරු පහසුකම් සපයා දෙමින් වෙබ් අඩවිය යාවත්කාලීන කර සංවර්ධනය කරයි. මුද්‍රණ ඒකකය විසින් වාර්තා, අත්පොත්, අත්පත්‍රිකා ආදිය ඇතුළත්ව අවශ්‍ය සියලුම ලිපි ලේඛන මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානයෙහි අරමුණු:**

- නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම
- පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වා දීම
- පුහුණුලාභීන් පුහුණු කිරීම (ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්වය)
- දේශීය කර්මාන්තකරුවන්ට තාක්ෂණික දැනුම සහ ව්‍යාපාරික අත්දැකීම් සපයාදීම.
- කාලීන වශයෙන් වැදගත් වන ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් දැනුවත් කිරීම
- උපදේශණ සේවා සහ කාර්මික තොරතුරු සපයාදීම

## ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2016

| ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම් | මිනුම් දර්ශකය | සාධනය | ආදායම (රු.) |
|---|---|---|---|
| ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 07 | 394,500 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 170 | |
| විෂයමාලා සංවර්ධනය | විෂයමාලා සංඛ්‍යාව | 07 | - |
| වාණිජ සහ තාක්ෂණ පුහුණුව සපයා දීම | වැඩසටහන් සංඛ්‍යාව | 15 | 1,047,340 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 300 | |
| උපදේශණ සහ උපදේශක | සේවා සපයන්නන් සංඛ්‍යාව | 50 | - |
| පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම | පුස්තකාල පොත්පත් සංඛ්‍යාව | 1077 | |
| දත්ත සංචිත පවත්වාගෙන යාම (මාර්ගගත / යන්ත්‍ර සූත්‍ර/ග්‍රන්ථ නාමාවලි) | වාර්තා සංඛ්‍යාව | 3121 | |
| අන්තර්ජාලය හරහා සේවාදායකයින් ලියාපදිංචි කිරීම | සේවා දායකයින් සංඛ්‍යාව | 2700 | |
| **කර්මාන්ත තොරතුරු බෙදා හැරීම** | | | **352,624** |
| සේවාදායකයින්ගෙන් ලැබුණු විමසීම් ඉටු කර දීම | සේවාදායකයින් සංඛ්‍යාව | 1322 | |
| **ප්‍රකාශන සම්පාදනය කිරීම** | | | |
| අලුතින් ලැබුණු ප්‍රකාශන | අලුතින් ලැබුණු ප්‍රකාශන සංඛ්‍යාව | 12 | |
| පුවත් සඟරා | පුවත් සඟරා සංඛ්‍යාව | 4 | |
| කාලීන අන්තර්ගත | අන්තර්ගත සංඛ්‍යාව | 12 | |
| නව නිෂ්පාදන ගොනු | නිෂ්පාදන ගොනු සංඛ්‍යාව | 12 | |
| **කර්මාන්ත තොරතුරු සඳහා කා.සං.ම. වෙබ් අඩවිය හරහා විද්‍යුත් ප්‍රචාරණය** | | | |
| අලුතින් ලැබුණු ප්‍රකාශන | අලුතින් ලැබුණු ප්‍රකාශන සංඛ්‍යාව | 04 | |
| පුවත් සඟරා | පුවත් සඟරා සංඛ්‍යාව | 12 | |
| කාලීන අන්තර්ගත | අන්තර්ගත සංඛ්‍යාව | 12 | |
| **වෙබ් පිටු නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම** | | | |
| නව වෙබ් පිටු සංඛ්‍යාව | අන්තරගත පිටු සංඛ්‍යාව | 64 | |
| යාවත්කාලීන කළ වෙබ් පිටු සංඛ්‍යාව | ලිපි ලේඛන සංඛ්‍යාව | 130 | |

## 4.9 තාක්ෂණ සේවා අංශය

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රජාවෙහි තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරා දීමට කටයුතු කරන තාක්ෂණික සේවා අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අංශ වලින් එකක් වේ. කර්මාන්තකරුවන්ට තාක්ෂණික සහාය සපයා දීම තාක්ෂණ සේවා අංශයෙහි මූලික අරමුණ වේ. එයට අමතරව පවතින ව්‍යාපාර පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කරන තාක්ෂණ සහාය සපයා දීම ද මෙම අංශයෙහි අනෙකුත් අරමුණ අතර වේ. තාක්ෂණ සේවා අංශය මගින් සපයනු ලබන සේවාවන් ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන උප අංශ පහ හරහා සපයනු ලබයි. තාක්ෂණ සහාය සපයා දීම ප්‍රධාන වශයෙන්ම මනාව සැලසුම් කරන ලද ප්‍රායෝගික අංගයක් ද සහිත තාක්ෂණය සපයා දීමේ වැඩමුළු හරහා සිදු කරනු ලැබේ.

- **සේවාදායකයින්ගේ අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

**ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි තාක්ෂණ සේවා අංශය මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි සිටින කර්මාන්තකරුවන් සඳහා “ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වීමේ සහ දැනුවත් කිරීමේ සැසිය” පිළිබඳ වැඩමුළුව 2010 අගෝස්තු 31 වැනි දින රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත විසින් ඉදිරිපත් කරනු ලබන හරිත වාර්තා සනාථ කිරීමේ සහ මැන බැලීමේ හැකියාව ඇති බාහිර ආයතන වලින් එකක් වේ. මෙම වැඩසටහනට කර්මාන්තකරුවන් 45 දෙනෙකු සහභාගී වූ අතර ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා සමාගම් 28 ක් ලියාපදිංචි වූහ. තවද මෙම වැඩසටහන තුළින් කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ට ද දැනුවත්භාවය ලබා දෙන ලදී.

මෙම සැසිය අතරතුරදී තිරසර පරිභෝජන සහ නිෂ්පාදන ප්‍රවේශයක් අනුගත කර ගැනීමේ අවස්ථා, තිරසර පරිභෝජන සහ නිෂ්පාදන ප්‍රවේශය සඳහා පෞද්ගලික අංශයෙහි කාර්ය භාරය, අපද්‍රව්‍ය ශුන්‍ය සංකල්පය, පරිසර ආරක්ෂණ බලපත්‍රයෙහි වැදගත්කම සහ ජාතික හරිත වාර්තාකරණය සඳහා මාර්ගෝපදේශ යන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

- **පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන**

පිළියන්දල අධ්‍යාපන කොට්ඨාසයෙහි ගුරුවරුන් 32 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා 2016 නොවැම්බර් 28 වැනි දින මෙම පුහුණු වැඩසටහන පවත්වන ලදී.

- **කාර්මික සහතික පත්‍ර පාඨමාලා සඳහා පුහුණු වැඩසටහන්**

**“පරිගණක දෘඩාංග සහ ජාලකරණය” පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

තරුණ ව්‍යවසායකයන් සඳහා “පරිගණක දෘඩාංග සහ ජාලකරණය” පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා තුනක් 2016 වර්ෂය තුළදී පවත්වා නිමකරන ලදී.



**පිංතූරය 4.9.1 - පරිගණක දෘඩාංග විද්‍යාගාරය**

- **"අතින් සාදනු ලබන කඩදාසි තාක්ෂණය" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

  අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය, මාතර, විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට අනුව යටියන පිහිටි අතින් සාදනු ලබන කඩදාසි කර්මාන්ත ශාලාවක සේවකයින් සඳහා "අතින් සාදන කඩදාසි තාක්ෂණය" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් 2016 ජූනි 20 වැනි දින සිට 24 වැනි දින දක්වාත්, 2016 ජූනි 27 වැනි දින සිට ජූලි 01 වැනි දින දක්වාත් පවත්වන ලදී.

- **නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු**

  ස්වභාවික සීනි ආදේශක සහ ගොටුකොළ පිටි යොදා ගනිමින් ශාකසාරමය මදුරුවන් පලවා හැරීමේ ජෙලි කැට නිෂ්පාදනය කිරීම සඳහා විද්‍යාගාර අත්හදා බැලීම් සිදු කරන ලදී.

- **තාක්ෂණය ලබාදීමේ වැඩමුළු සහ නිරූපණ වැඩසටහන් පැවැත්වීම**

  **වැඩමුළු;**

  ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩමුළු 87 ක් පවත්වන ලද අතර එම වැඩසටහන් වලට ව්‍යවසායකයින් 1914 දෙනෙකු සහභාගී වූහ.



**පිංතූරය 4.9.2 - තාක්ෂණය ලබා දීමේ වැඩමුළු**

**නිරූපණ වැඩසටහන්,**

ව්‍යවසායකයින් 15 දෙනා බැගින් වූ කණ්ඩායම් සඳහා තාක්ෂණය ලබාදීමේ නිරූපණ වැඩසටහන් 5ක් පවත්වන ලදී.

**විශේෂ උපදේශක සේවා සපයා දීම,**

මෙම වර්ෂය තුළ දී පෞද්ගලික ව්‍යවසායකයින් සඳහා විශේෂ උපදේශක සේවා සපයා දෙන ලදී. එයට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂඥයෙකු විසින් පහත සඳහන් තාක්ෂණය ලබාදීමේ එක් දින වැඩමුළු පවත්වන ලදී:

- ක්ෂණික කේක් මිශ්‍රණය
- ක්ෂණික තෝසෙ සහ වඩේ මිශ්‍රණය
- ක්ෂණික ආප්ප මිශ්‍රණය

2016 වර්ෂයෙහිදී අංශය විසින් උපයාගත් ආදායම

| අංකය | ක්‍රියාකාරකම | ආදායම (රු.) |
|---|---|---|
| 01 | තාක්ෂණය ලබා දීමේ වැඩමුළු | 4,815,585.00 |
| 02 | නිෂ්පාදන නිදර්ශන | 33,500.00 |
| 03 | විශේෂ උපදේශක සේවා | 5,500.00 |
| 04 | සහතික පත්‍ර පාඨමාලා | 708,600.00 |
| 05 | බෝරෝන් පිරියම් ද්‍රාවණය අලෙවි කිරීම | 33,250.00 |
| 06 | හරිත වාර්තා සනාථ කිරීම | 6,000.00 |
| | **මුළු ආදායම** | **5,602,435.00** |



## 4.10 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් කටුබැද්දෙහි පිහිටා ඇති එහි ප්‍රධාන මධ්‍යස්ථානයෙහිදී සහ වාරියපොළ සහ විතාරන්දෙනිය යන නගරවල ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථානවලදී කෙටි කාලීන සහ දිගු කාලීන පාඨමාලා පැවැත්වීම, ශ්‍රමිකයන් පුහුණු කිරීම, සුදුසු තාක්ෂණික තොරතුරු සපයා දීම, සහ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම ආදී සේවාවන් සපයා දෙනු ලබයි.

**මෙම මධ්‍යස්ථානය මගින් සපයා දෙනු ලබන සේවාවන් පහත සඳහන් පරිදි වේ.**

- පාවහන් පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීම
- සම්භාණ්ඩ පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම
- නව නිෂ්පාදන සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නවෝත්පාදන අදහස් සහ තොරතුරු සපයා දීම
- වෙළඳ සහ යන්ත්‍ර සූත්‍ර තොරතුරු සපයා දීම
- මූලික අවදානම අඩු කිරීම සඳහා සහනදායී මිල ගණන් යටතේ සේවා සපයා දීම
- කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රමය සපයා දීම
- පුහුණු සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
  - සැලසුම් සහ මෝස්තර සකස් කිරීම
  - පාවහන්වල ඉහළ වැස්ම
  - සම් කැපීම
  - කාන්තා පාවහන් නිෂ්පානය
  - පිරිමි පාවහන් නිෂ්පාදනය
  - සම් භාණ්ඩ නිෂ්පාදනය

**මධ්‍යස්ථානයෙන් පහත සඳහන් පහසුකම් ලබා ගත හැක.**

- සම් කැපීමේ යන්ත්‍රය
- පැලුම් යන්ත්‍රය
- සම් පටි කැපීමේ යන්ත්‍රය
- හැඩ කැපීමේ යන්ත්‍රය
- සම්පීඩකය සහ දියර විදීමේ කාමරය
- ඔප කිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍රය
- පාවහන්වල අඩිය තද කිරීමේ යන්ත්‍රය
- ප්‍රතික්‍රියක යන්ත්‍රය

### මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ක්‍රියාකාරකම්

රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල අරමුදල් සැපයීම යටතේ පහත සඳහන් දිස්ත්‍රික්කවලදී පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් පවත්වන ලදී. අම්පාර, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, හම්බන්තොට, යාපනය, මාතර, මඩකලපුව, පොළොන්නරුව සහ වවුනියාව. මෙම පුහුණු වැඩසටහන් වලින් බොහොමයක් ප්‍රාදේශීය සංවර්ධන අංශයෙහි සම්බන්ධීකරණය යටතේ පවත්වන ලදී.

1. රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල මූල්‍ය සහාය යටතේ දිවයින පුරා සිටින ව්‍යවසායකයින් 311 දෙනෙකු සඳහා සේවකයින්ගේ හැකියා වැඩි දියුණු කිරීම සහ ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම පිළිබඳ වැඩසටහන් 15 ක් පවත්වන ලද අතර ඒ තුළින් රු. 2,184,638 ක ආදායමක් උපයා ගන්නා ලදී.

2. පාවහන් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කටයුතු කරන ව්‍යවසායකයින් 94 දෙනෙකු සඳහා පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම, සහ නිෂ්පාදන ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩසටහන් ආදී ඉල්ලීම් අනුව පවත්වන ලද පුහුණු වැඩසටහන් 07 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් හරහා පාවහන් නිෂ්පාදන ක්ෂේත්‍රයට නවීන මෝස්තර සැකසීමේ සහ පාවහන් නිර්මාණය කිරීමේ තාක්ෂණික කුසලතාවයෙන් පිරිපුන්, ඉහළ නිපුණතාවයෙන් යුත් නිර්මාණ ශිල්පීන් 32 දෙදෙනෙකු සපයා දීමට මෙම අංශයට හැකි වූ අතර එම වැඩසටහන් තුළින් උපයාගත් ආදායම රු. 539,000 ක් විය.
පාවහන් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් 85 දෙනෙකු සඳහා පාවහන් සහ සම්භාණ්ඩ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් 10 ක් පවත්වා එම කර්මාන්තකරුවන්ගේ දැනුම වැඩි දියුණු කරන ලදී.

3. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව විවිධ කමිටුවල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගීවී මණ්ඩලයෙහි දායකත්වය සපයා දී ඇත. මෙම උපදේශක කමිටු විසින් මෙරට පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

4. විවිධ රාජ්‍ය ආයතනවල පාවහන් සහ සම්භාණ්ඩ අවශ්‍යතා මිලදී ගැනීමේදී ඒවායෙහි තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහභාගී විය.

5. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වන ලද පාසල් සිසුන්ට සපත්තු පරිත්‍යාග කිරීමේ ජාතික වැඩසටහන් ක්‍රියාවලියෙහි දී තාක්ෂණික අංශයෙන් සහාය සපයා දී ඇත.

6. දෘශ්‍ය සහ රංග කලා විශ්ව විද්‍යාලයෙහි සහ මොරටුව විශ්ව විද්‍යාලයෙහි මෝස්තර නිර්මාණය හදාරන විශ්වවිද්‍යාල සිසුන් ගේ කාර්මික පළපුරුද්ද සහිත ප්‍රායෝගික ව්‍යාපෘති සිදු කිරීම සඳහා එම සිසුන්ට අවශ්‍ය පහසුකම් සපයා දෙන ලදී. මෙය තරුණ උපාධිධාරීන් මෙම අංශයට ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී වී ඇත.

7. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබ පාවහන් කර්මාන්ත ආරම්භ කිරීමට උනන්දුවෙන් සිටින ව්‍යවසායකයින්ට මූලික අවදානම අඩු කර ගැනීම සඳහා සහනදායි පහසුකම් සපයා දී ඇත. එසේ පහසුකම් සැලසීම ව්‍යවසායකයින්ගේ මූලික ආයෝජනයෙහි අවදානම අඩුකිරීමට සහ අලෙවි කිරීම සඳහා නිෂ්පාදන සංවර්ධනය කිරීමට උපකාරී විය.

8. ශ්‍රී ලංකාවෙහි සිටින පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින් සහ පුහුණු ආයතන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම.

9. වෙන්ගලොවෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය සහාය යටතේ වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල කාන්තාවන් සඳහා තල් කොළ සහ ස්වභාවික සම් මිශ්‍ර බෑග් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. සංචාරකයින් සඳහා ආකර්ෂණීය භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ ඒවායේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම මෙම පුහුණු වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ විය.

10. සේවයෙන් විශ්‍රාම ලැබීමට ආසන්නව සිටින ශ්‍රී ලංකා යුද හමුදාවේ සෙබළුන් සඳහා වැඩමුළු සහ ක්ෂේත්‍ර සංචාර සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) එම සෙබළුන්ගේ වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම.

(ආ) පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි රැකියා අවස්ථා සපයා දීම.

(ඇ) ඔවුන්ගේ මාසික ආදායම වැඩි කිරීම; සහ

(ඈ) තමන්ගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම.

11. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි අරමුදල් සැපයීම යටතේ වාතිරි පාවහන් ගම්මානයේ ව්‍යවසායකයින්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර වවුනියාව වෘත්තීය පුහුණු අධිකාරියේ ශිෂ්‍යයින් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීමට පහසුකම් සලසන ලදී.

12. අම්පාර දිස්ත්‍රික්කයේ විශේෂ ආධාර ලබන පුරවැසියන් සඳහා පාවහන් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ඔවුන්ගේ සමාජ තත්ත්වය නගාසිටුවීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.

13. රුපියල් මිලියන 5.0 ක මුදලක් ආයෝජනය කරමින් අම්පාර දිස්ත්‍රික්කයේ අඩියා සමාගම් සමූහය නැමති අත්වැසුම් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය සපයා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 117 දෙනෙකු පුහුණු කරන ලද අතර, කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුදල් සැපයීම යටතේ ඔවුන්ගේ නිවාසවල සිට ම උප කොන්ත්‍රත් සපයා දීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මහන මැෂින් 117 සපයා දීමට සැලසුම් කරන ලදී.

14. 2016 වර්ෂය තුළදී මෙම මධ්‍යස්ථානය විසින් උපයා ගත් මුළු ආදායම රු.5,259,810 ක් වේ.



# මූල්‍ය ප්‍රකාශන

- විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## 2016 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | සටහන | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 14 | 1,350,056,061 | 1,297,336,805 |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | | 19,280,725 | 18,321,826 |
| ස්ථාවර තැන්පතු | 15 | 54,003,793 | 25,000 |
| | | 1,423,340,579 | 1,315,683,630 |
| **ජංගම වත්කම්** | | | |
| බඩුවට්ටෝරු (තොග සහ ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ) | 16 | 30,900,030 | 34,375,687 |
| වෙළඳ සහ ලැබීමට ඇති අනෙකුත් (ණයගැතියන්) | 17 | 26,035,847 | 33,568,714 |
| අනෙකුත් ජංගම වත්කම් | 18 | 77,333,136 | 84,877,704 |
| පූර්ව ගෙවීම් | 19 | 8,860,797 | 16,272,206 |
| විශේෂ ව්‍යාපෘති | 20 | - | 36,509,324 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 21 | 194,895,214 | 95,662,065 |
| | | 338,025,024 | 301,265,699 |
| **මුළු වත්කම්** | | 1,761,365,603 | 1,616,949,329 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| රජයේ ශුද්ධ දායකත්වය | 22 | 282,787,422 | 277,910,082 |
| ප්‍රාග්ධන සංචිත | | 6,243,013 | 6,243,013 |
| පවරාදෙන ලද වත්කම්වල වටිනාකම | 23 | 13,447,061 | 13,447,061 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනණය කිරීම මත අතිරික්තය | 24 | 961,817,782 | 999,334,417 |
| වෙනත් රජයේ ප්‍රදාන | 25 | 357,657,514 | 165,498,934 |
| | | 1,621,952,792 | 1,462,433,506 |
| රජයේ ප්‍රදාන | | 1,930,291,117 | 1,930,291,117 |
| සමුච්චිත අලාභ | 26 | (2,154,331,321) | (2,175,923,391) |
| | | (224,040,204) | (245,632,274) |
| **මුළු හිමිකම්** | | 1,397,912,588 | 1,216,801,232 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 27 | 137,072,925 | 155,623,529 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 28 | 20,863,915 | 71,715,838 |
| සංස්ථාවට ගෙවිය යුතු හිග | 29 | 12,939,579 | 32,348,955 |
| | | 170,876,419 | 259,688,322 |
| **ජංගම වගකීම්** | | | |
| රජයට ගෙවිය යුතු හිග | 30 | 83,814 | 80,114 |
| සංස්ථාවට ගෙවිය යුතු හිග | 31 | 27,097,701 | 26,130,935 |
| බැංකු ණය ශේෂ | 21 | 42,376,612 | 1,146,939 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 32 | 123,018,469 | 113,101,787 |
| | | 192,576,596 | 140,459,775 |
| | | 1,761,365,603 | 1,616,949,329 |

**අධ්‍යක්ෂ - මුදල්**

**ඒ.ඩබ්.ජී. ගුරුගේ**

**"පිටු අංක 05 සිට 12 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 13 සිට 22 දක්වා ඇති සටහන් මෙම ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය."**

| | |
|---|---|
| මහින්ද ජිනසේන | ශාමින් පෙරේරා |
| සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදාම් ප්‍රකාශනය**

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| අලෙවි සහ සේවා | **05** | 166,992,951 | 211,713,216 |
| අලෙවි සහ සේවා පිරිවැය | **06** | (120,381,596) | (125,953,022) |
| **දළ ලාභය** | | **46,611,355** | **85,760,194** |
| වෙනත් ආදායම් | **07** | 102,363,963 | 66,149,632 |
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | **08** | 286,000,000 | 296,750,000 |
| පරිපාලන වියදම් | **09** | (455,084,820) | (425,139,797) |
| අලෙවි බෙදාහැරීම් වියදම් | **10** | (7,701,369) | 4,128,236 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල** | | **(27,810,871)** | **27,648,266** |
| මූල්‍ය පිරිවැය | **11** | (2,218,712) | (389,155) |
| ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය) | | (2,218,712) | (389,155) |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම | | (30,029,583) | 27,259,111 |
| **වර්ෂය සඳහා (හිඟය) / අතිරික්තය** | | **(30,029,583)** | **27,259,111** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | **12** | 28,873,913 | (2,894,499) |
| **අති විශේෂ අයිතමවලට පෙර මුළු විස්තීර්ණ (පාඩුව) / ආදායම** | | **(1,155,669)** | **24,364,612** |
| අති විශේෂ අයිතම | **13** | (510,690) | - |
| **අති විශේෂ අයිතමවලට පසු මුළු විස්තීර්ණ (පාඩුව) / ආදායම** | | **(1,666,359)** | **24,364,612** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | ශුද්ධ රජයේ දායක මුදල | ප්‍රාග්ධන සහ සංචිත | පවරාදෙන ලද වත්කම් වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය | වෙනත් රජයේ ප්‍රදාන | රජයේ ප්‍රදාන | සමුච්චිත අතිරික්තය / (හිගය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 278,694,719 | 6,243,013 | 13,447,061 | 953,015,969 | 125,933,740 | 1,930,291,117 | (2,136,683,923) | **1,170,941,701** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | (163,157) | - | (17,407,674) | **(17,570,831)** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | - | 27,259,111 | **27,259,111** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | 46,318,448 | - | - | - | **46,318,448** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | - | - | - | - | - | - | (49,090,907) | **(49,090,907)** |
| රජයේ ප්‍රදාන | 45,000,000 | - | - | - | 48,624,461 | - | - | **93,624,461** |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (45,784,637) | - | - | - | (8,896,113) | - | - | **(54,680,750)** |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **277,910,082** | **6,243,013** | **13,447,061** | **999,334,417** | **165,498,930** | **1,930,291,117** | **(2,175,923,392)** | **1,216,801,232** |
| | | | | | | | | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 277,910,082 | 6,243,013 | 13,447,061 | 999,334,417 | 165,498,930 | 1,930,291,117 | (2,175,923,392) | **1,216,801,232** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | - | 23,258,430 | **23,258,430** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | - | (30,029,583) | **(30,029,583)** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා ගැළපීම් | - | - | - | (37,516,635) | - | - | - | **(37,516,635)** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | - | - | - | - | - | - | 28,873,913 | **28,873,913** |
| ගංවතුර හානිය - ර.නි.සං. සහ සේ.ම. - පැලියගොඩ | | | | | | | (510,690) | **(510,690)** |
| රජයේ ප්‍රදාන | 45,000,000 | - | - | - | 202,192,297 | - | - | **247,192,297** |
| ප්‍රදාන ක්‍රමක්ෂය (පෙර වර්ෂය) | - | - | - | - | (39,034) | - | - | **(39,034)** |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (40,122,661) | - | - | - | (9,994,678) | - | - | **(50,117,339)** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **282,787,422** | **6,243,013** | **13,447,061** | **961,817,783** | **357,657,514** | **1,930,291,117** | **(2,154,331,322)** | **1,397,912,592** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
## **2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය**

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | (30,029,583) |
| | | |
| **මූල්‍ය නොවන අයිතම සඳහා ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 24,429,696 | |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (50,117,342) | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | (2,767,278) | |
| ස්ථාවර වත්කම් විකිණීම මගින් ලැබූ ලාභය | (387) | |
| බොල් සහ අඩමාන ණය | 7,701,369 | |
| කම්කරු ආරවුල් සඳහා වෙනකිරීම් | 341,018 | |
| විශ්‍රාම පුතිලාභ බැඳීම් | 18,844,059 | (1,568,865) |
| | | (31,598,447) |
| ගෙවන ලද විශ්‍රාම පුතිලාභ බැඳීම් | | (8,520,751) |
| | | (40,119,198) |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| තොග (වැඩිවීම) / අඩුවීම | 3,475,657 | |
| ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම | (168,502) | |
| අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම) / අඩුවීම | (6,167,344) | |
| පූර්ව ගෙවීම් (වැඩිවීම) / අඩුවීම | 3,680,249 | |
| විශේෂ ව්‍යාපෘති (වැඩිවීම) / අඩුවීම | - | |
| ණය හිමියෝ සහ උපචිත ගාස්තු (වැඩිවීම) / අඩුවීම | (5,491,299) | (4,671,239) |
| **මෙහෙයුම් තුළින් ජනිත වූ මුදල්** | | **(44,790,436)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ගලනයන්** | | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | (53,978,793) | |
| වත්කම් අලෙවියෙන් ලැබූ ආදායම | 294,103 | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම / ඉදිකිරීම | (100,316,452) | (154,001,142) |
| | | **(198,791,578)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනයන්** | | |
| ගංවතුර හානි වෙනුවෙන් ලැබුණු රක්ෂණ හිමිකම් | 398,806 | |
| රජයෙන් ලැබුණු ප්‍රදාන | 244,361,855 | |
| විශේෂ ව්‍යාපෘතිවල ආයෝජන | 12,034,394 | 256,795,055 |
| | | **58,003,477** |
| | | |
| එකතු කළා: 2016.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | | **94,515,126** |
| | | |
| **2016.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **152,518,603** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1 සාමාන්‍ය තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ ලංකා කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්ත දිරිමත් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සහායවීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය වේ

### 2 වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගෙන ඇති ප්‍රධානතම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. අන්‍යාකාරයෙන් සඳහන්කර නැත්තේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂවලට අදාළ වන පරිදි යොදාගෙන ඇත.

#### 2.1 සකස්කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) අනුගමනය කරමින් එහි මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) අන්තර්ගත කිරීම පිණිස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංශෝධනය කරන ලද අතර ඒ අනුව 2012 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන වර්ෂය සහ ඉන් පසු එළඹෙන වර්ෂ සඳහා සියලුම ආයතන විසින් මෙම ප්‍රමිති යොදා ගත යුතු වේ.

5 වැනි සටහනෙහි අනාවරණය කර ඇති යම් යම් සංක්‍රාන්ති විවර්ජන සහ ව්‍යතිරේක වලට යටත්ව, මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති 2011 ජනවාරි මස 1 වැනි දිනට සහ ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේද පුරා මූල්‍ය තත්ත්වයෙහි ආරම්භක ප්‍රකාශනය සකස් කිරීමෙහිදී සියලුම කාලවලට අදාළ වන පරිදි මෙම ප්‍රතිපත්ති සැමවිටම බලපැවැත්වෙමින් තිබුණා සේ යොදා ගෙන ඇත. පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් වැදගත් වෙනස්කම් සිදුවූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ස්වභාවය සහ බලපෑම ද ඇතුළත්ව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයට මාරුවීමෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්තා කර ඇති මූල්‍ය තත්වයට සහ මූල්‍ය කාර්යසාධනයට ඇතිවී ඇති බලපෑම අනාවරණය කර ඇත.

මූල්‍ය වත්කම් සහ වගකීම් ප්‍රත්‍යාගණන ඇගයීම සහ සාධාරණ ඇගයීම මගින් සංශෝධනය කර ඇති පරිදි ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඉතා වැදගත් ගිණුම්කරණ නිමාන භාවිතා කිරීම අවශ්‍ය කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් සිය විනිශ්චය යොදා ගැනීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණ බවක් ඇතුළත්වන ක්ෂේත්‍ර, නැතහොත් උපකල්පන සහ ඇස්තමේන්තු කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට වැදගත් වන ක්ෂේත්‍ර අනාවරණය කර ඇත.

#### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි වෙනස්කම් සහ අනාවරණ

*නිකුත් කර ඇති නමුත් 2012 ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා බලාත්මක නොවන සහ කලින් යොදා නොගත් නව ප්‍රමිති, සංශෝධන සහ අර්ථ නිරූපණ.*

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. (SLFRS) - 13, ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. පුරාවටම යොදා ගැනීම පිණිස සාධාරණ වටිනාකම යන්නෙහි තනි නිශ්චිත නිර්වචනයක් සහ සාධාරණ වටිනාකම් මිනුම් සහ හෙළිදරව් කිරීම් අවශ්‍යතාවල එක් තනි මූලාශ්‍රයක් සපයාදීම මගින් අනුරූපත්වය වැඩිදියුණු කර සංකීර්ණත්වය අඩු කිරීම 'සාධාරණ වටිනාකම් මිනුම' මගින් අරමුණු කෙරේ. මෙම ප්‍රමිතියෙහි පූර්ණ බලපෑම කළමනාකරණය විසින් තක්සේරු කළ යුතුව තිබේ.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9, 'මූල්‍ය සාධන පත්‍ර' මගින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම, ඇගයීම සහ හඳුනාගැනීම් නිරාකරණය කෙරෙයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 යටතේ මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය කිරීම සහ ඇගයීමට අදාළ කොටස් ප්‍රතිස්ථාපනය කරයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 අනුව මූල්‍ය වත්කම් ඇගයීම් කාණ්ඩ දෙකකට වර්ග කළ යුතු වේ. එම කාණ්ඩ දෙක සාධාරණ වටිනාකමට ඇගයීම කරනු ලබන කාණ්ඩය සහ ක්‍රමක්ෂය කළ පිරිවැයට ඇගයීම් කරනු ලබන කාණ්ඩය වශයෙන් වේ. නිර්ණය කිරීම මුල්වරට හඳුනාගැනීමේදී සිදු කරනු ලැබේ. එම වර්ගීකරණය ආයතනයේ මූල්‍ය සාධන පත්‍ර කළමනාකරණය කිරීම සඳහා ආයතනයේ ඇති ව්‍යාපාර අනුරූපය සහ සාධන පත්‍රයේ ඇති ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී. මූල්‍ය වගකීම් සඳහා මෙම ප්‍රමිතිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 39 හි ඇති අවශ්‍යතාවලින් බොහොමයක් එලෙසම තබාගෙන ඇත. ප්‍රධාන වෙනස්කම වන්නේ මූල්‍ය වගකීම් සඳහා සාධාරණ වටිනාකම විකල්පය වශයෙන් ගෙන ඇති අවස්ථාවලදී, ගිණුම්කරණ නොගැළපීමක් ඇතිවීමට හේතු නොවන්නේ නම් මිස, ආයතනයක සිය ණය අවදානම ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනවාට වඩා වෙනත් විස්තීර්ණ ආදායමක වාර්තා කිරීම හේතුවෙන් සාධාරණ වටිනාකමක කොටස වෙනස් වීමයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත මූර්ත බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබිය හැකි, තවමත් ක්‍රියාත්මකව නොමැති වෙනත් ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථ නිරූපණ නොමැත.

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 2.3 දේපළ, පිරියත සහ උපකරණ

සියලු ම දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කර ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා ඍජුව ම දරණ ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතම ගලවා ඉවත්කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරියවැයට ඇතුළත් වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වෙනස්වීමක් සිදුවුව හොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩුවීමකට ප්‍රතිවර්ත නොවන්නේ නම්, එය ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී, වැඩිවීම පූර්වයෙන් ලියා ගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම  වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තන නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අය කරනු ලැබේ. වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරිවී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමෙහිදී හෝ බැහැර කිරීමෙහිදී ඍජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.
අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුළත් කිරීම හෝ වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදු කරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අළුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාල පරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

*(ආ). ක්ෂයවීම්*

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම අරම්භ වූ දිනයේ සිටම ක්ෂවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂවීම් අඩු කරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| 1 | ඉඩම් වැඩිදියුණු කිරීම හා ගොඩනැගිලි | 2.5% |
| 2 | පරිගණක මෘදුකාංග | 7.0% |
| 3 | පිරියත සහ යන්ත්‍රයසූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලයීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලීබඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍යස සේවා, PABX සේවා, වෙනත් වත්කම් | 10.0% |
| 4 | පරිගණක සහ මෝටර් වාහන | 20.0% |
| 5 | මෙවලම්, පොත්, ගමන් මලු | 25.0% |

වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සෑම ශේෂපත්‍ර දිනයකදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමෙහි ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් එකෙනෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය / පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.3.1** පහත සඳහන් ඉඩම්වල නීත්‍යානුකූල හිමිකාරීත්වය කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී නොතිබුණ ද, කාර්මික සංවර්ධන මණ්ඩලය දැනට එම ඉඩම් පරිහරණය කරයි.

| අංකය | ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය | වර්ගඵලය | | | භාවිතා කරන කාර්යය | බුක්තිය ලබා ගත් දිනය | අත්පත් කර නොගැනීමට හේතුව | අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය |
|---|---|---|---|---|---|---|---|---|
| | | අක්කර | රූඩ් | පර්චස් | | | | |
| 1 | අනුරාධපුර | | 1 | 20 | ප්‍රාදේශීය කාර්යාලය | 1971 සිට | රජයේ ඉඩමකි | බදු ගිවිසුමක් මගින් අයිතිය පවරා දී ඇත |
| | | | | | පොදු සේවා මධ්‍යස්ථානය | | රජයේ ඉඩමකි | බුක්තිය ලබා දී ඇත, එහෙත් අයිතිය පවරා දී නැත |
| 2 | පොළොන්නරුව | | 3 | 26.6 | ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව | 1992 සිට | රජයේ ඉඩමකි | ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත. |
| 3 | මාතර | 1 | 1 | 6.2 | ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය | | | අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත. |
| 4 | හම්බන්තොට | | | | ප්‍රාදේශීය කාර්යාලය | 2006 සිට | ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත | |
| | | | | | සම්භාණ්ඩ මධ්‍යස්ථානය - විතාරන්දෙනිය | | | ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත |
| 5 | මොණරාගල | | | 48 | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත. |
| 6 | බදුල්ල | | | 80 | "ගම් උදා" මධ්‍යස්ථානය - මහියංගනය | 1997 සිට | | සමෘද්ධි බැංකුව - මහියංගනය විසින් ලබා දී ඇති ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත. |
| 7 | කොළඹ | 1.2953 Hec | | | ප්‍රධාන කාර්යාලය | | අයිතිය කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාළ ආයතනවලට ලිපියක් මගින් ඉල්ලීම් කර ඇත. |
| | | | | | නවබිම මධ්‍යස්ථානය | | | |
| 8 | කොළඹ | 0.4046 Hec | | | රබර් සංවර්ධන මධ්‍යස්ථානය | 1980 සිට | 99 අවුරුදු බදු පදනම මත | |
| 9 | අම්පාර | | | | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ලිපියක් මගින් පවරා දී ඇත |
| 10 | කොළඹ | 13 | 2 | 6 | කාර්මික ජනපදය - පානළුව | 2006 සිට | | අත්පත් කර ගැනීම සඳහා මිනුම් කටයුතු සිදු කරමින් පවතී |
| 11 | බද්දේගම | 1 | 2 | 0.5 | කාර්මික ජනපදය | 1992 සිට | | 2016 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඉ.ප්‍ර.කො. වෙත නැවත පවරා දීමට තීරණය කර ඇත |
| 12 | බෙලිඅත්ත | 10 | 0 | 29.2 | කාර්මික ජනපදය | 1995 සිට | | 2016 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඉ.ප්‍ර.කො. වෙත නැවත පවරා දීමට තීරණය කර ඇත |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.4 මූල්‍ය වත්කම්**

**2.4.1 වර්ගීකරණය**

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කරගත් කාර්යය පදනම් කරගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

*ණය සහ ලැබිය යුතු මුදල්*

ණය සහ අය විය යුතු මුදල් සක්‍රීය වෙළඳ පොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂපත්‍ර දිනෙන් පසු මාස 12කට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම්වල ඇතුළත් කර ඇත.

**2.4.2 මූල්‍ය වත්කම් හඳුනාගැනීම**

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගනු දෙනු පිරිවැය එකතු කළ අගයට හඳුනාගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

**2.4.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම**

හඳුනාගත් වටිනකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවිට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

**2.4.4 මූල්‍ය වත්කම් හානිකරණය**

*(අ) ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)*

සෑම වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම්වලට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇති කරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානිවී ඇති බවට සලකණු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරණු ලැබේ.

හානිකරණයට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩුවන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂාකිරීම 2.10 සටහනෙහි විස්තර කර ඇත.

**2.5 මූල්‍ය වගකීම්**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර ඉන් පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැළකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

**2.6 තොග**

තොග වටිනාකම පිරිවැයෙහි පහළ අගයට සහ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කරනු ලැබේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇසත්මේන්තු කළ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පිරිවැය අඩුකළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගණන් ගනු ලැබේ.

අමුද්‍රව්‍ය - පෙර පිවිසි පෙර නිකුතු පදනමින් සත්‍ය පිරිවැයට
නිමි භාණ්ඩ - පිරිවැයට
සිදු කෙරෙමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගෙන නිෂ්පාදන පොදු කාර්යවලින් යෝග්‍ය කොටසක්

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.6 තොග (ඉතිරි කොටස)**

(ආ). 2016 මාර්තු මස 21වැනි දින "නවබිම" අබලි අංගනයෙහි ගින්නක් හට ගත්තේය. කාර්මික සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණකවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාර දෙන ලද වර්තාවට අනුව අබලි තොගයට හානියක් සිදුවී නැත.

**2.7 වෙළඳ ලැබිය යුතු දෑ**

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේදී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් අයවීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නො එසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**2.7 වෙළඳ ලැබිය යුතු දෑ (ඉතිරි කොටස)**

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දෑ වලට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අයකර ගැනීමට නොහැකිවනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත් භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩකිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලනයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ: වසර 5 ට වැඩි නම් 100% ප්‍රතිපාදනය කරනු ලබන අතර අනෙක්වා සඳහා 10% කි.

**2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් සහ මුදල් හා සමාන දේට අත ඉතුරු මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, මාස තුනක හෝ එයට අඩු මුල් කල් පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම්වල ණය ගැනුම් යටතේ පෙන්වා ඇත.

**2.9 ප්‍රතිපාදන**

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍යවිය හැකි සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**2.10 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

ශේෂ පත්‍රයෙහි වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂපත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයෙහි සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයකදී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

**2.11 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශාම ගැනීමේදී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දිය වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරණ පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ.

නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කරවල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසි වලට ආසන්න වන කොන්දේසි සහිත අනාගත මුදල් ගලායාම් වට්ටම් කරමින් නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයුගණක උපකල්පනයන්හි වෙනස්කම් මගින් හටගන්නා ආයුගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටගන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නෙහි නම් අතීත සේවා පිරිවැය එකෙනෙහිම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමෙහිදී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.12 නිර්වචිත දායක සැලැස්ම**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලබයි.

**2.13 ආයෝජන**

ආයෝජන තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙන යනු ලැබේ.

**2.14 රජයේ ප්‍රදාන**

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර මෙහිදී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසිවලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පරිවැය සමග ගැළපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්බිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර ඇති අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

පැලියගොඩ රබර් අංශය සඳහා ආක්ෂේපණ වාත්තු අච්චු සෑදීමේ යන්ත්‍රයක් (Injection Moulding Machine) මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. 9,517,366.00 ක ප්‍රදානක් ලැබුණි. කෙසේ වෙතත් විවිධ හේතූන් නිසා මෙම යන්ත්‍රය වාණිජමය වශයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා යොදවා ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම යන්ත්‍රයට ක්ෂය වීම් සඳහා වෙන් කිරීම් සිදු කර නැත. ඒ අනුව, ලැබුණු ප්‍රතිපාදනය හඳුනා ගෙන නොමැති අතර, සඵල ලෙස භාවිතා කිරීම ආරම්භ කරන තුරු විලම්භනය කර ඇත.

**2.15 පරිත්‍යාග**

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබාදෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, ප්‍රදායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව අසාධාරණ හුවමාරු ගණුදෙනුවක ප්‍රතිඵලය වන තරමට ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැලකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනාගත යුතුය.

**2.16 ආදායම් හඳුනාගැනීම**

*(අ). විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා*

අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරාදී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයා ගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැලකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

*(ආ). පොළී ආදායම*

පොළී ආදායම කාල ප්‍රමාණ පදනමකින් හඳුනාගනු ලැබේ.

ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙහිදී ලැබුණු හෝ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම නිසා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන්හි සාධාරණ වටිනාකම්වලින් සමන්විත වේ. ආදායම අගය එකතු කිරීමේ බද්ද, ප්‍රතිලාභ, ප්‍රතිදාන සහ වට්ටම්වල ශුද්ධ වටිනාකම ලෙස පෙන්වා ඇත.

**2.17 වියදම් හඳුනාගැනීම**

*(අ). මෙහෙයුම් වියදම්*

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහිදී දරන ලද සියලුම වියදම් ආදායමට අයකරනු ලැබේ.

*(ආ). ශුද්ධ මූල්‍ය පිරිවැය*

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය, සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 3 මූල්‍ය අවදානම් කළමනාකරණය

#### 3.1 මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම්වල ද්‍රවශීලතාවය ඉහළනැංවීම සහ පවත්වාගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුවම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධවූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම් වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

***(i) පොළී අනුපාත අවදානම***

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැදීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම් සහ තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිස ගැනීම ආදී ක්‍රම මගින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලය විචල්‍ය පොළී අනුපාත යටතේ ණය ලබා ගෙන නොමැති නිසා 2016 දෙසැම්බර් 31 වැනි දිනට කාර්මික සංවර්ධන මණ්ඩලය පොළී අනුපාත අවදානමකට නිරාවරණය වී නැත.

***(ii) ණය අවදානම***

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිග ලැබිය යුතු දෑ සහ සිදුකළ ගනුදෙනු ද ඇතුළත්ව විදේශ ගනුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

සාමාන්‍යයෙන් ණය ආවදානමට ලක්වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වයන් ඒවායේ ධාරණ වටිනාකම් වලට සමාන වේ. උපරිම අවදානම් තත්ත්වයන් පහත සඳහන් වගුව මගින් පෙන්වා ඇත (2016.12.31 දිනට).

| | වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකම් | මුදල් සහ මුදල් හා සමාන දෑ | එකතුව |
|---|---|---|---|---|
| <u>**අවදානම් නිරාවරණය**</u> | | | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 26,035,847 | | - | 26,035,847 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | - | | 194,895,214 | 194,895,214 |
| | **26,035,847** | **-** | **194,895,214** | **220,931,061** |

#### 3.2 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත් ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමත්ය.

කර්මාන්තයේ නියැළී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම්වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම්වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මුළු හිමිකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති දක්වා ඇති පරිදි මුළු හිමිකම ලෙස ගණනය කරනු ලැබේ.

2016 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය.

| | 2016 | 2015 |
|---|---|---|
| මුළු ණයටගැනීම් | 363,453,015 | 400,148,097 |
| මුළු හිමිකම් | 1,397,912,588 | 1,216,801,232 |
| **තෝලන අනුපාතය** | **26.00%** | **32.89%** |

දිගු කාලීන ණය කිසිවක් ලබා ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, රු.මි. 50.0 ක ස්ථාවර තැන්පතුව ඇපයට තබා 2.5% ක අමතර පොළී අනුපාතයකට අයිරා පහසුකමක් ලබා ගෙන තිබුණි. මේ මගින් අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම හරහා පොළිය ලබා ගැනීම මගින් අමතර ආදායමක් උපයා ගැනීමට මෙයින් අපට පහසුකම් සැලසුණි.

## 4 අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරුකිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

### 4.1 ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකරයි. එයින් ප්‍රතිඵලවන ගිණුම්කරණ ඇස්තමේන්තු ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵලවලට සමාන වන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැළපීමක් සිදුකිරීමට හේතුවන සැළකිය යුතු අවදානමක් සහිත ඇස්තමේන්තු සහ උපකල්පනයන් පහත අනාවරණය කර ඇත.

**(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික**

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත්වීමේ සහ ආබාධිතවීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පනවලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ස්වායත්ත ආයුගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදාගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලායෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවතින වෙළඳපොළ තත්ත්වයන් මත ද රඳා පවතී. අමතර තොරතුරු 26 වැනි සටහනෙහි සඳහන් කර ඇත.

**(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්**

කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩි දියුණු කිරීම් වැනි සාධක පදනම් කර ගෙන දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන් කළ සාධකවල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තුවල ඇතිවිය හැකි වෙනස්කම් මෙහෙයුම් වල අනාගත ප්‍රතිඵල වලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩුවීමක් සිදුවීම මගින් වාර්තා කර ඇති ක්ෂය අයකිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

### 4.2 අවිනිශ්චිත වගකීම්

(අ). ජීවන වියදම් දීමනාව මත සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවීම හේතුවෙන් එකතුවී ඇති රු.2,911,406.00 ක වගකීම මෙතෙක් මණ්ඩලය වෙත දන්වා නොමැති නිසා එම වගකීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ආ). මුදල් වර්ෂය අවසානය වන විට මණ්ඩලයට එරෙහිව අධිකරණයේ පවරා තිබූ, විභාග කර අවසන්වී නොමැති නඩු 07 ක් තිබුණි. කෙසේ වෙතත්, නීති අංශයට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදුවිය හැකිව නොතිබුණි. එබැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමේ වගකීමක් පැන නැගී නොතිබුණි. සේවකයෙකු වැඩ තහනමට ලක් කරනු ලැබූ අතර ඒ සඳහා අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වන ලදී. අවසන් බේරුම්කරණයට අනුව එම සේවකයාට වන්දි වශයෙන් රු. 341,018,.24 ක මුදලක් ගෙවිය යුතු බවට ඇස්තමේන්තු කරන ලද අතර ගිණුම්වල ඒ සඳහා ප්‍රතපාදන සලසා ඇත.

(ඇ). අංක WP PD 6022 දරණ වාහනය 2016.12.12 දින අනතුරට පත් වී එයට බරපතල හානි සිදු විය. එය අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිතයින්ගෙන් මිල ගණන් කැඳවූ අතර අවශ්‍ය කොටස් ආනයනය කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බව මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. ඒ අතරතුර වාහනය අලුත්වැඩියා කරවා ගැනීමේ විකල්ප ක්‍රමයක් සොයා ගැනීමට තීරණය විය. අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු කළ වියදම රු. මි. 4.9 ක් පමණ විය. කෙසේ වෙතත්, තවමත් අවසන් තීරණයක් ගෙන නෙමැති නිසා, මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නැත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | 2016 | 2015 |
|---|---|---|
| **05 ආදායම** | | |
| **5 a විකුණුම්** | 45,426,556 | 29,241,401 |
| විකුණුම් (යකඩ නොවන ලෝහ ව්‍යාපෘතිය) | 43,044,099 | 103,970,263 |
| කැස්පර් ව්‍යාපෘතිය විකුණුම් ආදායම් | 2,367,605 | 2,101,575 |
| ප්‍රකාශන අලෙවි කිරීම | 370,538 | 402,040 |
| | **91,208,797** | **135,715,279** |
| **5 b සේවා** | | |
| කුලිය - කාර්මික ජනපද | 47,464,835 | 41,985,200 |
| ජල ගාස්තු | 8,249,446 | 7,441,537 |
| වැඩිපුර අය කර ගත් ගාස්තු | 1,441,306 | 1,533,423 |
| පුහුණු වැඩසටහන් | 15,009,485 | 17,449,627 |
| ව්‍යාපෘති වාර්තා | 749,305 | 3,179,144 |
| සේවා ගාස්තු | 2,869,778 | 4,409,007 |
| | 75,784,154 | 75,997,937 |
| | 166,992,951 | 211,713,216 |
| **06 අලෙවි සහ සේවා පිරිවැය** | | |
| අලෙවි පිරිවැය - සෘජු ද්‍රව්‍ය | 21,128,543 | 23,722,894 |
| අලෙවි පිරිවැය - මිලදී ගැනීම් - යකඩ නොවන අබලි ව්‍යාපෘතිය | 39,547,446 | 73,950,390 |
| අලෙවි පිරිවැය - සෘජු ශ්‍රමය | 4,166,340 | 2,954,694 |
| * අලෙවි පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය | 4,532,258 | 4,308,755 |
| * කර්මාන්ත ශාලා පොදු කාර්ය පිරිවැය | (1,978,163) | (1,517,652) |
| * සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය ආකාරයෙන් අය කර ගත් මුදල | (2,715,184) | (2,701,869) |
| පාරිභෝගික - ඉංජිනේරු අමුද්‍රව්‍ය | 20,175 | 106,306 |
| පාරිභෝගික - වාත්තු වැඩපොළ අමුද්‍රව්‍ය | - | 54,637 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර නඩත්තු | 829,268 | 535,069 |
| විදුලි බලය | 3,773,047 | 3,600,318 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම් | 1,488,166 | 912,995 |
| ලෝහ නොවන අබලි එකතු කිරීමේ කොමිස් | - | 16,400 |
| ඉංජිනේරු වැඩ ගාස්තු | 7,000 | 48,664 |
| අලෙවිකරණ වියදම් | 276,892 | 154,028 |
| උප කොන්ත්‍රාත් ගාස්තු | 1,012,363 | 877,100 |
| කාර්මික ජනපද නඩත්තු කිරීම | 1,636,570 | 1,254,680 |
| විද්‍යාගාර උපකරණ නඩත්තු කිරීම | 79,890 | 800 |
| මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම | - | 300 |
| උපකරණ සහ අමතර කොටස් නඩත්තු කිරීම | 99,585 | - |
| ප්‍රවාහන ගාස්තු | 1,461,914 | 529,806 |
| ජා.ගො.බ. වියදම් - ලක්කම් | 209,886 | 189,361 |
| පුහුණු වැඩසටහන් | 13,690,206 | 16,955,344 |
| විශේෂ ව්‍යාපෘති සඳහා වියදම් | 31,115,394 | - |
| **එකතුව** | **120,381,596** | **125,953,022** |

* විකුණුම් පිරිවැයෙහි කොටසක් ලෙස නිෂ්පාදිත අයිතම පිරිවැය ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙය පැන නැගී ඇත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**07 වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | 50,117,342 | 54,680,750 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 31,115,394 | - |
| ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතු පොළිය | 8,840,975 | - |
| විවිධ ආදායම් | 5,112,657 | 3,319,944 |
| කොමිස් (උප කොන්ත්‍රාත් භූවමාරු) | 454,974 | 592,935 |
| කොමිස් - ලක්කම් මධ්‍යස්ථානය | 2,096,776 | 1,990,777 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,180,025 | 752,400 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 42,900 | 16,400 |
| ලක්කම් ශාලා ගාස්තු | 15,000 | 32,000 |
| නොතාරිස් ගාස්තු | 239,400 | 212,320 |
| දඩ | 53,152 | 76,356 |
| වෙබ්අඩවි පළකිරීමේ ආදායම් | 4,500 | - |
| සංචාරක බංගලා ගාස්තු | 185,045 | 172,386 |
| ස්ථාවර වත්කම් විකිණීම | 294,491 | 187,200 |
| ඉතිරි කිරීම් පොළිය | 164,493 | 1,699,789 |
| රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | 582,151 | 842,286 |
| කාර්යමණ්ඩල ණය පොළී | 1,469,935 | 1,574,088 |
| ප්‍රදර්ශන ආදායම | 394,754 | - |
| **එකතුව** | **102,363,963** | **66,149,632** |

**08 ප්‍රදාන**

| | 2016 | 2015 |
|---|---|---|
| ආදායම් ප්‍රදාන | 286,000,000 | 296,750,000 |
| | **286,000,000** | **296,750,000** |

**09 පරිපාලන වියදම්**

| | 2016 | 2015 |
|---|---|---|
| මූලික වැටුප් | 148,549,534 | 120,452,632 |
| සභාපතිවරයාගේ වේතනය | 900,000 | 716,071 |
| විධායක අධ්‍යක්ෂවරුන්ගේ දීමනා | - | 292,857 |
| විශේෂ දීමනා 5% | 60,895,032 | 75,636,336 |
| ජීවන වියදම් දීමනාව | 47,431,632 | 46,171,006 |
| වෙනත් දීමනා | 7,314,780 | 4,739,482 |
| සේ.අ.අ. (දායක මුදල්) | 24,027,982 | 20,326,548 |
| සේ.නි.භා.අ. (දායක මුදල්) | 6,006,998 | 5,080,517 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා | 890,000 | 6,132,375 |
| පාරිතෝෂික | 18,844,059 | 16,536,613 |
| පුහුණු දීමනා | 1,001,525 | 872,025 |
| දෛනික ගෙවීම් කරනු ලබන සහ මුරකරු දීමනා | 4,426,052 | 954,154 |
| ලබා නොගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම් | 12,469,739 | 10,655,041 |
| අතිකාල | 9,535,239 | 8,674,760 |
| නිවාඩු දින ගෙවීම් | 868,338 | 741,709 |
| ගමන් වියදම් (දේශීය) | 6,110,539 | 5,472,333 |
| ගමන් වියදම් (විදේශීය) | 378,790 | 1,810,359 |
| නවාතැන් වියදම් | 148,500 | 200,185 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 3,255,518 | 2,703,208 |
| ඉන්ධන වියදම් | 5,459,909 | 3,763,667 |
| නිල ඇඳුම් | 1,953,230 | 1,591,278 |
| සේවක වන්දි | 495,000 | - |
| ඉඩම් නඩත්තු කිරීම | 534,935 | 244,944 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 2,472,568 | 774,188 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 494,984 | 732,235 |
| පරිගණක සහ උපාංග නඩත්තු කිරීම | 588,798 | 551,904 |
| මෝටර් වාහන නඩත්තු කිරීම | 4,018,726 | 3,452,808 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 1,720,051 | 742,384 |
| ලී බඩු, සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම | 355,314 | 141,041 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**09 පරිපාලන වියදම් - ඉතිරි කොටස**

| | | |
|---|---|---|
| පාපැදි නඩත්තු කිරීම | 15,390 | - |
| PABX සේවා නඩත්තු කිරීම | 3,020 | - |
| විවිධ වත්කම් නඩත්තු කිරීම | 23,633 | 20,801 |
| ජල සැපයුම නඩත්තු කිරීම | 4,785 | 43,888 |
| වෙබ් අඩවිය නඩත්තු කිරීම | 289,500 | - |
| විදුලිය ගාස්තු | 8,356,459 | 8,798,008 |
| දුරකථන ගාස්තු | 5,131,864 | 5,623,813 |
| ආරක්ෂක සේවා සඳහා ගෙවීම් | 21,159,414 | 20,359,707 |
| තැපැල් සහ විදුලි පණිවුඩ ගාස්තු | 941,030 | 785,427 |
| ජල ගාස්තු | 5,294,480 | 6,056,540 |
| කුලී, වරිපණම් සහ බදු | 3,713,841 | 3,693,590 |
| රක්ෂණ | 1,513,777 | 1,557,541 |
| පුවත්පත් සහ සඟරා | 807,151 | 746,459 |
| අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු | 719,600 | 259,200 |
| වෛද්‍ය ආධාර යෝජනාක්‍රම දායක මුදල් | 782,500 | 286,235 |
| විගණන ගාස්තු | 1,242,000 | 600,000 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 277,500 | 21,000 |
| සුභසාධන | 1,837,887 | 1,287,859 |
| විනෝදාස්වාද | 825,541 | 381,721 |
| වෙළඳ දැන්වීම් | 4,445,885 | 913,035 |
| නීති සේවා ගාස්තු | 208,223 | 93,554 |
| වෙළඳ පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු | 221,230 | 19,762 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු | 1,058,800 | 273,944 |
| වෘත්තීයවේදී සංවිධානවල සාමාජික ගාස්තු (දේශීය සහ විදේශිය) | 33,103 | 9,768 |
| බලපත්‍ර ගාස්තු | 226,605 | 217,880 |
| ප්‍රවර්ධන වියදම් | 35,670 | - |
| ප්‍රදර්ශන වියදම් | 216,644 | 223,910 |
| පර්යේෂණ සහ සංවර්ධන | 93,000 | 170,177 |
| තක්සේරු කිරීමේ සහ මැනුම් කිරීමේ ගාස්තු | 456,120 | 59,024 |
| සක්‍යතා අධ්‍යයන | 75,200 | 191,215 |
| ප්‍රකාශන | 91,642 | 20,000 |
| ඡායාරූප | 34,228 | 6,300 |
| කම්කරු නඩු සඳහා ප්‍රතිපාදන | 341,018 | - |
| විවිධ වියදම් | 392,205 | 341,418 |
| ලියාපදිංචිකිරීම් ගාස්තු | 100,452 | 56,940 |
| වැඩිපුර අය කළ ගාස්තු | 26,119 | - |
| ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂයවීම | 3,967,742 | 577,667 |
| ගොඩනැගිලි ක්ෂයවීම් | 5,188,500 | 11,396,473 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම | 938,921 | 2,792,194 |
| පරිගණක උපාංග ක්ෂයවීම | 3,912,971 | 3,845,927 |
| රසායනාගාර උපකරණ ක්ෂයවීම | 816,319 | 275,328 |
| මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම | 191,737 | 249,437 |
| මෝටර් වාහන ක්ෂයවීම | 2,440,000 | 7,910,000 |
| කාර්යාල උපකරණ ක්ෂයවීම් | 2,459,037 | 1,694,709 |
| ගමන්මළු ක්ෂයවීම් | 24,660 | 20,781 |
| ලී බඩු සහ සවිකිරීම් ක්ෂයවීම | 1,217,424 | 1,124,472 |
| පාපැදි ක්ෂයවීම් | 9,724 | 10,762 |
| උපකරණ සහ අමතර කොටස් ක්ෂයවීම් | 562,065 | 177,272 |
| පුස්තකාල පොත් ක්ෂයවීම් | 290,072 | 820,223 |
| PABX සේවා ක්ෂයවීම් | 271,109 | 279,484 |
| උපයෝගිතා සේවා ක්ෂයවීම් | 356,875 | 327,848 |
| විවිධ වත්කම් ක්ෂයවීම් | 216,307 | 355,843 |
| පරිගණක මෘදුකාංග ක්ෂය වීම | 78,066 | - |
| | 455,084,820 | 425,139,797 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

| | 2016 | 2015 |
|---|---|---|
| **10 විකුණුම් සහ බෙදාහැරීම් පිරිවැය** | | |
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | (7,701,369) | 4,128,236 |
| | **(7,701,369)** | **4,128,236** |

| | 2016 | 2015 |
|---|---|---|
| **11 මූල්‍ය පිරිවැය** | | |
| බැංකු ගාස්තු | 405,362 | 378,655 |
| අයිරා පොළී | 1,813,350 | 10,500 |
| | **2,218,712** | **389,155** |

| | 2016 | 2015 |
|---|---|---|
| **12 වෙනත් විස්තීරණ ආදායම්** | | |
| වර්ෂය සඳහා ආයුගණක ලාභය (අලාභය) | 28,873,913 | (49,090,907) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | 46,196,408 |
| | **28,873,913** | **(2,894,499)** |

| | 2016 | 2015 |
|---|---|---|
| **13 අති විශේෂ අයිතම** | | |
| **ගංවතුර අලාභය - රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය - පැලියගොඩ** | | |
| රක්ෂණ ලැබීම් | 398,806 | - |
| හානි පිරිවැය | (909,496) | - |
| ශුද්ධ ලාභය / (අලාභය) | **(510,690)** | - |

**වර්ෂය තුළ සේවයේ යෙදී සිටි සේවකයින්ගේ සාමාන්‍යය සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| ස්ථිර | **473** | **485** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

## 14 2016.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් | ඉඩම් සංවර්ධන | ගොඩනැගිලි | පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සවිකිරීම් | මුද්‍රණ යන්ත්‍ර | JICA ව්‍යාපෘති වත්කම් | කාර්යාල උපකරණ |
|---|---|---|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 676,552,750 | 19,796,913 | 403,635,131 | 12,358,453 | 1,347,474 | (3) | 8,784,250 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | 2,586,362 | - | - | - | 34,000 |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 676,552,750 | 19,796,913 | 406,221,494 | 12,358,453 | 1,347,474 | (3) | 8,818,250 |
| එකතු කිරීම් | 67,595,691 | - | 15,897,195 | 2,319,957 | - | - | 1,029,643 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | (3,587,762) |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | (577,667) | - | (11,396,473) | (3,705,189) | (249,437) | - | (1,694,709) |
| ශුද්ධ පොත් වටිනාකම වත්කම් ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කිරීම | - | - | - | (10,973,222) | (1,098,038) | | (8,153,183) |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | - | - | - | - | 3,587,762 |
| ප්‍රත්‍යාගණනය | - | - | - | 45,671,000 | 1,213,500 | - | 5,657,000 |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **743,570,774** | **19,796,913** | **410,722,216** | **45,671,000** | **1,213,500** | **(3)** | **5,657,000** |
| **2015 දෙස්ම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 767,716,095 | - | 457,488,060 | (0) | - | 228,842,382 | 0 |
| ප්‍රකාාගණනය | - | - | - | 45,671,000 | 1,213,500 | - | 5,657,000 |
| සමුච්චිත ක්ෂය | (4,348,408) | - | (46,765,844) | - | - | (228,842,385) | - |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **763,367,687** | **-** | **410,722,216** | **45,671,000** | **1,213,500** | **(3)** | **5,657,000** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම / ප්‍රත්‍යාගණනය කළ අගය | 763,367,687 | - | 410,722,216 | 45,671,000 | 1,213,500 | (3) | 5,657,000 |
| පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය) | - | - | 7,751,162 | (592,480) | - | - | 717,994 |
| පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය) | - | (4,835,176) | (105,649) | - | - | - | (2,560) |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසුව ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 763,367,687 | (4,835,176) | 418,367,728 | 45,078,520 | 1,213,500 | (3) | 6,372,434 |
| එකතු කිරීම් | - | 50,850,394 | 1,008,999 | 9,922,229 | - | - | 6,536,106 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | (22,568) |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | - | (3,967,742) | (5,188,500) | (2,427,088) | (191,737) | - | (2,459,037) |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය කිරීම් | - | (2,287,500) | (6,444,924) | - | - | - | - |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | | - | - | - | 2,257 |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **763,367,687** | **39,759,977** | **407,743,302** | **52,573,661** | **1,021,763** | **(3)** | **10,429,191** |
| **2016 දෙසැම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 767,716,095 | 50,850,394 | 466,248,221 | 55,000,749 | 1,213,500 | 228,842,382 | 12,888,531 |
| සමුච්චිත ක්ෂය | (4,348,408) | (11,090,418) | (58,504,918) | (2,427,088) | (191,737) | (228,842,385) | (2,459,340) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **763,367,687** | **39,759,977** | **407,743,302** | **52,573,661** | **1,021,763** | **(3)** | **10,429,191** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)** **(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

### 14 2016.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | විද්‍යාගාර උපකරණ | ගමන් මලු | ලී බඩු සහ සවිකිරීම් | බයිසිකල් පිරිවැය | උපකරණ සහ අමතර කොටස් | පුස්තකාල පොත් | PABX සේවා |
|---|---|---|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 259,285 | 37,094 | 4,902,969 | 60,103 | 219,796 | 1,695,231 | 1,043,960 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | (500,369) | 2,000 |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 259,285 | 37,094 | 4,902,969 | 60,103 | 219,796 | 1,194,862 | 1,045,960 |
| එකතු කිරීම් | 2,706,555 | 36,200 | 1,482,326 | 13,063 | 761,173 | 168,463 | 94,000 |
| බැහැර කිරීම් | - | - | - | (17,425) | - | - | - |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | (275,328) | (20,781) | (1,124,472) | (10,762) | (177,272) | (820,223) | (279,484) |
| ශුද්ධ පොත් වටිනාකම වත්කම් ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කිරීම | (2,690,512) | - | (5,260,823) | (62,404) | (803,698) | - | - |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | - | 17,425 | - | - | - |
| ප්‍රත්‍යාගණනය | - | - | 5,456,750 | 250,000 | - | - | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **-** | **52,513** | **5,456,750** | **250,000** | **-** | **543,102** | **860,476** |
| **2015 දෙස්මබර් 31 දිනට** | - | | | | | | |
| පිරිවැය | - | 1,271,005 | (0) | - | - | 12,196,081 | 4,308,731 |
| ප්‍රකාාගණනය | - | - | 5,456,750 | 250,000 | - | - | - |
| සමුච්චිත ක්ෂය | - | (1,218,492) | - | - | - | (11,652,979) | (3,448,255) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **-** | **52,513** | **5,456,750** | **250,000** | **-** | **543,102** | **860,476** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම / ප්‍රත්‍යාගණනය කළ අගය | - | 52,513 | 5,456,750 | 250,000 | - | 543,102 | 860,476 |
| පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය) | - | - | - | - | - | 3,500 | - |
| පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය) | - | - | - | - | 929,373 | (875) | 2,000 |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසුව ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | - | 52,513 | 5,456,750 | 250,000 | 929,373 | 545,727 | 862,476 |
| එකතු කිරීම් | 6,055,545 | 22,800 | 2,407,130 | - | 876,769 | 697,667 | - |
| බැහැර කිරීම් | | (2,400) | (274,700) | - | - | - | - |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | (816,319) | (24,660) | (1,217,424) | (9,724) | (562,065) | (290,072) | (271,109) |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය කිරීම් | - | - | - | - | - | - | - |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | 993 | - | - | - | - | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **5,239,226** | **49,246** | **6,371,756** | **240,276** | **1,244,077** | **953,322** | **591,367** |
| **2016 දෙසැම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 6,055,545 | 1,291,405 | 7,589,180 | 250,000 | 1,806,142 | 12,897,248 | 4,308,731 |
| සමුච්චිත ක්ෂය | (816,319) | (1,242,159) | (1,217,424) | (9,724) | (562,065) | (11,943,926) | (3,717,364) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **5,239,226** | **49,246** | **6,371,756** | **240,276** | **1,244,077** | **953,322** | **591,367** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

### 14 2016.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | උපයෝජ්‍ය සේවා | විවිධ වත්කම් | පරිගණක සහ සංනිවේදන උපකරණ | පරිගණක මෘදුකාංග | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 1,364,795 | 1,743,674 | 9,796,306 | (0) | 39,550,000 | **1,183,148,184** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | 10,524 | (3,210) | - | - | **2,129,307** |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 1,364,795 | 1,754,198 | 9,793,096 | (0) | 39,550,000 | **1,185,277,491** |
| එකතු කිරීම් | - | 1,542,646 | 4,987,409 | - | - | **98,634,320** |
| බැහැර කිරීම් | - | - | (7,088,832) | - | - | **(10,694,019)** |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | (327,848) | (355,843) | (3,845,927) | - | (7,910,000) | **(32,771,415)** |
| ශුද්ධ පොත් වටිනාකම වත්කම් ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කිරීම | - | (2,941,001) | (10,934,577) | 0 | (20,324,000) | **(63,241,457)** |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | 7,088,832 | - | - | **10,694,019** |
| ප්‍රත්‍යාගණනය | - | 1,702,205 | 7,487,409 | - | 42,000,000 | **109,437,864** |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **1,036,947** | **1,702,205** | **7,487,409** | **-** | **53,316,000** | **1,297,336,804** |
| **2015 දෙස්ම්බර් 31 දිනට** | | | | | | |
| පිරිවැය | 15,864,011 | (0) | (0) | 987,850 | 14,154,501 | **1,502,828,716** |
| ප්‍රකාාගණනය | - | 1,702,205 | 7,487,409 | - | 42,000,000 | **109,437,864** |
| සමුච්චිත ක්ෂය | (14,827,064) | - | (0) | (987,850) | (2,838,500) | **(314,929,777)** |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **1,036,947** | **1,702,205** | **7,487,409** | **-** | **53,316,001** | **1,297,336,804** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම / ප්‍රත්‍යාගණනය කළ අගය | 1,036,947 | 1,702,205 | 7,487,409 | - | 53,316,001 | **1,297,336,804** |
| පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය) | 91,367 | (1,134,974) | - | - | - | **6,836,568** |
| පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය) | (9,821) | - | (62,489) | - | (13,920,000) | **(18,005,196)** |
| පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසුව ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 1,118,493 | 567,231 | 7,424,920 | - | 39,396,001 | **1,286,168,174** |
| එකතු කිරීම් | 5,845,151 | 335,460 | 11,779,375 | 1,008,801 | - | **97,346,425** |
| බැහැර කිරීම් | - | - | - | - | - | **(299,668)** |
| ක්ෂය කිරීම් ගාස්තු (සටහන 9) | (356,875) | (216,307) | (3,912,971) | (78,066) | (2,440,000) | **(24,429,696)** |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය කිරීම් | - | - | - | - | - | **(8,732,424)** |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | - | - | - | **3,249** |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **6,606,768** | **686,384** | **15,291,324** | **930,735** | **36,956,001** | **1,350,056,060** |
| **2016 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| පිරිවැය | 21,800,528 | 902,691 | 19,179,534 | 1,996,651 | 56,154,501 | **1,716,992,028** |
| සමුච්චිත ක්ෂය | (15,193,760) | (216,307) | (3,888,210) | (1,065,916) | (19,198,500) | **(366,935,968)** |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **6,606,768** | **686,384** | **15,291,324** | **930,735** | **36,956,001** | **1,350,056,060** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

15 ස්ථාවර තැන්පතු

| | 2016 | 2015 |
|---|---|---|
| ලංකා බැංකුව - ඉඩම ශාඛාව | 50,025,000 | 25,000 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 3,978,793 | - |
| | **54,003,793** | **25,000** |

16 **තොග සහ සිදු කෙරෙමින් පවතින වැඩ**

| | 2016 | 2015 |
|---|---|---|
| ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍රධාන කාර්යාලය) | 868,765 | 1,054,434 |
| මුද්‍රණ අමුද්‍රව්‍ය | 171,729 | 140,668 |
| ලිපිද්‍රව්‍ය | 2,036,129 | 1,890,847 |
| වෙනත් අමුද්‍රව්‍ය | 2,281,915 | 2,233,136 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ තොග | 11,278,520 | 7,621,843 |
| උප ගබඩාව - වාත්තු වැඩපොළ | 3,870,395 | 2,329,633 |
| උප ගබඩාව - රබර් | 4,218,673 | 4,843,280 |
| උප ගබඩාව - සම් | 352,323 | 144,616 |
| උප ගබඩාව - පො.සේ.ම. මාතර | 158,009 | 107,580 |
| උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 1,258,138 | 947,855 |
| උප ගබඩාව - යෝ.තා.ප.සං.ම. පන්නල | 892,962 | 1,052,936 |
| උප ගබඩාව - දිවිනැගුම | 17,000 | 138,555 |
| උප ගබඩාව - කිතුල් සංවර්ධන වැඩසටහන | 272,527 | 5,837,942 |
| පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව | 129,582 | 178,367 |
| සිදු කෙරෙමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය (ප්‍රධාන කාර්යාලය) | 1,411,614 | 335,496 |
| සිදු කෙරෙමින් පවතින වැඩ - සෘජු ශ්‍රමය | 383,379 | 63,636 |
| සිදු කෙරෙමින් පවතින වැඩ - සාමාන්‍ය පොදුකාකර්ය | 285,120 | 30,418 |
| සිදු කෙරෙමින් පවතින වැඩ - කර්මාන්තශාලා පොදුකාර්ය | 198,652 | 14,387 |
| යකඩ නොවන ලෝහ අබලි | 3,863,155 | 8,458,614 |
| චලනය නොවන තොග හානිකරණය සඳහා ප්‍රතිපාදන | (1,584,236) | (1,584,236) |
| කල් ඉකුත්වූ තොග හානිකරණය සඳහා ප්‍රතිපාදන | (1,464,321) | (1,464,321) |
| | **30,900,030** | **34,375,687** |

17 **වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු**

| | 2016 | 2015 |
|---|---|---|
| විවිධ ණයගැතියෝ - ප්‍රධාන කාර්යාලය | 264,713 | 264,713 |
| විවිධ ණයගැතියෝ - සම් | 18,270 | 18,270 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු | 604,611 | 604,611 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු - වැඩපොළ) | 19,881,863 | 18,327,913 |
| විවිධ ණයගැතියෝ - රබර් අංශය | 1,612,460 | 1,919,979 |
| විවිධ ණයගැතියෝ - යෝ.තා.ප.සං.ම. පන්නල | 1,843,934 | 2,147,128 |
| විවිධ ණයගැතියෝ - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 73,272 | 73,272 |
| විවිධ ණයගැතියෝ - මුද්‍රණ | 374,061 | 374,061 |
| විවිධ ණයගැතියෝ - විදුලි | 701,826 | 701,826 |
| විවිධ ණයගැතියෝ - වාත්තු වැඩපොළ | 4,739,535 | 4,399,365 |
| විවිධ ණයගැතියෝ - සිවිල් | 2,155,803 | 2,155,803 |
| විවිධ ණයගැතියෝ - ලක්නිපැයුම් | 42,120 | 42,120 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. - මාතර | 346,492 | 346,492 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. අ'පුර | 15,025 | 15,025 |
| ණයගැතියෝ - ආපසු එවූ චෙක්පත් | 209,398 | 209,398 |
| බදුකරු ණයගැතියෝ | 33,227,904 | 34,342,809 |
| විවිධ ණයගැතියෝ | 406,707 | 406,707 |
| | 66,517,993 | 66,349,491 |
| අඩු කළා - බොල් සහ අඩමාන ණය හානිකරණය සඳහා වෙන් කිරීම් | (40,482,147) | (32,780,778) |
| | **26,035,847** | **33,568,714** |

### 18 වෙනත් ජංගම වත්කම්

| | 2016 | 2015 |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 364,800 | 376,600 |
| යතුරු පැදි ණය | 333,748 | 803,735 |
| පාපැදි අත්තිකාරම් | 129,254 | 225,254 |
| ආපදා ණය | 39,320,914 | 38,759,161 |
| අඩුකළා - ප්‍රමාදවූ කාර්ය මණ්ඩල පිරිවැය | (37,226,305) | (37,226,305) |
| පූර්වයෙන් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය ( IFRs ගැළපීම්) | 37,226,305 | 37,226,305 |
| විශේෂ අත්තිකාරම් පොත | 11,500 | 12,700 |
| අනෙකුත් දෙපාර්තමේන්තුවලින් ලැබිය යුතු | 421,933 | 454,978 |
| උප කොන්ත්‍රාත් හුවමාරු | 863,057 | 863,057 |
| හැකියා සංවර්ධන | - | 1,456,826 |
| රඳවුම් බද්ද | 2,016,777 | 1,679,828 |
| භාණ්ඩ හා සේවා බද්ද ( G S T ) | - | 1,424,654 |
| ලැබිය යුතු වැට් | 28,944,779 | 25,476,691 |
| යකඩ නොවන - වැට් | - | 10,741,854 |
| කිතුල් - අලෙවිකරණ | 281,675 | 281,675 |
| යකඩ නොවන පාලන ගිණුම | 742,661 | 742,661 |
| ලක්කම් ණයහිමියෝ | - | 1,407,159 |
| ආර්ථික සේවා ගාස්තු | 170,872 | 170,872 |
| රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 3,731,167 | - |
| | **77,333,136** | **84,877,704** |

### 19 තැන්පතු සහ පූර්ව ගෙවීම්

| | 2016 | 2015 |
|---|---|---|
| ආරක්ෂක තැන්පතු | 241,132 | 229,428 |
| පූර්ව ගෙවීම් | 13,293,753 | 19,211,842 |
| පූර්ව ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (7,226,319) | (7,226,319) |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් - (ප්‍රධාන කාර්යාලය) | 192,206 | 192,206 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 871,275 | 1,203,306 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (560,073) | (560,073) |
| කාර්ය මණ්ඩලයට ගෙවූ ඉන්ධන අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 292,312 | 261,882 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (235,612) | (235,612) |
| ලැබිය යුතු වෙනත් තැන්පතු | 1,576,503 | 3,004,926 |
| ගමන්වියදම් අත්තිකාරම් (විදේශීය) | 190,620 | 190,620 |
| කල් තබා ගෙවූ බදු කුලී | 225,000 | - |
| | **8,860,797** | **16,272,206** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩ

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

| 20 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 2016 | 2015 |
|---|---|---|
| සේවා මධ්‍යස්ථානය සහ බෙදාහැරීම සඳහා තොගයේ ඇති භාණ්ඩ | - | 15,540,765 |
| Casper ව්‍යාපෘතිය - අමාත්‍යාංශය | - | 16,872,541 |
| දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | - | 4,096,018 |
| **විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්** | **-** | **36,509,324** |

| 21 මුදල් සහ බැංකු ශේෂ | | | 2016 | 2015 |
|---|---|---|---|---|
| **ගිණුම් කේතය** | | **ගිණුම් අංක** | | |
| | බැංකු ගිණුම - ලක්නිපැයුම් - පොළොන්නරුව | | 11,605 | 11,605 |
| 185065 | දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | **71889197** | - | (24,863) |
| 185200 | ජංගම ගිණුම - IRDP - මාතර | **00022667-9** | 2,076 | 2,076 |
| 185080 | ජංගම ගිණුම - උප කොන්ත්‍රාත් - අලෙවිකරණ | **683133** | - | 2,015,143 |
| 185040 | ජංගම ගිණුම - ආපදා ණය | **683218** | - | 596,657 |
| 185010 | ජංගම ගිණුම - ඉඩම - මොරටුව | **682974** | (40,960,624) | 2,112,336 |
| 185110 | ජංගම ගිණුම - පෑලියගොඩ - RPD&SC | **4064199** | 967,295 | 4,349,059 |
| 185020 | ජංගම ගිණුම - ප්‍රාග්ධන ප්‍රදාන බැංකු ගිණුම | **683231** | (1,415,987) | (1,122,076) |
| 185030 | බැංකු ශේෂය - ඉංජිනේරු අංශය | **683144** | 516,176 | 5,638,052 |
| 185050 | බැංකු ශේෂය - REAP | **1118722801** | - | 15,697 |
| 185180 | බැංකු ශේෂය - ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය | **4204245** | 5,248,932 | 218,749 |
| 185070 | බැංකු ශේෂය - යකඩ නොවන | **682519** | 321,639 | 20,069,523 |
| 185060 | බැංකු ශේෂය - ප්‍රාදේශීය අංශය (කිතුල්) | **683237** | 32,971,946 | 1,490,134 |
| 185412 | ලංකා බැංකුව - "ඉඩම" අබලි ව්‍යාපෘතිය ඉතුරුම් ගිණු | **7271240** | 187,240 | 179,891 |
| 185090 | ජංගම ගිණුම - මහජන බැංකුව | **100153657035** | 48,610,950 | 10,000 |
| 185415 | ජංගම ගිණුම - ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | **7153282** | 1,127,322 | 487,938 |
| 185015 | ජංගම ගිණුම - නිදහස්කරන ලද හර බද්ද | **70034730** | 2,368,416 | 609,643 |
| 185125 | දිස්ත්‍රික් කාර්යාලය - බැංකු ගිණුම (ප්‍රාදේශීය) | **74791255** | 307,717 | 1,195,770 |
| 185413 | ඉතුරුම් ගිණුම - CESS අරමුදල | **9123868** | 1,525,279 | 11,528,630 |
| 185025 | ඉතුරුම් ගිණුම - ප්‍රාග්ධන අරමුදල් | **71648764** | - | 29,178,407 |
| 185135 | ඉතුරුම් ගිණුම - ජනපද තැන්පතු | **71582414** | - | 4,771,419 |
| | කෙටි කාලීන තැන්පතු | | 100,013,581 | 11,104,111 |
| | ලැබිය යුතු කෙටි කාලීන තැන්පතු පොළිය | | 646,305 | - |
| | අග්‍රිම ගිණුම | | 4,669 | 15,524 |
| | විශේෂ අග්‍රිම - අයකැමි | | 23,379 | 23,379 |
| | මාර්ගස්ථ මුදල් | | 28,148 | 25,783 |
| | මාර්ගස්ථ මුදල් - ලෝහ අබලි ව්‍යාපෘතිය | | 12,540 | 12,540 |
| | | | **152,518,603** | **94,515,126** |
| | හර ශේෂ | | 194,895,214 | 95,662,065 |
| | බැර ශේෂ | | (42,376,612) | (1,146,939) |
| | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **152,518,603** | **94,515,126** |

| 22 ශුද්ධ රාජ්‍ය දායකය | 2016 | 2015 |
|---|---|---|
| 2016.01.01 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 277,910,082 | 278,694,719 |
| වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 45,000,000 | 45,000,000 |
| මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | (40,122,661) | (45,784,637) |
| | **282,787,422** | **277,910,082** |

| 23 පවරාදෙන ලද වත්කම්වල වටිනාකම | 2016 | 2015 |
|---|---|---|
| 1969 ට පෙර කා.සං.ම. | 4,403,441 | 4,403,441 |
| කාර්මික ජනපද සංස්ථාව | 9,043,620 | 9,043,620 |
| | **13,447,061** | **13,447,061** |

| 24 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | 2016 | 2015 |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය | 999,334,417 | 953,138,009 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | (37,516,635) | 46,196,408 |
| | **961,817,782** | **999,334,417** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 25 අනෙකුත් රජයේ ප්‍රදාන

| | 2016 | 2015 |
|---|---|---|
| මැටි සැකසුම් යන්ත්‍ර ප්‍රදාන | - | 29,250 |
| සෙස් අරමුදල | 10,500,000 | 10,500,000 |
| Sirap අරමුදල - ගොඩනැගිලි | 25,388,919 | 26,236,185 |
| ප්‍රදාන - ර.නි.සං.සේ.ම. - පැලියගොඩ ආක්ෂේපණ වාත්තු අච්චු යන්ත්‍රය | 9,318,027 | - |
| අමාත්‍යාංශ අරමුදල් අච්චුවේලි | 22,834,039 | 16,932,430 |
| අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද | 260,126,686 | 101,801,068 |
| යකඩ නොවන | 10,000,000 | 10,000,000 |
| අමාත්‍යාංශ අරමුදල් - තා.සේ.අං. රසායනාගාරය | 4,489,843 | - |
| අමාත්‍යාංශ අරමුදල් - Robot Arm | 15,000,000 | - |
| | **357,657,514** | **165,498,934** |

### 26 රජයේ ප්‍රදාන

| | 2016 | 2015 |
|---|---|---|
| ශේෂය | 1,930,291,117 | 1,930,291,117 |
| සමුච්චිත අලාභ | (2,175,923,391) | (2,136,683,921) |
| ගැළපීම් | 23,258,430 | (17,407,674) |
| ඉදිරියට ගෙනා හිගය | (1,666,359) | (21,831,796) |
| සමුච්චිත අලාභ | **(2,154,331,321)** | **(2,175,923,391)** |
| | **(224,040,204)** | **(245,632,274)** |

### 27 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගන්නා ලද වටිනාකම් පහත සඳහන් පරිදි තීරණය කරනු ලැබේ.

| | 2016 | 2015 |
|---|---|---|
| අරමුදල් සපයා නොමැති බැදීම්වල වර්තමාන වටිනාකම | 137,072,925 | 155,623,529 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම** | **137,072,925** | **155,623,529** |

වර්ෂය තුළ නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල චලනය පහත සඳහන් පරිදි වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| ජනවාරි 01 දිනට | 155,623,529 | 100,395,508 |
| වර්තමාන සේවා පිරිවැය | 8,045,317 | 9,896,983 |
| පොළී පිරිවැය | 10,798,742 | 6,639,630 |
| පශ්චාත් සේවා ප්‍රතිලාභ බැදීම් මත ආයුගණක පාඩුව / (ලාභය) | (28,873,913) | 49,090,907 |
| | **145,593,675** | **166,023,028** |
| ගෙවූ ප්‍රතිලාභ | (8,520,751) | (10,399,498) |
| **දෙසැම්බර් 31 දිනට** | **137,072,925** | **155,623,529** |

භාවිතා කරන ලද මූලික ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි විය.

| | 2016 | 2015 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 7.00% | 5.00% |
| අනාගත වැටුප් වැඩිවීම් | 5.00% | 7.00% |
| කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත | 4.06% | 4.91% |
| විශ්‍රාම ගැනීමේ වයස | 60 | 60 |

### 28 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන

| | 2016 | 2015 |
|---|---|---|
| සුනාමි | - | 1,540,899 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති | 20,726,052 | 52,800,966 |
| කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | - | 10,536,151 |
| අමාත්‍යාංශ අරමුදල් දිවිනැගුම | - | 6,699,960 |
| තල මිලදී ගැනීම - යාපනය | 137,863 | 137,863 |
| | **20,863,915** | **71,715,838** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 29 මණ්ඩලවලට සහ සංස්ථාවට ගෙවිය යුතු හිග

| | | 2016 | 2015 |
|---|---|---|---|
| ගෙවිය යුතු සේ.අ.අ. හිග මුදල් | | 12,939,579 | 32,348,955 |
| | | **12,939,579** | **32,348,955** |

### 30 රජයට ගෙවිය යුතු හිග

| | | 2016 | 2015 |
|---|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් | | 28,879 | 28,879 |
| දේශීය ආදායම් කොමසාරිස් - මුද්දර ගාස්තු | | 54,935 | 51,235 |
| | | **83,814** | **80,114** |

### 31 මණ්ඩලවලට සහ සංස්ථාවට ගෙවිය යුතු හිග

| | | 2016 | 2015 |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව - සේ.අ.අ. | | 3,988,778 | 3,138,778 |
| සේ.භා.අ. ගෙවිය යුතු හිග | 19,409,376 | - | - |
| කල් තබා ගෙවූ වාරික 2 | (3,234,896) | 16,174,480 | 16,174,480 |
| ගෙවිය යුතු සේ.නි.භා.අ. හිග | | 6,389,567 | 6,389,567 |
| සේවක භාරකාර අරමුදල | | 544,877 | 428,110 |
| | | **27,097,701** | **26,130,935** |

### 32 වෙළඳ සහ අනෙකුත් ණයහිමියෝ, වෙන්කිරීම් සහ උපචිත වියදම්

| | 2016 | 2015 |
|---|---|---|
| ලුණුවිල ජනපදය තැන්පතු | 1,458,835 | 1,458,835 |
| සේවක පරිත්‍යාග | 8,695 | 8,695 |
| උප කොන්ත්‍රාත් භුවමාරු | 25,639 | 25,639 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද 2% | 3,338,717 | 3,165,169 |
| ගෙවිය යුතු කාර්යමණ්ඩල අවකරණ | 11,207 | (1,203) |
| ගෙවියයුතු උපයන විට බද්දු | 106,779 | 79,307 |
| මැතිවරණ කොමසාරිස් | 54,446 | 54,446 |
| විවිධ ණයහිමියෝ | 3,072,949 | 3,072,949 |
| වෙනත් ණය හිමියෝ | 40,883 | - |
| විවිධ ණයහිමියෝ - ප්‍රධාන කාර්යාලය | 1,925,374 | 6,762,741 |
| විවිධ ණයහිමියෝ - යකඩ නොවන | 124,787 | 641,048 |
| බේරුම් කිරීමට නියමිතව තිබෙන තැන්පතු | 1,093,683 | 1,113,704 |
| ගෙවියු යුතු වැටුප් | (12,590) | 1,991 |
| ලක්නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථාන - ණය හිමියෝ | 89,753 | 92,398 |
| කාර්යය මත අත්තිකාරම් | 3,614,812 | 1,863,108 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 32,320 | 937,239 |
| ආරක්ෂක තැන්පතු | 241,132 | 229,428 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 49,272,098 | 42,123,248 |
| බෞද්ධ සංගමය පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 4,230 | 4,230 |
| සකසුරුවම් සමිතිය පාලන ගිණුම | 36,510 | 36,510 |
| අනෙකුත් දෙපාර්තමේන්තු පාලන ගිණුම | 69,221 | 61,061 |
| ගෙවිය යුතු ශත පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 2,376 | 2,379 |
| වෘත්තීය සමිති පාලන ගිණුම | 4,979 | 4,529 |
| රක්ෂණ පාලන ගිණුම | 1,178,882 | 994,798 |
| ගණුදෙනුකරුවන්ට වැඩිපුර ගෙවීම් | 2,734,019 | 2,077,120 |
| වෛද්‍ය යෝජනාක්‍රමය | 2,816,609 | 608,491 |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 4,747,407 | 4,406,389 |
| උප කොන්ත්‍රාත් කෘෂි උපකරණ | 2,202,546 | 2,421,515 |
| උපචිත වියදම් | 39,261,285 | 38,925,438 |
| ලක්කම් ණය හිමියෝ | 3,433,936 | 1,930,587 |
| ගෙවිය යුතු ආදායම් - ප්‍රදර්ශන | 2,026,951 | - |
| | **123,018,469** | **113,101,787** |

# මණ්ඩලයේ අදහස්

# දැක්වීම පිණිස

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. } අයිඑම්යු/ඒ/අයිඩීබී/1/16/39 ඔබේ අංකය
உமது இல.
Your No. }
දිනය
திகதி
Date } 2018 අප්‍රේල් 11 දින

සභාපති

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 නොවැම්බර් 02 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) “නවබිම ගබඩා පරිශ්‍රයේ” (Yard) ගබඩා කොට තිබූ කිලෝ ග්‍රෑම 1,500 ක් වූ අබලි තොග වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සෙමෙන් චලනය වන හා යල් පැනගිය තොග වෙනුවෙන් වූ රු.3,048,557 ක වෙන්කිරීම 2013 වර්ෂයේ සිට කිසිදු සමාලෝචනයකින් තොරව ඉදිරියට ගෙන එමින් තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11**

ඉදිකිරීම් ව්‍යාපෘති පහකට අත්තිකාරම් වශයෙන් ලබාදුන් රු 15,617,194 ක් වූ මුළු මුදලම කෙරීගෙනයන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

2016 වර්ෂයේදී ලද රු 45,000,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු 2,486,663 ක් පමණක් ආදායම් ලෙස ගිණුම් ගත කල යුතු අතරම රු 37,635,995 ක් වූ ප්‍රාග්ධන වියදම් සඳහා ක්‍රමක්ෂය ගැලපීම් සිදුකල යුතු වුවත් රු 40,122,660 ක් මුළු ප්‍රාග්ධන වියදම ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ වල සිට පැවත එන රු 277,910,082 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයෙන් උත්පාදනය වූ වත්කම්වල වාර්ෂික ක්ෂය පදනම් කරගෙන ක්‍රමක්ෂය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමේදී එය මූල්‍ය තත්ත්වය විනිවිදව හා සාධාරණව නිරූපනය කිරීමට ඉවහල්වන්නක් විය යුතුයි. එසේ වුවද, ණයගැතියන් සඳහා අඩමාන ණය වෙන්කිරීමේදී ණයගැතියන්ගෙන් වර්ෂ 05 ට අඩු ණයගැතියන් සඳහා සෑම වර්ෂයකම සියයට 10 ක වෙන්කිරීමක් හා වර්ෂ 05 ට වැඩි ණයගැතියන් සඳහා සියයට 100 ක වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ හේතුවෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේදී රු. 3,573,133 ක අමතර අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට ප්‍රදාන ලෙස ලැබුණු වටිනාකම සඳහන් නොවූ තොග අයිතමයන් වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම 07 ක් රු.67,437,864 ක් වූ ප්‍රත්‍යාගණිත අගයට ගිණුම් ගතකර තිබියදී වාර්ෂික ක්ෂය, පිරිවැය මත ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.1,333,284 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල හා මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන එකතුව අක්කර 37 ක් පමණ වූ මුළු ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබූ අතර එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම ද සිදුකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු.2,032,627 ක අයහාර වියදම් එම වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැරීම වෙනුවට වෙනත් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත කරුවන්ගෙන් අයවිය යුතු මුළු හිඟ ශේෂ කාර්මික ජනපද අංශයේ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී රු.16,268,718 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් ලෙජර් ගිණුම්වල ශේෂයන් පිළිවෙලින් රු. 676,552,750 ක් හා රු.141,320,244 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂ පිළිවෙලින් රු. 767,367,687 ක් හා රු. 50,156,899 ක් වීමෙන් පිළිවෙලින් රු. 90,814,937 ක හා රු. 91,163,345 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂවලදී වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මණ්ඩලයේ සේවයේ නියුතු දේපළ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් උපලේඛනය හා එක් එක් වත්කමේ ප්‍රත්‍යාගණන තක්සේරු වටිනාකම පිළිබඳ තොරතුරු 2017 ඔක්තෝබර් 30 දින වන තෙක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 ඉක්මවූ විවිධ ණයහිමි ශේෂයේ ඇතුළත් රු.3,072,949 ක ශේෂය පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂවල එකතුව රු. 66,517,993 ක් වූ අතර, ඉන් වර්ෂ 05 ක් ඉක්ම වූ රු.39,436,868 ක ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වර්ෂ 05 ඉක්ම වූ ණයහිමි ශේෂය රු. 28,955,811 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට අය නොවී පවතින සේවක ණය ශේෂය රු.743,533 ක් විය.

(ඇ) කලින් ගෙවීම් හා සේවකයන්ට දුන් අත්තිකාරම් රු.14,457,340 ක ශේෂයෙන් රු. 8,022,004 ක ශේෂය 2014 වර්ෂයේ සිට වෙන්කිරීමක් ලෙස අඩුකර දක්වා තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අබලි යකඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. 4,317,934 ක අත්තිකාරම් මුදල් 2017 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) කාර්මික ජනපද 12 ක කර්මාන්ත ස්ථාපිත කර ඇති කර්මාන්තකරුවන් 228 දෙනෙකුගෙන් බදුකුලී වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.16,058,303 ක් අයවිය යුතුව පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 571(2) | වසර 02 ඉක්ම වූ රු2,767,275 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 757 | 2016 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව අනාවරණය වූ රු.395,754 ක අතිරික්තතා හා රු.332,028 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 770 | 2015 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චියට ගත නොහැකි ලෙස නම් කල භාණ්ඩ අයිතම 38ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.30,029,583 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,259,111 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.57,288,694 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු.10,750,000 කින් හා විකුණුම් හා සේවා ආදායම රු.44,720,265 කින් පහළ යාම හා පරිපාලන වියදම් රු.29,945,023 කින් ඉහළ යාම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.84,728,727 ක් වූ ඌනතාවය 2014 වර්ෂයේදී අතිරික්තයක් බවට පත්වී 2015 වර්ෂයේදී රු.27,259,111 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එය රු.30,029,583 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසුව 2013 වර්ෂයේ දී රු.68,532,050 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු. 142,949,647ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ කර්මාන්තකරුවන් දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, හා සංවර්ධනය කිරීම වන අතර, කාර්මික ජනපද 19 ක් , දිස්ත්‍රික් කාර්යාල 25 ක්ද, ඇතුළත්ව ඉංජිනේරු තාක්ෂණික සේවා, අලෙවි, රබර් සංවර්ධන සහ සම්භාණ්ඩ සංවර්ධන යනාදී අංශයන්ගෙන් මණ්ඩලය සමන්විත වේ. මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) අලෙවි අංශය

අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය, උප කොන්ත්‍රාත් ලබාගැනීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම, ලක්කම් හා ලක් නිපැයුම් මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම, ව්‍යවසායකයින් සඳහා වාණිජ හා තාක්ෂණික වැඩසටහන් පැවැත්වීම යනාදිය අලෙවි අංශයේ කාර්යයන් විය.

(i) අබලි ද්‍රව්‍ය විකුණුම් ආදායම අලෙවි අංශයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වුවද 2015 වර්ෂයේ රු. 103,970,263ක් ව පැවැති එම ආදායම 2016 වර්ෂයේදී රු.43,044,099 ක් ලෙස රු.60,926,164 කින් හෙවත් සියයට 59 කින් අඩුවී තිබුණි.

(ii) ලක් නිපැයුම් අලෙවි මධ්‍යස්ථානයේ අභිවෘද්ධිය සඳහා කිසිදු වැඩ පිළිවෙලක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. මෙ හේතුවෙන් ලක් නිපැයුම් මධ්‍යස්ථානයෙන් 2016 වර්ෂය සඳහා ලද කොමිස් ආදායම රු.1,206 ක් පමණක් වූ අතර, ලක් නිපැයුම් අලෙවි සැල 2017 අප්‍රේල් මාසයේ සිට වසා දමා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සංවර්ධන අංශය

මෙම අංශය මඟින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා කර්මාන්ත ශක්තිමත් කිරීම, ප්‍රවර්ධනය හා නගා සිටුවීම හා ගෝලීය වෙළඳපොළ කරා යොමු කිරීම අරමුණු කර ගෙන ක්‍රියාකාරකම් 47ක් සැලැසුම් කර තිබුණි. ඉන් ක්‍රියාකාරකම් 6 ක කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණ අතර තවත් ක්‍රියාකාරකම් 25 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 25 ක් දක්වා අඩු පරාසයක පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකයින් සඳහා බෙදා දීමේ අරමුණින් 2007 හා 2008 වර්ෂවලදී මිලදී ගත් වටිනාකම රු. 7,417,960 ක් වූ තොගයක් හා සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.774,416 ක තොගයක් විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 04 වන දින වනවිටද බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්මික ජනපද

(i) 1996 වර්ෂයේ හා 2000 වර්ෂයේ සිට ජනපද 05 ක අනවසර පදිංචිකරුවන් සිටීම හේතුවෙන් ඉඩම් කට්ටි 59 ක් කර්මාන්ත ගැන්වීමට කටයුතු කර නොතිබුණ අතර, ජනපද 07 කට අදාලව බිම් කොටස් 71 ක් සංවර්ධනය කර කර්මාන්තකරුවන්ට ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ii) බද්දේගම කාර්මික ජනපදය පිහිටුවා ඇති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් වන අතර එය පවරා ගැනීම සඳහා 2007 වර්ෂයේදී

රු. 500,000 ක අත්තිකාරමක් හා පිඹුරුපත් සැකසීම හා මැනුම් කටයුතු සඳහා රු.15,576 ක් ද 2007 ඔක්තෝබර් 05 දින ගෙවා තිබුණද එම ඉඩම මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. එමෙන්ම පවරා නොගත් අක්කර 1 රූඩ් 2 පර්චස් 0.5 ක්වූ බද්දේගම හා අක්කර 10 පර්චස් 29.2 ක්වූ බෙලිඅත්ත කාර්මික ජනපද අදාළ අරමුණ සඳහා යොදා නොගැනීම හේතුවෙන් වර්තමානය වන විට එම ඉඩම් ජනාවාස බවට පත්වී තිබුණි.

(iii) මණ්ඩලයට අයත් ගාල්ල කරන්දෙණිය කාර්මික ජනපදයේ අක්කර 2 යි රූඩ් 1 යි පර්.11.6 ක් වූ ඉඩමේ කර්මාන්තකරුවන් විසින් කර්මාන්ත පවත්වා ගෙනයාම නවත්වා පදිංචිය සඳහා යොදාගෙන තිබුණි. එම ඉඩම් නිසි අධිකාරි බලයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2017 අගෝස්තු 29 දින කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් වෙත පවරා දීමට කටයුතු කර තිබුණි.

### 4.3 අරමුදල් උපයෝජනය

පානළුව කාර්මික ජනපදයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2016 සැප්තැම්බර් මාසයේදී අමාත්‍යාංශයෙන් ලැබුණු රු. මිලියන 25 ක මුදල 2017 සැප්තැම්බර් වන තෙක් අදාළ කාර්යයට යොදා නොගෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

### 4.4 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී සේවක පාරිශ්‍රමිකය තුල ඇතුලත් ජීවන වියදම් දීමනාව සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාලව අධිභාර ලෙස රු.6,469,791 ක් සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) වාර්ෂික වාහන බලපත්‍ර ගාස්තු, පාරිතෝෂික මුදල් හා වරිපනම් ගෙවීම නියමිත දිනට සිදු නොකිරීම හේතුවෙන් අධිභාර ලෙස රු 43,257 ක් ගෙවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රිය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් මහියංගන මියුනුගම පිහිටි ගොඩනැගිල්ල කිසිදු කටයුත්තක් සඳහා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින අතර මෙහි ආරක්ෂක සේවාව ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.714,248 ක් වැයකර තිබුණි.

(ආ) සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ වන නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද නාගහමඩ නීලවබැද්ද ගොඩනැගිල්ලෙහි පළතුරු ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීමට අවශ්‍ය යන්ත්‍ර උපකරණ මණ්ඩලයෙන් රු.1,283,500 ක් වැයකර මිලදීගෙන 2012 මාර්තු 06 දින ජනතා අයිතියට පත්කර තිබුණද, එදින සිට වාර්තාවේ සඳහන් දිනය දක්වාම එම උපකරණ කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

වටිනාකම රු.9,318,026 ක් වූ රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය මිළදී ගැනීමට පළමු ලංසු කැඳවීමේදී ඉදිරිපත් වූ මිල ගණන් ඉහළ අගයක් වීම හේතුවෙන් අවලංගු කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 හා 7.8.4 මාර්ගෝපදේශ අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් නොකිරීම විශාල බැහැර වීමක් ලෙස සැලකිය යුතු වුවද, දෙවන වර ලංසු කැඳවීමේදී ලංසු සුරක්ෂණය වෙනුවෙන් මණ්ඩලය නමට ලියන ලද රු. 182,520 ක චෙක්පතක ඡායා පිටපතක් ඉදිරිපත් කළ සැපයුම්කරු සාර්ථක ලංසුකරු ලෙස පිළිගෙන කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 725 න් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 232 ක් වූ අතර එයින් තනතුරු 106 ක් විධායක තනතුරු වන අතර තනතුරු 126 ක් විධායක නොවන තනතුරු විය.

(ආ) බඳවා ගැනීම් පරිපාටියට පටහැනිව 2015 දෙසැම්බර් 01 දින සිට ව්‍යාපාර ප්‍රවර්ධනයට නිලධාරීන් අටදෙනෙකු හා කළමනාකරණ සහකාර නිලධාරීන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබුණි. ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය අදාල ගිවිසුම අනුව 2016

මැයි 31 දිනෙන් අවසන් වී තිබුණද සේවය අවසන් කිරීමකින් තොරව නැවත දැනුම් දෙන තුරු සේවා කාලය දීර්ඝ කර තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සම්බන්ධීකාරක තනතුරක් සඳහා 2016 ජනවාරි 20 දින සිට නිළධාරියකු බඳවා ගෙන මාසිකව ඉන්ධන දීමනා, රියදුරු වැටුප්, දුරකථන දීමනා ඇතුළුව රු.83,069 ක් සහ උපදේශකවරුන් තිදෙනෙකු බඳවා ගෙන මාසිකව රු. 168,800 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සඳහා නිලධාරීන් පත් නොකිරීම හේතුවෙන් නිලධාරීන් 13 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත පත්කර වැඩ බැලීමේ වැටුප් වශයෙන් 2016 වර්ෂයේදී රු.830,546 ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගේ වැඩබැලීමේ කාල සීමාව වසර 02 සිට වසර 10 ක් දක්වා කාල පරාසයක විහිදී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 25 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

අමාත්‍යාංශය හා මහාභාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදන සඳහා පමණක් සමාලෝචිත වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද මණ්ඩලයේ ආදායම් වලින් කරනු ලබන ප්‍රසම්පාදනයන් එම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 සහ 5.2.4 වගන්ති ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013 , 2014 හා 2015 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දිගුකාලීන ප්‍රමාදයන් පැවතීම.<br>(ii) විවිධ අංශ වල මූල්‍ය ගනුදෙනු වලට අදාල ලියකියවිලි ගිණුම් අංශය වෙත කාර්යක්ෂමව රැස් නොකිරීම.<br>(iii) අත්තිකාරම් ලබා දීමේදී කාර්යයන් සඳහා අවශ්‍ය මුදලට වඩා වැඩිපුර අත්තිකාරම් නිකුත් කිරීම.<br>(iv) සරප් අංශයේ මුදල් භාරගැනීම කාර්යාල වේලාවෙන් පසුව සිදුකිරීම හා සේප්පුවේ තැන්පත් කිරීම නියමිත පරිදි සිදු නොකිරීම. |
| (ආ) ඉඩම් බදුදීම | කාර්මික ජනපද 09 කට අදාලව ගොඩනැගිලි 31 ක් හා ඉඩම් කැබලි 57ක් සඳහා නීත්‍යානුකූල බදු ගිවිසුම් අත්සන් කර නොතිබීම. |
| (ඇ) තොග පාලනය | (i) ශේෂයක් නොමැති තොග අයිතමයන් සඳහා තොග ලේඛන නඩත්තු කිරීම.<br>(ii) හානි වූ තොග ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම.<br>(iii) ඇතැම් තොග අයිතම සම්බන්ධයෙන් ලෙජර් කාඩ් හා බින් කාඩ්පත් ශේෂ අතර අසමානතාවයන් පැවතීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති